ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2023 ජුනි 21 වන බදාදා
3 කාණ්ඩය 29 කලාපය
මිල රු. 80 යි

විශේෂ අතිරේකයක්
**නොමිලේ**






## පෙම්වතිය හේමාල්ට හාර්ට් එකක් දාලා පෙම්වතාගේ හිත හොඳටම රිදිලා

## උඩු තොලට ඉහළින් උපන් ලප පිහිටන්නේ අනාචාරයේ හැසිරෙන ගැහැණුන්ගෙද?

## ලසිත් මාලිංග සෙවූ පුංචි ක්‍රීඩකයාගේ මව ධරණීට කියූ කතාව


## ලංකාව වටේම ඉන්න බලු යාළුවෝ කොන්ඩේ කපන්න යන අමුතු සැලෝන් එක

## නිධානයක් ගොඩගන්න හාල්මැස්සෝ 25ක් බිල්ලට දීලා

උමේෂා හංෂනී
Dog health and grooming spa

ඡායාරූපය
ක්‍රිෂාන් කාරියවසම්

# දොස්තර නොසන්සුන් ඒකදන්ත සන්සුන්



තොරතුරු
පශු වෛද්‍ය
**තරිඳු විජේකෝන්**
(ශ්‍රී දළදා මාලිගාව, Millennium Elephant Foundation සහ Vetcare සත්ව රෝහල)



ශක්‍ර දෙවියන්ගේ ඇතා වන ඓරාවණ වුව නැවතීමට හැකි පරිදි සෙබළුන් සන්නද්ධව සිටින අයුරු තොටගමුවේ ශ්‍රී රාහුල හිමියෝ සැළලිහිණි සංදේශයේදී විස්තර කර ඇත්තේ මෙලෙසිනි.

**'ඓරාවණ වුවත් නවතන රිසින් එන**
**අයි රා දහස් දිලි දුනු කොත් සිපත් ගෙන**
**කයි කාවලෙහි දැකැ සෙබළුන් රැක සිටින**
**වයි යා කරන් මල් තුරු ගන වන හිසින'**

ඓරාවණ පමණක් නොව, හීලෑ නොකළ කොයි ඇතාටත් මෙල්ල කිරීම පහසු නැත. ඒ නිසා අලි සමඟ ගනුදෙනුවට යා යුත්තේ සූදනම් ශරීරයෙනි. කවියේ කියන පරිදි කඩු, දුනු, කිණිසි නැතත් ඇත්ගොව්වෙකුට නම් හෙණ්ඩුවද පශු වෛද්‍යවරකුට නම් බොහෝවිට නිර්වින්දන තුවක්කුවද ඊට ප්‍රමාණවත්ය. මේ ද එවැනි කතාවකි.

එදා පොසොන් පොහෝ දිනයක්ය. මහනුවර නගරයේ දිවා පෙරහරක් පැවැත්වීමට කටයුතු යොදා තිබිණි. පෙරහරේ අලි ඇතුන් මෙහෙයවීමේ තනි වගකීම පශු වෛද්‍ය තරිඳු විජේකෝන්ට පැවරුණේ පළමු වරටයි. කුලී පදනම මත ලබාගත් වාහනයක නැගී හෙතෙම මහනුවර බලා පිටත්වූයේය. පෙරහරේ අලි ඇත්තු හත්දෙනෙක් වූහ. ඒ අතර විශේෂිතයෙක්ද සිටියේය. ඒ වසර කිහිපයකට පෙර මියගිය ඒක දන්ත හස්තියාය. ඔහු මහනුවර ශ්‍රී දළදා මාලිගාවට අයත් වූවෙකි. ඒකදන්ත හස්තියා තේජාන්විතය. ජවසම්පන්නය. අලි කිහිපදෙනෙකු වුව ඔසවාගෙන යාමට තරම් ශක්තිවන්තයෙකි. ඔහු වෙත කවරෙකුගේ වුව ඇස් ඇදී යන්නේ නිරායාසයෙනි. පශු වෛද්‍ය තරිඳුටද එය එසේම විය. එනිසාම හෙතෙම තේජවන්තයාගේ හස්තිපාලකවරයා සමඟ සංවාදයකට මුල පිරීය. විස්තර කියන අතරතුර ඇත්ගොව්වා පැවසූ දෙයින් සිය පළමු පෙරහර කාර්යයට පැමිණි වෛද්‍යවරයාට උතුර දකුණ මාරු විය.

"අපේ එක්කෙනා තෙමෙන්න ළඟයි වගේ."

එහි අරුත ඇතා මද කිපීමට ආසන්න බවයි. තමා වගකීම භාරගත් පළමු පෙරහරේදීම ඇතෙකු මද කිපුණොත් මහා විනාශයකි. ආසාවෙන් පැමිණි ගමන කොහෙන් කෙලවර වේදැයි වෛද්‍ය තරිඳුට සැකය. ඔහු මීට පෙර තනිව අලියෙකු නිර්වින්දන කර ද නැත. එනිසාම හෙතෙම සිය ගුරුවරයාගේ උපදෙස් පැතීය. ඒ වනවිට වෛද්‍ය තරිඳු එක එක අලි ඇතුන් නමින් හඳුනන්නේද නැත. දුරකතන මාර්ගයෙන් ඔහු මහාචාර්ය දංගොල්ලට අලියාගේ හැඩරුවද විස්තර කළේය.

"තනි දළක් තියෙන දැවැන්ත හස්තියෙක් මද කිපෙන්න ළංවෙලා. දැන් මොකද කරන්නෙ?"

විස්තර ඇසූ මහාචාර්යවරයා කලබල නොවී පිළිතුරු දුන්නේය.

"ඔය කියන්නේ ඒක දන්ත ගැන. එයාට මද කිපෙන්න තව මාසයක් විතර තියෙනවා. අනික ඔය ඇතායි හස්තිපාලකවරයායි හරිම සුහදයි. ඇත්ගොව්වා ඉන්නවනං ඇතා කිසිම කලබලයක් කරන්නෙ නෑ."

පශු වෛද්‍ය තරිඳුගේ ඇඟට ලේ ටිකක් ඉනුවේ ඒ වදන් ඇසීමෙනි. කී ලෙසම පෙරහරේ කරඬුව වඩම්මන රාජකාරිය සාර්ථකව නිම කිරීමෙන් පසු ඒක දන්ත හස්තියා ගාම්භීර ලෙස දළදා මාලිගාව බලා පිටත් විය. වෛද්‍යවරයා කලබල වූවාට ඇතා මොහොතකට හෝ කලබල වූයේ නැත.

■ **රෂනිකා ලියනගේ**

# සුසන්තිකාගෙන් පස්සේ තරුෂි ද?



ආසියානු කනිෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලි ඉතිහාසයේ ශ්‍රී ලංකාවට මුලින්ම රන් පදක්කමක් දිනාගන්න ලැබුණේ 1994 අවුරුද්දේ. මීටර් 100 ඉසව්ව නියෝජනය කරපු දමයන්ති දර්ශා තමයි ඒ පදක්කම දිනා දුන්නේ. ජකර්තාවල තිබුණු ඒ තරඟාවලියේදිම මීටර් 200 ඉසව්ව නියෝජනය කරපු සුසන්තිකා ජයසිංහත් රන් පදක්කමක් ගත්තා. ඔය විදියට මෙවර '2023 ආසියානු කනිෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලිය' (U.20 Asian Athletic Championship 2023) පටන්ගන්නකොට ශ්‍රී ලංකාව දිනාගෙන තිබුණු රන් පදක්කම් ගණන හතක්. පාරමී මාරිස්ටෙලා තමයි අවසන් වතාවට මීටර් 3000 බාධක දිවීමේ තරඟයෙන් රන් පදක්කමක් ජයග්‍රහණය කරලා තිබුණේ. ඒ 2018 අවුරුද්දේ.

එතැන් පටන් අවුරුදු පහක් තිස්සේ තිබුණු රන් පදක්කම් ඉඩෝරය අවසන් කරලා ආසියානු කනිෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලි ඉතිහාසයේ අටවැනි රන් පදක්කම ජයග්‍රහණය කරන්න පසුගියදා යොවුන් ක්‍රීඩිකාවක් සමත්වුණා. ඇය තමයි පසුගියදා දකුණු කොරියාවේ පැවැත්වුණු අවුරුදු 20න් පහළ ආසියානු කනිෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලිය (U.20 Asian Athletic Championship 2023) නියෝජනය කරපු තරුෂි කරුණාරත්න.

තරුෂි ඒ ජයග්‍රහණය අරගත්තේ මීටර් 800 ඉසව්වෙන්. ඇය ඒ වෙනුවෙන් ගතකරපු කාලය මිනිත්තු 2:05.63ක්.

"මං කිසිම වෙලාවක තරඟයට බයෙන් හිටියේ නෑ. හැමවෙලේම ඔලුවේ තිබුණේ මං තමයි රන් පදක්කම ගන්නේ, මට ඒක කරන්න පුළුවන් කියන එක. මේ වෙලාවේ මගේ පුහුණුකරු සුසන්ත ප්‍රනාන්දු සර් මතක් කරන්නම ඕනේ. සර් තරඟයට යද්දිම කිව්වා තරුෂි ඔයාට අද රන් පදක්කම ගන්න පුළුවන් කියලා."

තරුෂි මීටර් 800 ජයග්‍රහණයෙන් නැවතුනේ නෑ. ඇය මෙවර රන් සහ රිදී විදියට තවත් පදක්කම් දෙකකට හිමිකම් කියන්න සමත්වුණා. ඒ මෙවර ආසියානු කනිෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවලියේ වැඩිම පදක්කම්ලාභීන්ගේ ලැයිස්තුවේ ප්‍රථම ස්ථානය වගේම ඒ තරඟාවලි ඉතිසාසය තුළ ශ්‍රී ලංකාව වෙනුවෙන් වැඩිම පදක්කම් දිනූ ක්‍රීඩිකාව බවටත් පත්වෙමින්.

"මීටර් 800 රන් පදක්කමට අමතරව මට හැකියාව ලැබුණා මීටර් 400 ඉසව්වෙන් රිදී පදක්කම වගේම 400x4 මිශ්‍ර සහාය දිවීමේ ඉසව්වෙන් රන් පදක්කම දිනාගන්න. කොහොමහරි රන් පදක්කම් දෙකක් රිදී පදක්කමක් විදියට පදක්කම් තුනක්ම අරගෙන තමයි ආයෙමත් මං ලංකාවට ආවේ."

තරුෂි ඉන්නේ උඩුදුම්බර. තාමත් වයස අවුරුදු 19යි. හත වසරට යනකල් ඇය පාසල් ගිහින් තියෙන්නේ උඩුදුම්බර චූලාභය මහා විද්‍යාලයට. ඊටපස්සේ තරුෂි වලල ඒ.රත්නායක මධ්‍ය මහා විද්‍යාලයට ඇවිත්. එතැනදි තමයි ඇය මලල ක්‍රීඩිකාවක් විදියට ඉදිරියට ඇවිත් තියෙන්නේ.

"අපේ ගෙදර ඉන්නේ අම්මයි, තාත්තයි, අයියයි, නංගියි. අයියට හොඳට දුවන්න පුළුවන්. එයා හර්ෂ කරුණාරත්න. එයත් මීටර් 800, මීටර් 400 දුවනවා. ඉතින් මට පුංචි කාලේ ඉඳන්ම ආස හිතුණේ අයියා වගේ වෙන්න. අයියා වගේ වෙන්න හිතලා මමත් අවුරුදු හයේ හතේ ඉඳන් දුවන්න ගත්තා."

තරුෂි මේ අවුරුද්දේ වාණිජ අංශයෙන් උසස්පෙළට මුහුණදෙන්න ඉන්න ශිෂ්‍යාවක්. ඇය කියන විදියට ඉගෙනීමයි ක්‍රීඩාවයි සමබරව කරගෙන යන එක ටිකක් අමාරු වැඩක්ලු. මේ අතරේ තරුෂිගේ ඊළඟ බලාපොරොත්තුව එළැඹෙන ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලියට ක්‍රීඩා කරන එකලු.







"ආසාවක් තියෙනවා 2028 ඔලිම්පික් ක්‍රීඩා උළෙල නියෝජනය කරන්න. ඒ අවස්ථාව මට ලැබුණොත් උපරිම උත්සාහ කරනවා සුසන්තිකා ජයසිංහ අක්කට පස්සේ ඔලිම්පික් පදක්කමක් අපේ රටට ගේන්න."

ඉතින් ඇය හිතන පතන විදියටම ඒ ජයග්‍රහණ අරගෙන ලංකාවේ නම ආයෙමත් ජාත්‍යන්තරයේ බබළවන්න හැකියාව ලැබෙන්න කියලා සුබ පතන ගමන් අපි ඇයට සමුදුන්නා.

■ **රුවන් එස්.සෙනවිරත්න**



# දරුවා පෙන්නලා අපි මාලිංග සර්ගෙන් වාසි ගන්න හැදුවා කියලා සමහරු කිව්වා

## ලසිත් මාලිංග සෙවූ පුංචි ක්‍රීඩකයාගේ මව ධරණීට කියූ කතාව



මුහුණු පොතේ පළ වූ වීඩියෝවේ දරුවා පන්දු යවන ඉරියව්ව



දරුවාගේ මව සහ පියා

ක්‍රිකට් කියන්නේ ගොඩාක් කොල්ලන්ගේ ඇඟේම තියෙන සෙල්ලමක්නේ. වීරවිල ගමේ කොල්ලන්ට කියලත් ඒකෙ වෙනසක් නෑ. ඔවුනුත් හැමදාම වගේ ගමේ ඉස්කෝල පිට්ටනියේ හවසට හවසට ක්‍රිකට් ගහන්න පුරුදුවෙලයි හිටියේ. එදත් සුපුරුදු විදියටම මේ කොලු ගැටයෝ ටික ක්‍රිකට් ගහන්න ලෑස්තිවුණා. සහන් හිටියෙත් ඒ ගොඩේ. මැච් එක පටන්ගන්නකල් ලොකු කොල්ලන්ට හරි ආසාවෙන් බෝල් කර කර හිටපු පුංචි කොලු ගැටයෙක්ව සහන්ට දැකගන්න ලැබුණේ ඔය අතරෙයි. වැඩේ කියන්නේ කොල්ලා බෝල් කෙරුවේ ලසිත් මාලිංගගේ විදියට. ඒක හිතට අල්ලපු හින්දම සහන් කළේ කොලු ගැටයාගේ හපන්කම ෆෝන් එකෙන් වීඩියෝ කරපු එක. ඒ කරලත් නිකන් හිටියේ නෑ එවලෙම ෆේස්බුක් දැම්මා.

පැය කීපයක් යන්නත් කලින් ඒ වීඩියෝව ෆේස්බුක්වල ජනප්‍රියම වීඩියෝව බවට පත්වුණු හැටි ඔබත් දකින්න ඇති. ඒකට හේතුව වුණේ වීඩියෝවේ හිටපු පුංචි දරුවා ලසිත් මාලිංග පන්දු යවන ආරට සමාන ආරකින් පන්දු යැවීම. මේ වීඩියෝව දැකපු කවුරුත් කිව්වේ ඒ ඊළඟ ලසිත් මාලිංග කියලා. වාසනාවකට දැනට ඔස්ට්‍රේලියාවේ ඉන්න ලසිත් මාලිංගටත් මේ වීඩියෝව දකින්න ලැබිලා තිබුණා. ඊටපස්සේ ඒ පුංචි ක්‍රීඩකයාව හොයාගන්න තමන්ට සහාය වෙන්න කියලා ලසිත් මාලිංග ඔහුගේ ෆේස්බුක් පිටුවේ පෝස්ට් එකක් පළකරලා තිබුණා. කොහොමහරි බුකිවාසීන්ගේ උදව්වෙන් දවස් දෙකක් යන්න කලින් මාලිංගට ඒ පුංචි ක්‍රීඩකයා මුණගැහිලා තිබුණා. ඒත් එතැනින් එහා මොකද වුණේ කියන එක එළියට ආවේ නෑ. ඒ හින්දම අපි හිතුවා ඒ පුංචි ක්‍රීඩකයගේ අම්මත් එක්ක කතා කරලා බලන්න.

**"මේ මගේ එකම පුතා දෙනෙත් අනුහස්. හම්බන්තොට ඇතුනදවල ප්‍රාථමික විදුහලේ පහේ පන්තියේ ඉන්නේ. වයස අවුරුදු 10යි. ඉස්කෝලේ පිට්ටනිය තියෙන්නේ ගෙවල් කිට්ටුව ඒකෙ හවසට ළමයි ක්‍රිකට් ගහනවා. මෙයත් ක්‍රිකට්වලට ආසයි. ඉතින් හවසට ඒ ළමයි ක්‍රිකට් ගහනවා බලන්න යනවා. ඒ ගිය ගමන් තමයි පුතා බෝල දලා තියෙන්නේ. ඒක දැකලා තියෙනවා අපේ ගමට අල්ලපු ගමක ඉන්න සහන් කියලා මල්ලි කෙනෙක්. පස්සේ එයා ඒක වීඩියෝ කරලා ෆේස්බුක් එකට දලා. ඒක ලසිත් මාලිංග සර් දැකලා තමයි අපේ පුතාව හොයලා දෙන්න කියලා තිබුණේ. පස්සේ ඒ මල්ලිම අපේ ෆෝන් නම්බර් එකත් ෆේස්බුක් එකට දැම්මා. කොහොමහරි අන්තිමේ ලසිත් මාලිංග සර් අපිට කතා කළා."**

එහෙම කිව්වේ කල්‍යාණි ගංගා. ඒ කියන්නේ දෙනෙත්ගේ අම්මා. ඇය කියන විදියට දෙනෙත් හය හතර තෝරන කාලේ ඉඳන්ම ක්‍රිකට්වලට ආසයිලු.

"පුතා පොඩි කාලේ ඉඳන්ම බැට් බෝල්වලට ආසයි. මැච් එකක් එහෙම තියෙන දවසට පුටුවෙන් හෙල්ලෙන්නේ නෑ. ඒ තරම් ආසයි මැච් බලන්න."

දෙනෙත් ඒ විදියට ක්‍රිකට් මැච් බලන්න පුරුදුවෙලා තියෙන්නේ ලසිත් මාලිංග හින්දලු. මාලිංගට කොච්චර කැමතිද කිව්වොත් ෆෝන් එක අතට ගත්තොත් බලන්නේම මාලිංගගේ වීඩියෝලු.

"ලසිත් මාලිංග සර් තමයි පුතාගේ වීරයා. එයා ඔය විදියට බෝල් කරන්න ගත්තෙත් මාලිංග සර් බෝල් කරන වීඩියෝ දැකලා තමයි. අර වීඩියෝවෙන් පස්සේ මාලිංග සර් පුතා හොයනවා කියලා දැනගත්තම සතුට වැඩිකමට එයාට කන්නත් අමතක වුණා. දැන් එයා ඉන්නේ ලසිත් මාලිංග සර්ව බලන්න ආසාවෙන්."

දෙනෙත් පුතාගේ වීඩියෝ එක දැකලා ලසිත් මාලිංග කල්‍යාණිලාට කතා කළා කියලා දැන් හැමෝම වගේ දන්නවනේ. ඊළඟට අපි ඇයගෙන් අහලා බැලුවේ ඒ ගැන විස්තර.

**"මාලිංග සර් ඔස්ට්‍රේලියාවේ ඉඳන් අපිට කතා කළා. කතා කරලා විස්තර ඇහුවා. ඊටපස්සේ ඇහුවා පුතා දැනට ක්‍රිකට් ඉගෙනගන්නවද කියලා. පස්සේ අපි නෑ කිව්වා. ඒ වෙලාවේ ඇහුවා ගෙවල්වලට ළඟම ක්‍රිකට් තියෙන ඉස්කෝලේ මොකක්ද කියලා. අපි කිව්වා දෙබරවැව ජාතික පාසල කියලා. පස්සේ කිව්වා ඒ ඉස්කෝලෙට දලා ක්‍රිකට්වලින් ඉදිරියට යන්න පුතාට උදව් කරන්නම් කියලා."**

දෙබරවැව ජාතික පාසල කියන්නේ ශ්‍රී ලංකා ජාතික කණ්ඩායමට සුරංග ලක්මාල් වගේ විශිෂ්ට ක්‍රීඩකයෝ දයාද කරපු පාසලක්. ඉතින් එහෙව් පාසලකින් දෙනෙත්ට ක්‍රිකට් පොතේ අයන්න කියවන්නට ලැබීමත් එක්තරා අන්දමක භාග්‍යයක්.

**"පුතා හරි ආසාවෙන් ඉන්නවා අලුත් ඉස්කෝලෙට යන්න. ඒත් ඒ ඉස්කෝලේ හයේ ඉඳන් පන්ති තියෙන්නේ. ඉතින් දැන් ඉන්න ඉස්කෝලෙදි ශිෂ්‍යත්වේ ලියලා තමයි ලබන අවුරුද්දේ ඉඳන් පුතාට ඒ ඉස්කෝලෙට යන්න වෙන්නේ."**

කල්‍යාණි එහෙම කිව්වේ ලොකු සතුටකින්. දරුවන්ගේ ජයග්‍රහණය ළඟ අම්මා තරම් සතුටුවෙන කෙනෙක් නෑ කියනවනේ.

"මමවත් දෙනෙත්ගේ තාත්තවත් දැනගෙන හිටියේ නෑ පුතාට මේ වගේ හැකියාවක් තියෙනවා කියලා. ඒත් සහන් මල්ලි කරපු වැඩෙන් ඒ හැකියාවට නිසි වටිනාකමක් ලැබුණා. පුතාගේ ආසාව තමයි ලසිත් මාලිංග සර් වගේ හොඳ පන්දු යවන්නෙක් වෙලා ජාතික කණ්ඩායමට ක්‍රීඩා කරන එක. අම්මේ මං කවදා හරි ටීවී එකේ පෙන්නන කණ්ඩායමට සෙල්ලම් කරනවා කියලා එයා නිතරම කියනවා. පුතා එයාගේ හැකියාවෙන් ඉස්සරහට යනවා නම් අපිත් ආසයි."

"ඉස්කෝලේ ගුරුවරු මෙයාට හරිම ආදරෙයි. එයාලටත් පුතා ගැන සතුටුයි. ගමේ අයටත් සතුටුයි. පුතාගේ යාළුවන්ට තමයි වැඩිපුරම සතුටු. එයාලා පුතා එක්ක කියනවලු අපිත් මාලිංග මාමා වගේ බෝල් කරන්න පුරුදුවෙනවා කියලා."

කල්‍යාණි හිනාවෙන ගමන් ඒ කතාව කිව්වත් ඔවුන්ගේ ජීවිතවල හරි සංවේදී පැත්තකුත් තියෙන බවයි අපිට කතාබහ අතරතුරේ දැනගන්න ලැබුණේ.

**"අපි ලොකු මිනිස්සු නෙවෙයි. දුප්පත් මිනිස්සු. ඉන්නේ ටකරන් වහපු පොඩි ගේ කෑල්ලක. රංජිත් නිලංග කියන්නේ දෙනෙත්ගේ තාත්තා. එයාට හරිහමන් රස්සාවක් නෑ. මං දැක්කා අපි ගැන සමහරු එක එක කතා කියලා තිබුණා. අපි දරුවා ඉස්සරහට දලා අඟහිගකම් පෙන්නලා වෙන වෙන දේවල් බලාපොරොත්තු වෙනවලු. අනේ අපි එහෙම නෑ. අපිට කියලා කිසිම දෙයක් එපා. ඒත් පුතාට ක්‍රිකට්වලින් ඉස්සරහට යන්න කවුරු හරි උදව් කරනවා නම් අපි කැමතියි."**

■ රුවන් එස්.සෙනවිරත්න

අංජලී බුදවත්ත ජයවර්ධන
මනෝඋපදේශිකා/ මාධ්‍යවේදිනී

# පෙම්වතිය හේමාල්ට ❤ එකක් දාලා

# පෙම්වතාගේ හිත හොඳටම රිදිලා

අපි ආදරය කරනකොට අනිත් කෙනා අපිට දක්වන සැළකිල්ල දකින්න හරිම කැමතියි. ආදරේදී එයා අපිට දීලා තියෙන වටිනාකම මනින්නේ ඔය සැළකිල්ලෙන්. මුල්කාලෙදී ඇත්තටම ඕක ගැන වද වෙන්න දෙයක් නෑ. මොකද සම්බන්ධයක් පටන්ගත්තු මුල් කාලෙ තියෙන උද්‍යෝගය නිසා ඒ කාලෙ කොහොමත් අනිත් හැමදේටම වඩා වටින්නෙ ආදරය කරන කෙනාව. ඒ නිසා ඕනම කෙනෙකුට බලාපොරොත්තු වන මට්ටමටත් ඉහළින් ආදරේ කරන කෙනාගෙ මුල්තැන (Priority) ලැබෙනවා. ඒ කියන්නෙ අපි මොනවද කරන්නෙ, කොහෙද ඉන්නෙ, කන්නෙ මොනවද, හිතන්නෙ මොනවද වගේ ගොඩක් දේවල් ගැන වද වෙන්න කෙනෙක් ඉන්නවා. ඒක අපිට සතුටක්. මොකද මට ආරක්ෂකයෙක්, අයිතිකාරයෙක් ඉන්නවා කියන හැඟීම දෙපාර්ශවයටම හරිම සතුට දනවනසුළු කාරණාවක්. ඒ හැඟීම හරිම අලුත්. කොහොමටත් අලුත් දේවල්වල වටිනාකම වැඩීනේ. හැබැයි කාලයක් යද්දි ඔය වටිනාකම අඩුවෙනවා. සමහර වෙලාවට ඔය හොයලා බැලිල්ල වදයක් වෙනවා. හරියට නිකන් හිරකාරයෙක් ගැන හොයලා බලනවා වගේ හැඟීමක් එන්නත් පුළුවන්. එතැනදි තේරුම්ගන්න තියෙන ලොකුම දේ තමයි කාලය අනුව ඕනෑම හැඟීමක් වෙනස් වෙනවා කියන එක.

හරි, එතකොට ආදරේදී මුල්තැන හොයනවා කියන්නෙ මොකක්ද?

ආදරේදී මුල්තැන බලාපොරොත්තු වෙනවා කියන්නෙ, එයා එයාගෙ හැම වැඩකටම වඩා මට මුල්තැන දෙන්න ඕනෙ කියන හැඟීම. ඒක සෘජු ලෙස සන්නිවේදනය නොකළත් බළලා මල්ලෙන් එළියට පනිනවා වගේ විවිධ ප්‍රකාශ හරහා ඔය හැඟීම එළියට පනිනවා.

"අද උදේ නැගිටලා මට good morning මැසේජ් එක එව්වෙ නැත්තෙ ඇයි?"

"ඔයා වෙනදට ටිකකට හරි ඔෆිස් එකෙන් එළියට යනවනම් මට කියලනෙ යන්නෙ. අද ඇයි මට නොකියා බැංකුවට ගියේ?"

"වෙනදට නම් ඔයා අපි හම්බවෙමු කිව්වහම මොන වැඩේ තිබ්බත් ඒව කැන්සල් කරලා එනවා. ඒත් දැන් අර වැඩේ මේ වැඩේ ලොකුයි ඔයාට මට වඩා."

ඒ කෙනාට ආදරයේ අවධානය සහ මූලිකත්වය තරයේ අවශ්‍යයි කියන එකයි මේ වගේ ප්‍රකාශවලින් පැහැදිළි වෙන්නේ. අනික මෙහෙම වෙලාවලදි මිනිස්සු හැමතිස්සෙම අතීතය එක්ක වර්තමානය සන්සන්දනය කරනවා. මුල්කාලෙදි එහෙම නෑනේ, ඇයි දැන් මෙහෙම? එයාට මාව වටින්නෙ නැද්ද? මුළු ලෝකෙටම වඩා මාව වටිනවා කියපු කෙනාට මගෙ වටිනාකම අඩුවෙලාද? ඔහොම සිතුවිලි දමයක් එක්ක හිත ඇතුළෙන් ගැටුම පටන්ගන්නවා.

මෙතැනදි අපි තේරුම්ගන්න ඕන මුල්ම දේ ආදරේ උද්‍යෝගය (excitement) තියෙන කාලය සහ පසු කාලය සන්සන්දනය කරන එක මෝඩ වැඩක්. මොකද ආදරේ උද්‍යෝග කාලය (excitement period) මනෝවිද්‍යාත්මකවත්, ජීවවිද්‍යාත්මකවත් හරිම වෙනස් තත්ත්වයක්. එතැනදි මොළේ රසායන පවා සැළකිය යුතු මට්ටමකට වෙනස් වෙනවා. ඒ කියන්නෙ සතුටට අදාළ හෝමෝන සහ රසායන වැඩිපුර උත්පාදනය වෙන නිසා උද්‍යෝගය වැඩියි. ආදරය කියන්නෙ මාරම හැඟීමක් කියලා එතකොට තමයි අපිට හිතෙන්නේ. ඔය කාලෙට මගෙ ආදරේ මාරයි, ලෝකෙ මෙහෙම ආදරයක් නෑ වගේ මනස්ගාත හිතෙනවා. හැබැයි ඒක කෙටිකාලීනයි. කාලය එක්ක නැවත මොළයේ රසායන යථා තත්ත්වයට පත්වෙන්න පටන්ගන්නවා. එතකොට ආදරය කියන්නෙත් රැකියාව වගේ ජීවිතේ තවත් කොටසක් විතරක් වෙන්න ගන්නවා. තව දෙයක් දෙපාර්ශවයටම මේක එකවර වෙන්නෙ නෑ. එක්කෙනෙක්ට මේක සාමාන්‍ය වෙන කාලෙදිත් අනික් කෙනාට සාමාන්‍ය නොවෙන්න පුළුවන්. විශේෂයෙන්ම ගැහැනු ළමයින්ගේ ආදර උද්‍යෝගය නැතිවෙන්න කල් යනවා. පිරිමි ළමයින්ට ඉක්මන්ට ඒ උද්‍යෝගය නැතිවෙලා යන්න පුළුවන්. හැබැයි ඒකටත් විද්‍යාත්මක හේතු තියෙනවා.

මේ සංසිද්ධිය තේරුම්ගන්න පුළුවන් නම් අනිත් කෙනාට එපා නොවෙන්න ආදරේ රැකගන්න පුළුවන්. මේ විදියට කාලයත් එක්ක සියලු හැඟීම් වෙනස් වෙන බවත් ඒවා වෙනස් වෙන්න හේතුත් ඒවා වෙනස් වෙන හැටිත් දැනුවත් වෙලා හිටියොත් අනිත් කෙනාට කරදරයක් නොවී හැමදාම ආදරය රැකගන්න පුළුවන්.

මුල්ම දේ මේ වගේ දේවල්වලදි කිසිම වෙලාවක අතීතය සහ වර්තමානය සසඳන්න යන්න එපා. ඒ වගේම වර්තමාන තත්ත්වය නිසා අනාගතය ගැන බොරුවට බය වෙලා ප්‍රශ්න හදාගන්නත් එපා. අවංක ආදර කතා ඇතුළෙත් මේ කියපු රසායන වෙනස්කම වෙනවා. මේ කියපු ප්‍රතිචාරාත්මක වෙනස්කමුත් වෙනවා. ඒත් ආදරය සහ ඒ කෙනා ගැන තියෙන සැලකිල්ල උඩින් නොපෙනුණත් ඒ හිත්වල තියෙනවා. හැබැයි කපටි ආදරය අඳුරගන්නත් මේක අවස්ථාවක්. බොරු busy එකක් act කරලා බේරිලා යන්න හදන්නෙත් මෙහෙම. මේ දෙකේ වෙනස අඳුනගන්නත් ඒක තේරුම් අරන් ජීවත්වෙන්නත් අපි බුද්ධිමත් වෙන්න ඕනේ. බිසී වෙන හැමෝම ඇත්තට බිසී වෙන්නෙත් නෑ. බිසී වෙන හැමෝම බොරුවට බිසී වෙන්නෙත් නෑ. මේ දෙකේ වෙනස ලේසියෙන් තේරුම්ගන්න පුළුවන්. ඒකට උපේක්ෂාවෙන් බලාගෙන හිටියානම් ඇති.

මේ ගැන මේ තරම් පැහැදිළි කළේ ඔයාගෙ ආදර කතාව ඇතුළේ අනවශ්‍ය ප්‍රශ්න ඇති නොකරගෙන සතුටින් ඉන්න පාර පෙන්නන්න ඕනෙ නිසයි. බොරුවට ගුඩ් මෝනින් මැසේජ් එකකට හෝ ඒ වගේ වෙනත් දේවල්වලට බොරු වටිනාකම් දීලා වටින ආදරයක් නැති කරගන්න එපා. එයාට එක දවසකට ඒ මැසේජ් එක එවන්න අමතක වෙන්න පුළුවන්. ඒත් ඒක අල්ලගෙන ඒ මනුස්සයගෙ මුළු දවසම කන ප්‍රේමවන්තයෙක් හෝ ප්‍රේමවන්තියක් වෙන්න



**බිසීවෙන හැමෝම ඇත්තට බිසී වෙන්නෙත් නෑ. බිසී වෙන හැමෝම බොරුවට බිසී වෙන්නෙත් නෑ. මේ දෙකේ වෙනස ලේසියෙන් තේරුම්ගන්න පුළුවන්. ඒකට උපේක්ෂාවෙන් බලාගෙන හිටියානම් ඇති**

එපා. ඒක මෝඩකමක්. අපි මනුෂ්‍යයෝ මිසක් යන්ත්‍ර නෙමෙයිනේ. හරියට කම්පියුටර්වල ප්‍රෝග්‍රෑම් කරනවා වගේ මානව සබඳතාවල හැමදේම ඒ විදිහටම සියල්ලම සිද්ධවෙන්නෙ නැහැ.

අවසාන වශයෙන් මේ කාරණාවට පුංචි උදාහරණයක් කියන්නම්.

එක තරුණයෙක් හිටියා. ඔහුගේ හිත හොඳටම බිඳිලා. ඒකට හේතුව අහලා ඔබ හිනාවෙන්න එපා. මොකද කෙනෙක්ට ඒක හාස්‍යයට කාරණාවක් වුණාට තුවාලය තියෙන කෙනාට ඒක දරුණු වේදනාවක්. ඔහුගේ ආදරවන්තිය ෆේස්බුක් එකේ හේමාල් රණසිංහ සුපිරි තරුවගේ පින්තූර කීපයකට හාට් රිඇක්ෂන් දාපු නිසා තමයි මොහුගේ හිත බිඳිලා තියෙන්නෙ. ප්‍රේමවන්තියට තමා ඇරෙන්න වෙන පිරිමින්ට හාට් රිඇක්ෂන් දාන්න බෑ කියන එකයි ඔහුගේ අදහස.

මේවා කොයිතරම් සරල මෝඩ කතාද කියලා ඔබට හිතෙන්න පුළුවන්. ඒත් ආදරයෙදි මුල්තැන බලාපොරොත්තුවෙන අයට මේ වගේ පුංචි දේවල් පවා හරිම බරක් විදියට දැනෙනවා. හේමාල්ට ඉතිං හැමෝම හාර්ට් රිඇක්ෂන් දාහවනේ කියලා ඔබටත් හිතෙනවා ඇති. ඔයා හින්දි ආදර සම්බන්ධතාවල ප්‍රශ්න ඇතිවෙනවා. ඒ හින්දි ඉක්මන්ට කාවහරි හොයාගෙන කසාද බැඳලා රගපාන එකත් නවත්තලා ෆේස්බුක් එකෙනුත් අයින්වෙලා යන්න කියලා හේමාල්ව හම්බුණහම කියන්නයි මම හිතන් ඉන්නේ.

තේරුම්ගන්න ඔබේ ආදරවන්තයා හෝ ආදරවන්තිය වෙනත් කෙනෙකුට ලයික් එකක් දැම්මා කියන්නේ සියල්ල උඩුයටිකුරු වෙන දෙයක් නෙමෙයි. නීති දාලා ඇයට සීමා පනවන එකෙන් වෙන්නෙ හිතක් තැලෙන එක. මගෙ හොඳම යාළුවා ශාරුක් ඛාන්ගේ හොඳම රසිකාවියක්. ඇයගේ කාර්යාල මේසෙ උඩ ශාරුක් ඛාන්ගෙ පින්තූරයක් තියෙනවා. හැබැයි එයාගෙ හස්බන්ඩ්ට ඒක ප්‍රශ්නයක් නෙමෙයි. මොකද එයා දන්නවා ඒ දෙන්නගෙ ආදරේ වෙනයි wifeගෙ ශාරුක් ඛාන් love එක වෙනයි කියලා. බුද්ධිමත් වෙනවා කියන්නෙ අන්න ඒකට. ආදරේ මුල්තැන ගන්න ගිහින් අනිත් කෙනාගේ අහිංසක ආසාවන් මරලා දාන්න හොඳද? මුල්තැන ලැබෙන්නෙ ඔබේ හැසිරීමෙන් මිසක් ආදරවන්තයා හෝ ආදරවන්තියගේ චර්යාවෙන් නෙමෙයි. ඔහුගේ හෝ ඇයගේ චර්යාව විදියට එළියට එන්නෙත් සමහරවිට ඔබේ හැසිරීම්වල ප්‍රතිඵල වෙන්න පුළුවන්. ඒ දේවල් දැනගෙන සතුටෙන් ආදරෙන් ජීවිතේ බේරගන්න බලන්න.

# අනාගත සිහින හඹායන

දිරිය දූ පුතුන්ට

# අපෙන් සවියක්



CDB සිසුදිරි

## ශිෂ්‍යත්ව වැඩසටහන

15 වන අදියර

**5 වසර ශිෂ්‍යත්ව හපනුන්ට**
**රු.62,500/- ක ශිෂ්‍යත්වයක් සහ**
**සාමාන්‍ය පෙළ හපනුන්ට**
**රු.35,000/- ක ශිෂ්‍යත්වයක්**

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය**
**2023 අගෝස්තු 15**

2021 වසරේ 5 වසර ශිෂ්‍යත්වය හෝ සාමාන්‍ය පෙළ විභාගය විශිෂ්ට ලෙස සමත් සහ ආර්ථික දුෂ්කරතා සහිත ඔබගේ දුවට, පුතාට මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සමඟින් එක්වීමට මෙහි සඳහන් ආදර්ශ අයදුම්පත පුරවා **සහකාර සාමාන්‍යාධිකාරි - අලෙවි සහ තිරසාරත්ව, සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී, අංක 123, ඔරාබිපාෂා මාවත, කොළඹ 10** යන ලිපිනයට ඉක්මනින් යොමු කරන්න.

### ආදර්ශ අයදුම්පත

පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක් (අමුණන්න)

**දරුවාගේ විස්තර**

සම්පූර්ණ නම :..............................................................................

උපන් දිනය : දිනය ....................මාසය ....................වර්ෂය ............................

පෙනී සිටි විභාගය :........................................ විභාග අංකය :......................

විභාගයට පෙනී සිටි වර්ෂය :.............................................................

විභාගයට පෙනී සිටි පාසල :.............................................................

විභාගයට පෙනී සිටි දිස්ත්‍රික්කය :.......................................................

ලබාගත් ප්‍රතිඵලය :.......................................................................

දැනට ඉගෙනුම ලබන පාසලේ නම :.....................................................

★ දෙමව්පියන්ගේ දුරකථන අංක 2ක් :....................................................

★ දෙමව්පියන්ගේ පදිංචි ලිපිනය :.......................................................

- **සම්පූර්ණ කරන ලද අයදුම්පත සමඟ දරුවාගේ උප්පැන්න සහතික පිටපත, පාසැල් නිල ඇඳුමින් ලබාගත් පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක්, විදුහල්පතිතුමා සහතික කරන ලද විභාග ප්‍රතිඵල සටහන, ආර්ථික අපහසුකම් ඇති අයෙක් නම් ඒ බව (මාසික ආදායම) ග්‍රාම සේවක මහතා විසින් සහතික කළ සහතිකයක් අමුණා එවිය යුතුය.**

★ **දෙමව්පියන්ගේ දුරකථන අංක 2ක් සහ දෙමව්පියන් පදිංචි ලිපිනය සඳහන් කිරීම අනිවාර්ය වන බව සලකන්න.**

**සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී**

ක්ෂණික ඇමතුම 0117 388 388

CDB ඔබේ හිතවතා

www.cdb.lk



# හිත හොඳ රස්තියාදුකාරයිනි, අනේක වාරයක් ස්තුතියි!




කාවින්ද දෙව්මිණ






**පුතාට හිතාගන්න බැරිවුණා. එයා මුලින් යටිගිරියෙන් කෑ ගැහුවා සතුටට. ඊටපස්සේ පුදුමවෙලා බලාගෙන හිටියා**





ඒ පහුගිය මැයි 26 වැනිදා. එදාට තමයි පුංචි කාවින්ද දෙව්මිණගේ දහවැනි උපන්දිනය යෙදී තිබුණේ. වෙනදාට නම් කාවින්ද උපන්දිනය සැමරුවේ අම්මයි, තාත්තයි, අක්කයි එක්ක පුංචි කේක් ගෙඩියක් කපලා. ඒත් මෙදා සැරේ ටිකක් දවල් වෙනකලුත් ගෙදර එහෙම කේක් එකක් කැපුවේ නෑ. පුංචි එකාට ඒ ගැන තිබුණේ ප්‍රශ්නාර්ථයක්.

එතකොට වෙලාව උදේ දහයට වගේ ඇති. එකපාරටම කාවින්ද පුතා ආසම කරන සද්දයක් ඈතින් ඇහුනා. ඒ පළාතම සද්දේ කරගෙන එන හොනට් බයික් එකක හඬක්. කාවින්දට ඉහිලුම් නැතිව ගියා. කොච්චර ඉහිලුම් නැතිව ගියාද කිව්වොත් සද්දේ ඇහෙද්දිම පොඩි එකා ගෙවල් ගාව පාර අයිනේ. ගතවුණේ තත්පර දෙක තුනයි. පළාතම දෙදරුම් කාගෙන ආපු බයික් පෝලිමක්ම කාවින්දව වටකරගත්තා. ඒ පොඩි ගාණක් නෙවෙයි බයික් හත්සිය ගණනක්. දන්නවද, ඒ තමයි කාවින්දගේ අම්මයි තාත්තයි මෙදා සැරේ පුංචි පුතාට දුන්නු උපන්දින තෑග්ග.

**"මගේ පුතාට බයික් කිව්වොත් වෙන මුකුත් ඕන නෑ. ඒ තරමටම බයික්වලට ආසයි. පොඩි කාලේ ඉඳන්ම පුටුවේ වාඩිවෙලා කකුල් දෙපැත්තට දලා ඩිරෑම් ඩිරෑම් කියලා කටින් බයික් එළවනවා වගේ රඟපානවා"**

අපිට එහෙම කිව්වේ කාවින්දගේ අම්මා. ඇය තමයි එදා පුතාට හිතාගන්න බැරි විදියේ උපන්දින තෑග්ගක් දෙන්න කටයුතු කරලා තිබුණේ.

"අපේ ගෙවල් තියෙන්නේ රුවන්වැල්ල, නිට්ටඹුව පාරේ. පුතා බයික්වලට ආස හින්දා මට හිතුණා එයාට පුදුම හිතෙන ජාතියේ දෙයක් කරන්න ඕන කියලා. මට ඕන වුණේ පුතාගේ උපන්දිනය දවසේ එයා ආස කරන විදියේ බයික් තියෙන මල්ලිලා දෙතුන් දෙනෙක්ට අපේ ගෙදරට එන්න කියලා රවුමක් එහෙම එක්ක ගිහින් කේක් කපලා එයාව සතුටු කරන්න."

අන්න එහෙම හිතාගෙන තමයි කාවින්දගේ අම්මා තමන්ගේ ලොකු දුවත් එක්ක එක්කහු වෙලා ෆේස්බුක් එකේ බයික් සම්බන්ධ පේජ් කීපයකට මැසේජ් දැම්මේ. ඒ හොඳ බයික් කීපයක් සම්බන්ධ කරලා දෙන්න පුළුවන්ද අහලා. ඒත් ඒ අතරින් පිළිතුරක් ලැබිලා තියෙන්නේ 'ට්‍රැකර් ඇන්ඩ් හොනට් පික්කෝ' කියන පේජ් එක කරන තරුණයාගෙන් විතරයි. පොඩි එකාගේ ආසාවනේ කියලා හිතපු ඔහුත් කරලා තියෙන්නේ ඒ ගැන පෝස්ට් එකක් හදලා ෆේස්බුක් පළකරපු එක. වැඩේ කියන්නේ ඒකට හිතාගන්න බැරිතරම් එදා ලංකාව වටෙන්ම ප්‍රතිචාර ඇවිත්.

**"පුතාගේ උපන්දිනේ දවසේ මමත් සෑහෙන්න පුදුම වුණා. ඇයි දෙයියනේ පුතා ආස ජාතියේ බයික් හත්සිය ගණනකට වඩා ඇවිත් තිබුණා. එදා නිවාඩු දවසක් වුණා නම් ඊටත් වැඩිය ඒවි කියලයි ඒ ආපු අය අතරේ හිටපු බුද්ධික වසන්ත මල්ලි මට කිව්වේ."**

බුද්ධික කියන්නේ යතුරුපැදිවලට ආදරේ කරන අය වෙනුවෙන් ෆේස්බුක් එකේ 'යකඩ හුස්ම' කියන පේජ් එක කරන තරුණයා. ඔහුත් අර පෝස්ට් එක දැකලා තමන්ගේ පේජ් එකේ ඒ ගැන පෝස්ට් එකක් දලා. අන්න ඊටපස්සේ තමයි ලංකාව වටේම හිටපු යතුරුපැදිකරුවෝ යකඩ හුස්මත් එක්ක එකතුවෙලා තෙල් පුච්චගෙන මේ වැඩේට ඇවිත් තියෙන්නේ. ඒ කාවින්දගේ අම්මගේ අහිංසක ආසාව හිතාගන්න බැරි විදියටම සැබෑකරලා දෙන්න.

"පුතාට ඒක හිතාගන්න බැරිවුණා. එයා මුලින් යටිගිරියෙන් කෑ ගැහුවා සතුටට. ඊටපස්සේ පුදුමවෙලා බයික් දිහා බලාගෙන හිටියා. ටිකවෙලාවකින් ඒ බයික්වල නැගලා කරලා ඒ ආපු අයත් එක්ක සතුටුවුණා. ඒ ආපු හැමෝමත් පුතාගේ සතුට වෙනුවෙන් ගොඩාක් දේවල් කළා. පුතාට තෑගි එහෙමත් අරගෙන ආවේ. හැමෝම එක්ක කේක් එකක් එහෙමත් කැපුවා."

දන්නවද කාවින්ද දෙව්මිණ කියන්නේ සාමාන්‍ය දරුවෙක් නෙවෙයි. ඒ පුංචි පුතා හෙමින් වැඩෙන අසනීප ගොඩාක් තියෙන විශේෂ අවශ්‍යතා සහිත දරුවෙක්. අන්න ඒ නිසයි මේ කතාව අපට මෙච්චරටම විශේෂ.



"කාවින්ද පුතා ඉපදුණේ 2013 මැයි 26 වැනිදා. මගේ දෙවැනි දරුවා. මාස හතෙන් වගේ අඩු මාසෙන් ඉපදුණේ. ඒ ඉපදෙද්දි පුතා හරිම වෙනස්. නිල්ම නිල් පාටයි. මූණ එහෙම ඉදිමිලා වගේ තිබුණේ. මං පුතාව තියාගෙන මාස එකහමාරක් විතර අවිස්සාවේල්ල රෝහලේ නොමේරූ ළදරු ඒකකයේ හිටියා. ඒ ඉඳලා ගෙදර එක්ක ආවත් නිතරම අසනීප වෙලා ඉස්පිරිතාලේ එක්ක යන්න වුණා. පස්සේ ඩොක්ටර්ස්ලා පුතාගේ ස්කෑන් වගයක් කළා. ඒ කරලා කිව්වා එයා වැඩිලා මදි ඇගේ ප්‍රශ්න ගොඩක් තියෙනවා කියලා. ඊටපස්සේ මං පුතාවත් තියාගෙන මාස ගණන් ඉස්පිරිතාලවල හිටියා. ඩොක්ටර්ස්ලා පුතා ගැන අදහස අතඅරින්න කියපු වෙලාවලුත් තිබුණා. ඔය අතරේ වටේපිටේ අයත් එක එක කතා කියලා අපිව මානසිකව වැට්ටුවා. ඒත් මටයි මහත්තයටයි ඕනේ වුණේ පුතාව කොහොම හරි කරලා සනීප කරගන්න."

හැඬූ කඳුළින් පුංචි කාවින්දගේ ඒ අතීතය මතක් කළේ කාවින්දගේ අම්මා, චමිලා දමයන්ති. එතකොට තාත්තා තමයි රනිල් පතිරණ. ඔහු ගෙදර එළවලු කඩයක් කරන කෙනෙක්.

**"පුතා ටික ටික ලොකු වෙනකොට ගොඩාක් අය වෙනස්කම් කළා. විහිලු කළා. ඒ වගේමයි ගොඩාක් තැන්වලදි ප්‍රතික්ෂේප කළා. ඒත් අපි ඒ කිසිම දෙයක් හිතුවේ නෑ. පුතාට අවුරුදු හතරක් වෙද්දි අපි එයාව මොන්ටිසෝරි දැම්මා. ඊටපස්සේ රුවන්වැල්ල ප්‍රාථමික පාසලේ විශේෂ අවශ්‍යතා ඒකකයට පුතාව ඇතුළත් කළා. මං මේ වෙලාවේ ආදරෙන් මතක් කරනවා පුතාගේ ටීචර් ඉන්ද්‍රානි මිස්. එතුමිය අවුරුදු දෙකකට කිට්ටු කාලයක් කැපවෙලා පුතාට අකුරු ලියන්න පුරුදු කළා. දැන් පුතාට අකුරු ලියන්න එහෙම පුළුවන්."**

දැන් කාවින්ද පුතාට හුඟාක් සනීපයිලු. හොඳට හිනාවෙලා නිරෝගී දරුවෙක් වගේ දඟලලා කරලා ඉන්නවලු. ඒත් ඒ හිනාව වෙනුවෙන් පුතාගේ අම්මයි තාත්තයි කරපු අනේකවිධ කැපකිරීම් දන්නේ නම් ඒ දෙන්නම විතරයි.

"මේ අවුරුදු දහය හරිම වේදනාවක් කිව්වොත් හරි. අපි කියන්න බැරිතරම් දුක්වින්දා. මං හිතන්නේ ඔය කාලේ ඇතුළේ මං පුතා එක්ක වැඩි කාලයක් ඉන්න ඇත්තේ ඉස්පිරිතාලවල. ඒත් පුතා වෙනුවෙන් මමයි මහත්තයයි ඒ හැම දුකක්ම වින්දා. අනේ දෙයියන්ගේ පිහිටෙන් දැන් පුතා හොඳින් ඉන්නවා."

චමිලා එහෙම කිව්වේ කලින් පාර වැටුණු කඳුළුවලට රිදෙන්නත් එක්ක කාවින්ද දිහා බලලා හිනාවෙලා.

"පුතා බයික්වලට පුදුම ආසයි. හැබැයි බයික් තියෙන සමහරු නම් එයා බයික් ළඟට එනවටවත් කැමති නෑ. ඒත් අපේ ගමේ දෙතුන්දෙනෙක් පුළුවන් වෙලාවට එයාව එයාලගේ බයික්වල රවුමක් දෙකක් එක්ක යනවා. අම්මේත් ඉතින් ඒ වෙලාවට බලන්න එපැයි පොඩි එකාගේ මූණේ තියෙන සතුට."

කාවින්ද වගේ පුංචි දරුවෝ අපේ රටේ කොච්චර නම් ඇතිද? ඒ පුංචි උන් කොච්චර ලස්සන ආසාවන් එක්ක ජීවත්වෙනවා ඇතිද? අපට එහෙම හිතුණේ පුංචි කාවින්ද බයික්වලට තියෙන ආසාව දැකලා. ඉතින් ඒ ආසාව ඉටුකරන්න කියලා චමිලාගේ ඉල්ලීමට කාවින්දගේ උපන්දිනේ ලස්සන කරන්න ආපු හත්සීයකට අධික යතුරුපැදිකරුවෝ ගැනත් අපි ඇයගෙන් ඇහුවා.

**"මට ඒක අදටත් හිතාගන්න බෑ. මං හිතුවේ බයික් තුන හතරක් එයි කියලා. ඒත් හරියටම බයික් හත්සිය ගණනක් එදා ආවා. මගේ පුතා වෙනුවෙන් ඒ ආපු හැමෝටම මමයි මහත්තයයි ගොඩාක් පින් කියනවා. මං වගේ අම්මෙකුගේ පුංචි ඉල්ලීමකට ඒ අය එදා ආවේ අතින් වියදම් කරගෙන. ඒ සතුට මට කියාගන්න බෑ. පුතා එදා පුදුම විදියට සතුටුවුණා. මගේ සතුටටත් වඩා මට වටින්නේ ඒ සතුට. ඉතින් ආයෙමත් මං ඒ ආපු තරුණ තරුණියෝ හැමෝටම ගොඩාක් ස්තූතියි කියනවා."**

පළාතම සද්දේ දාගෙන බයික්වලින් වැඩදාන ඉගිලෙන කොල්ලෝ ගැන මේ වෙනකල් සමාජය කොච්චර නම් කතා කිව්වද? ගොඩාක් අය ඔවුන්ට කිව්වේ ඉන්න බැරුවට නිකරුණේ මැරෙන්න දඟලන රස්තියාදුකාරයෝ සෙට් එකක් කියලා. ඒත් අද ඔවුන් ගැන රටක්ම හරි ආදරෙන් කතා කරන්න පටන් අරන්. ඇත්තටම තමන්ගේ වැඩත් පස්සට දාලා තෙලුත් ගණන් කාලේ ඔවුන් කළේ ලොකු දෙයක්. ඒකට තමයි නියම මනුස්සකම කියන්නේ.

"ඒ අය කරපු දේ නිසා දැන් අපේ රටේ ගොඩාක් අය මගේ පුතාව දන්නවා. ඒ දන්න හැමෝම මගේ පුතාට හදවතින්ම ආශිර්වාද කරනවා. ඉතින් මුළු රටකින්ම එකසැරේට ආශිර්වාද ගන්න තරම් මගේ පුතා වාසනාවන්ත වුණා. එහෙම ආශිර්වාද කරපු හැමෝටමත් ගොඩාක් පින්."

චමිලා එහෙම කිව්වේ පුංචි කාවින්දව තුරුල්කරගන්න ගමන්.

■ රුවන් එස්.සෙනවිරත්න

---

දැන්වීමකි

# හැමදාම තෙල් - බේත් ගාන සන්ධි අමාරුවට මෙන්න විසඳුම

## කුරුණෑගල ගැට්ටුවානේ සන්ධි සුව වෙද අරණ

ඇඟපතේ වේදනාවලට හැමදාම තෙල්බේත් ගාන අය ඕනතරම්... සමහරු රෑ මුළුල්ලේ නිදි වරාගෙන සන්ධි අමාරු නිසා කෙඳිරි ගානවා. කෑ ගහනවා. තවත් අයට ඇවිදින්න බැරි තරමට දණහිස් අමාරු... වාරුවක් නැතිව යන්න බෑ. අතපය ඔසවා ගන්න බෑ. නැවෙන්න බෑ, පෙරළෙන්න බෑ කියනවා. වාඩි වුණොත් දෙතුන් දෙනෙක් එකතු වෙලා නැගිටුවන්න ඕනේ... එහෙම බැලුවම සන්ධි අමාරු කියන්නේ ලෙඩාට විතරක් නොවෙයි, ගෙදර හැමෝටමත් කරදරයක්. ඇයි අපි එහෙම කියන්නේ. සන්ධි ලෙඩෙක් වෙනුවෙන් පවුලේ අය මොනතරම් වෙහෙසෙන්න ඕනෙද?. කොච්චර බේත් බිව්වත් ඇතැම් විට ගුණයක් ලැබිලා නැතුව ඇති. ඔබේ බලාපොරොත්තුව මැරෙන තුරුම ඔහොම ඉන්නද? ඔබ සන්ධි අමාරු නිසා ඔය හැටි පීඩා විඳින්නෙ නිවැරදිම වෙදකම ඔබට නොලැබුණු නිසා. දැනට අපේ රටේ සන්ධි වෙදකමේ හොඳම තැන තමයි කුරුණෑගල ගැට්ටුවානේ සන්ධි සුව වෙද අරණ. එහි ප්‍රධාන වෛද්‍ය නිලධාරියා වෛද්‍ය වසන්ත උදයජීව මහත්මායි.

සන්ධි සුව වෙද අරණින් වරක් ප්‍රතිකාර ගත් අය දෙවන වර එහි එන්නේ තමන්ගේ සතුට ප්‍රකාශ කරගෙනයි. එයට හේතුව ඔවුන් එතෙක් නුදුටු දේශීය වෙදකමේ ආශ්චර්යය පළමු වරට අත්දකින නිසායි.

"මට ආතරයිටිස් වගේ තිබුණා. අවුරුදු ගාණක් ඉංග්‍රීසි බෙහෙත් බිව්වා. විවිධ පරීක්ෂණ කළා. නොයෙක් සිංහල බේතුත් බිව්වා. මම කරගෙන හිටපු රස්සාව තියා ගෙදර එක කාමරේක ඉඳන් අනෙක් කාමරේට යන්නවත් බැරි තරමට මගෙ හන්දි අමාරුව වැඩි වුණා. මම නිසා ගොඩක් දුක් වින්දෙ මහත්තයයි, දරුවොයි. ඒ අයට සිද්ධ වුණා ගෙදර වැඩ සේරම කරලා රැකියාවලට යන්න. මම සන්ධි සුව වෙද අරණට ආවට පස්සේ දැන් හොඳටම හොඳයි. අවුරුදු ගාණකින් නොතිබුණු ජවයක් ශක්තියක් ඇඟපතට, සන්ධිවලට ලැබී තියෙනවා. දැන් ගඟේ එහා මෙහා පීනන්න පුළුවන් තරමට සුවය ලැබී තිබෙනවා'' අපට එසේ පැවසුවේ පැපිලියවල ශ්‍රියානි මල්ලිකා මහත්මියයි.

වසන්ත උදයජීව මහතා ආයුර්වේද හා පරම්පරා වෙදකමෙහි විශේෂඥයෙකි. ඔහුගේ සීයා අතීතයේ ගැට්ටුවානේ විසූ දක්ෂ සන්ධි වෙද මහතෙකි. ඔහු සොයා ලංකාවේ සතර දිග්භාගයෙන් ලෙඩ්ඩු කුරුණෑගල ගැට්ටුවානට පැමිණියහ. මේ නිසා ගැට්ටුවානේ සන්ධි වෙදකම රටේ ප්‍රචලිත විය. සීයාගෙන් පසු උදයජීව මහතාගේ පියා වූ ගුණදාස මහතා එම වෙදකම කළේය. වසන්ත උදයජීව මහතා ගැට්ටුවානේ සන්ධි වෙදකම 'සන්ධි සුව වෙද අරණ' නමින් නම් කර ආරම්භ කළේය.



වෛද්‍ය වසන්ත උදයජීව මහතා

පරම්පරාගත සන්ධි වෙදකම සඳහාම වන විශේෂ රහස් ඖෂධ වට්ටෝරු රාශියක් උදයජීව මහතා සතුව ඇත. 'අස්ථි පෝෂණ රසායනය' ඉන් එකකි. වසන්ත උදයජීව මහතා සන්ධි රෝග ගැන දක්වන්නේ මෙවැනි අදහසකි.

"සාමාන්‍යයෙන් කෙනෙකුට සන්ධි අමාරු ඇතිවෙන්නේ වයස අවුරුදු 40 ඉක්ම වූ පසුවයි. මෙයින් කියන්නේ අඩු වයස් අයට සන්ධි රෝග ඇති නොවෙනවා කියල නෙවෙයි. ආමවාත කියන තත්ත්වයේදී උණත් සමග සන්ධි අමාරු ඇති වෙනවා. නමුත් එය සුලබ තත්ත්වයක් නෙවෙයි.
ඒ වගේම වැඩි වයස් පිරෙන විට ශරීරයේ බර වැඩි අයට සන්ධි රෝග ඇතිවීම බොහෝ විට සිදු වෙනවා. එයට හේතුව සාමාන්‍යයෙන් සිරුරක වැඩි බර දරන්නේ දණහිසයි. එදිනෙදා කරන වැඩත් සමග දණහිසේ ශක්ති ප්‍රමාණය වැය වෙලා ඇටමිදුලු දුර්වල වෙනවා. අස්ථි ගෙවෙනවා. මේ හේතුව නිසා අධික වේදනාවක්, ඉදිමීමක් දණහිස් ප්‍රදේශයේ ඇති වෙනවා.

ඒ වගේම දිගටම වැරදි ඉරියව් භාවිතය, වයසට යාම, ජීවිතයේ වැඩි කාලයක් කායිකව වෙහෙසී වැඩ කිරීම යන හේතු උඩ සන්ධි රෝග බහුලව ඇති වෙනවා. සන්ධි අමාරුව එන්න කලින් විළුඹෙහි වේදනාවක් ඇති වෙනවා. එය සන්ධි අමාරුවක ආරම්භක ලක්ෂණයක්. එහිදී වේදනාව වැඩි කකුලට අඩු බරක් දී එක් කකුලක් වැඩියෙන් ප්‍රයෝජනයට ගැනීම නිසා සමහර රෝගීන්ට පාද දෙකටම රෝගය ඇති වෙනවා.


අද බොහෝ කාන්තාවන්ට, පිරිමින්ට වඩා සන්ධි රෝග බහුලයි. අවුරුදු 35-40 වෙද්දි තෙල් ගාගෙන, ඉංග්‍රීසි පෙති බීගෙන ඔවුන් ඉන්නෙ. නැවෙන්න බෑ, හැරෙන්න පෙරළෙන්න බෑ, වාඩි වුණාම නැගිටින්න බෑ. ඉඳගන්න බෑ. හුඟක් ඖෂධ වේදනානාශක පමණයි. කාන්තාවන් නිතරම කය වෙහෙසවා ගෙදර දොර වැඩ කරන නිසා කාලයත් සමග ඔවුන් රෝගී තත්ත්වයට පත්වෙනවා. වත්මන් ආහාර රටාවත් සන්ධි රෝගවලට ප්‍රමුඛ වන්නක් බව කිය යුතුයි. විශේෂයෙන් වැරදි ඉරියව් හා අනතුරු නිසා අද කොන්දෙ අමාරු ඉතාම බහුලයි. මේවා සරලව සුළුවෙන් දකින්න එපා. තවත් දෙයක් රියදුරන්, බාස්වරුන්වගේ අයත් අද සන්ධි රෝගවල ප්‍රමුඛව සිටින පිරිසක්, වෛද්‍යවරයා පවසයි.

ගැට්ටුවාන සන්ධි වෙදකම අවස්ථා කීපයක් යටතේ සිදුවේ. ප්‍රතිකාර සඳහා එන ඇතැම් රෝගීන්ට දණහිස හා අනෙකුත් අස්ථි ඉදිමී නැවීමට දිගහැරීමට තබා ඇල්ලීමටවත් නොහැකි තත්ත්වයට වේදනාකාරීව ඉදිමී තිබේ. ඒ නිසා පළමු පියවරදී තෙල් බැඳ අස්ථි ලිහිල් කරයි. ඉන්පසු ප්‍රතිකාරයේ දෙවන පියවරට යයි. සන්ධි අමාරුවට බලපා ඇති හේතුව නම් එයටද මේ සමගම උදයජීව මහතා ප්‍රතිකාර කරයි. උදාහරණයක් ලෙස දණහිස් අමාරුවට ශරීරයේ ස්ථූලභාවය බලපා ඇත්නම් එයටද ප්‍රතිකාර සිදුවේ. රෝගයටත්, රෝගයේ හේතුවටත් අතුරු ඵලවලටත් ප්‍රතිකාර සිදුවන නිසා රෝගියාට නිට්ටාවට සුවයක් සහනයක් හිමිවේ. කිසිම අනතුරු ආබාධයක් නැත. තවද කෑෂ්ඨ රෝග, අම්ලපිත්ත, අර්ශස්, දියවැඩියාව, අධිරුධිර පීඩන, පක්ෂාඝාත වැනි සර්වාංග වෙදකම ද ඔහු සිදු කරයි.

උදයජීව මහතාගේ බිරිඳද පිළිගත් රජයේ රෝහලක වෛද්‍යවරියකි. එම නිසා වගකීමක් ඇති, වගවීමක් ඇති මුදලට යට නොවූ සැබෑ සිංහල පරම්පරා වෙදකමේ ආශ්චර්යය අත්දකින්නට ඔබට හොඳම අවස්ථාවක් ඇත. ප්‍රතිකාර ලබන පළමු අවස්ථාවේ සිටම ඕනෑම සන්ධි රෝගියකුට පැහැදිලි ගුණය දැනේ. අතුරු ආබාධ නැත. අදම තාවාකාලික තෙල් බේත් ගෑමට වේදනා නාශකවලට තිත තබමු. පැල් බැඳගෙන සුවයක් නොදී මුදල් ගරන තැන් වෙද මහත්තුරු නොවේ. ව්‍යාපාරය හා වෙදකම යනු දෙකකි. සැබෑ පරම්පරා වෙදකම ළඟට එන්න.
ගැට්ටුවානේ 'සන්ධි සුව වෙද අරණ' දෙකක් නැත. ඇත්තේ එකකි. එම නිසා එම නමම බලා නිවැරදි තැනට එන්න. මං මුළා වන්නට එපා.

**ස්ථිර සහනයක් සොයනවා නම් පමණක් කුරුණෑගල ගැට්ටුවානේ සන්ධි සුව වෙද අරණ වෙත එන්න. 037-2230667 හෝ 071-8341834 අංකයෙන් විමසන්න.**

සටහන ජේ. ඒ. සී. ශාන්ත කුමාර



මාධ්‍යවේදී
**තිලක් සේනාසිංහ**



# නිධානයක් ගොඩගන්න හාල්මැස්සො 25ක් බිල්ලට දීලා

බස්නාහිර පළාතත් වයඹ පළාතත් යා කෙරෙන මා ඔය අද්දර වනගතව පිහිටි උස් ගල් පර්වතයක රුපියල් කෝටි ප්‍රකෝටි ගණනක් වටිනා මහා ධන නිධානයක් ඇති බව මට මුලින්ම දැනගැනීමට ලැබුණේ ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය දේශපාලනඥයෙකුගෙනි. පසුගිය කාලයේ ඒ නිධානය සම්බන්ධ පුවත සීඝ්‍රයෙන් පැතිරගිය බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස පිට ප්‍රදේශවලින් පැමිණි විවිධ කණ්ඩායම් නිධානය ගොඩගැනීමට වෙර දැරූ බවත් ඔහු මා හා කීය. මෙම තත්ත්වය යටතේ ඒ ප්‍රදේශවාසීන් නිරන්තරයෙන් එම ඉසව්ව කෙරෙහි සැලකිල්ලෙන් පසුවන බවත් කිසියම් සැකකටයුතු පිරිසක් එම ප්‍රදේශයට පිවිසි සැනින් පොලිස් හදිසි ඇමතුම් අංකයට දුරකතන ඇමතුමක් දීමට පසුබට නොවන බවත් ඔහු කී අයුරු මට මතකය.

"පහුගිය දවසක අතන නිධානේ ගොඩගන්න පිටින් ආපු කට්ටියක් ලෑස්තිවෙලා. ඒ වෙලාවෙම ගමේ මිනිස්සු පොලිසියට දැනුම් දීලා පොලිසිය එනකොට උන් හොර පාරකින් පැනලා ගිහින්. නිධානය ගන්න පූජාව තියන්න ගෙනාපු පූජා බඩුයි ගල්කටු, ගල් ඉනි, වෙඩි නූල් වගේම ගල පුපුරවන්න ගෙනාපු ඩෙටනේටර් එකකුත් එතැන දාලයි පැනලා ගිහින් තියෙන්නේ. වැඩේ කියන්නේ ඒ කණ්ඩායමේ අවුරුදු විස්සක විතර ලස්සන කෙල්ලෙකුත් ඉඳලා තියෙනවා. උන් කෙල්ලට බොරුවක් කියලා ඒ නිධානේ ගන්න ඒ කෙල්ලව බිලිදෙන්න එක්ක යන්න ඇති කියලයි ගමේ මිනිස්සු කියන්නේ." ඔහු වැඩිදුරටත් කීය.

ඔහුගේ ඒ කතාව ඇසූ සැනින් මට සිහිපත් වූයේ ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් සූරීන් විසින් සම්භාව්‍ය සිනමා කෘතියක් ලෙස සිංහල සිනමාවට දායද කළ 'නිධානය' චිත්‍රපටයයි. සම්මානනීය ලේඛක පී.බී. සේනානායකයන් 1945 වසරේ ලියා පළකරන ලද තම ප්‍රථම සාහිත්‍ය කෘතිය වන 'දුප්පතුන් නැති ලෝකය' නම් කෙටි කතා සංග්‍රහයෙන් එන 'නිධානය' නම් කෙටිකතාව ඉහත සිනමා කෘතිය සඳහා පාදක වී තිබේ. එහි සඳහන් අන්දමට එහි කතා නායකයාට නිධානයක් ගොඩගැනීම පිණිස මූලික නිමිත්ත වන්නේ සත ගණනකට මිලට ගන්නා ලද 'නිදන් වදුල' නම් ලේඛනයකි. පසුව එහි සඳහන් අන්දමට මුහුණේ රටාවකට උපන් ලප තුනක් ඇති යුවතියක් බිලිදී එහි සඳහන් නිධානය ගැනීමට අදහස් කරන ඔහු පළමුව ඉතා අහම්බෙන් මුණගැසුනු එවැනි ලක්ෂණ සහිත අතිශය රූමතියක විවාහ කරගනියි. නමුදු අන් ධන නිධාන කෙසේවෙතත් ඇයම නිධානයක් බව හැඟෙන අන්දමට එම තරුණිය ඔහුට අතිශය සුවච කීකරු බිරිඳක් බවට පත්වෙයි. එහෙත් දිනෙන් දින උග්‍රවන ආර්ථික අර්බුදය හමුවේ එම නිධානය ගැනීම හැරුණුකොට අන් කිසිඳු විකල්පයක් නොමැති බව වටහාගන්න එහි කතා නායකයා ඒ නිදන් වදුලේ සඳහන් ක්‍රම අනුගමනය කරමින් එම නිධානය ඇතැයි පැවසෙන ගල් පර්වතය වෙත ගොස් බහිරවයාට බිලිදෙනු වස් ඇය පිහියකින් ඇන ඝාතනය කරයි. නමුදු එම නිදන් වදුලේ සඳහන් අන්දමට එවිට ඒ ගල දෙබෑවී නිධානය මතු නොවේ. ඉන් තම සුවච කීකරු බිරිඳත් නිධානයත් දෙකම අහිමිවීම නිසා හටගත් අධික චිත්ත පීඩාව දරාගත නොහැකිව කතා නායකයා සියදිවි නසාගැනීමෙන් නිධානය කෙටිකතාව නිමාවෙයි.

එම නිදන් වදුලු සම්බන්ධ වැඩිදුරටත් තොරතුරු හැදෑරීම පිණිස මම අනූව දශකයේ අග භාගයේ ජාතික කෞතුගාකාර පුස්තකාලයට ගොස් එහි ඇති නිදන් වදුලු පිටපත් කිහිපයක් පරීක්ෂා කළෙමි. ඒ එවක ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ පදවිය හෙබවූ ආචාර්ය සිරිනිමල් ලක්දුසිංහයන්ගේ අවසරය හා අනුග්‍රහය මතය. නමුත් එමගින් වටහාගත හැකිවූයේ එම නිදන් වදුලු යනු අප රටේ අතීතයේ සිටි රජවරුන්ගේ නම් සහ දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි පර්වත ලක්ෂණයන් එකිනෙකට සම්බන්ධ කරමින් ලියැවුණු සාවද්‍ය ලේඛනයන් බවය.

"මම මෙතන වැඩට ඇවිත් දැන් අවුරුදු තිහක් විතර වෙනවා. ඒ කාලේ ඉඳලම ඔය නිදන් වදුලු ගැන හොයන්න, ඒවයේ තියෙන විස්තර අහන්න නොයෙක් තරාතිරම්වල අය මෙහාට එනවා. මුලදි මම ඕවයේ තියෙන්නේ පට්ටපල් බොරු, ඒවා ඒ කාලේ හිටපු කපටි මිනිස්සු ඒ කාලේ හිටපු සල්ලි තියෙන මිනිස්සුන්ට බර ගණන්වලට විකුණන්න බොරු ගොතලා ලියපු පුස්කොළ පොත් කියලා ඒ හැමෝටම කිව්වා. නමුත් ඒ කිසිම කෙනෙක් ඒවා විශ්වාස කළේ නෑ. සමහරු හිතුවේ මම ඒවා නොකියන්නේ කවදහරි ඒ නිදන් වදුලු බලලා නිදන් ගොඩ දමන්න හිතාගෙන ඉන්න නිසා කියලා. ඒ අතරේ සමහරු මගේ කනට කරලා නිදන් ගොඩගත්තම මාවත් අමතක කරන්නේ නෑ කියලත් කියලා තියෙනවා." ආචාර්ය ලක්දුසිංහ සිනාසෙමින් කීය.

**සමහරු හිතුවේ මම ඒවා නොකියන්නේ කවදාහරි ඒ නිදන් ගොඩ දාන්න බලාගෙන ඉන්න නිසා කියලා. ඒ අතරේ සමහරු මගේ කනට කරලා කියනවා නිදන් ගොඩගත්තම මාවත් අමතක කරන්නේ නෑ කියලා**

"එතකොට මම ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ. ඔන්න දවසක් අපේ රටේ ප්‍රසිද්ධ දේශපාලනඥයෙක් මගේ ළඟට ඇවිත් ඔය නිදන් වදුලක තිබුණය කියන විස්තරයක් මට කියනවා. මිනිහටත් කවුරු හරි කියපු දෙයක්. අහවල් තැන නම් කෝටි ගාණක නිධානයක් තියෙනවලු. හැබැයි ඒක ගන්න නම් විසිපහකගේ බෙලි කඩලා ඒ ගල උඩට දාලා බහිරව පූජාවක් කරන්න ඕනෙලු. ඒත් කොහොමද ඒ වගේ දෙයක් කරන්නේ? කියලා මිහිහා මට කිව්වා." ආචාර්ය ලක්දුසිංහයන් යළි කීය.

"එතකොට මම ඇහුවා එතකොට ඔය බෙලි කඩන්න කියලා තියෙන්නේ කාගෙද? මිනිස්සුන්ගෙද? කියලා. එතකොට ඒ හාදයා ටිකක් කල්පනා කරලා නෑ එහෙමම නෑ මගේ හිතේ කියලා කිව්වා. එතකොට මම කිව්වා ඉතින් ඕක බොහොම පහසුවෙන් කරන්න පුළුවන් වැඩක්නේ කියලා. එතකොට මේ මනුස්සයා පුදුම වෙලා වගේ මගේ දිහා බලාගෙන හිටියා. එතකොට මම කිව්වා වෙන මුකුත් ඕනේ නැහැ වේලිච්ච හාල්මැස්සෝ මුලක් අරගෙන ඔය ගල උඩට ගිහින් එක එක හාල්මැස්සාගේ ඔලුව කඩ කඩා ගල උඩට දාන්නකෝ. එතකොට නිධාන නැතත් හාල්මැස්සෝ ටික හරි තියෙනවනේ කියලා. එතකොටම එකපාරට මූණ කළු කරගත්තු උන්නැහේ ටික වෙලාවක් කල්පනා කර කර ඉඳලා නැගිටලා ගියා ගියාමයි කටුගේ පැත්ත පළාතේ ආවේ නෑ." ආචාර්ය සිරිනිමල් ලක්දුසිංහ කීය.

එහෙත් 1943 වසරේ පී.බී. සේනානායකයන් දුටු නිදන් වදුලුවල ඇති ප්‍රෝඩාකාරී බව ඉන් වසර අසූවක් ඉක්ම ගොස් ඇතත් අදත් එලෙසින්ම පැවතීම ජාතික ඛේදවාචකයකි.

# ඇටකටු හිරිවැටෙන හීතලේ මමත් පැය ගණන් පාරේ හිටියා



"සර්, ඇයි හඳුන්කූරු ගත්තේ?" අසල සිටින පිරිමි දරුවෙකුගෙන් හඳුන්කූරු මිලදීගත් ඇලන්ගෙන් ජසින්තා ඇහුවා.

"පන්සල් යන්න පුළුවන්නේ" ඇලන් හිනාවෙලා කියද්දී ජසින්තා පුදුමයට පත්වුණා.

"සර් පන්සලුත් යනවද?" ඇලන් ක්‍රිස්තියානි පුද්ගලයෙක් නිසා ඔහු පන්සලට යනවා යැයි කීම ජසින්තාගේ පුදුමයට හේතු වුණා.

"ඔව්. පල්ලියේ හඳුන්කූරු පත්තු කරන්න බැහැනේ." ඇලන් කියද්දී ජසින්තා ඔහු දිහා බලාගෙන හිටියේ අගක් මුලක් වටහාගන්න බැරුව.

ඇලන් හඳුන්කූරු මිලදී ගත්තේ පන්සල් යන්නද, පන්සල් යන්නේ හඳුන්කූරු පත්තු කරන්නද කියලා හිතාගන්න බැරිවුණු ජසින්තා නිහඬ වුණා.

ඇලන් කියන්නේ විදේශීය බහුජාතික සමාගමක ආරම්භකයා. ඔහු ලංකාවට ආවේ ලංකාවේ එහි ශාඛාවක් විවෘත කරන්න. ලංකාවට ආපු ඔහුට රටතොට පෙන්වන්න, අවශ්‍ය පහසුකම් සලසන්න ඉදිරිපත් වුණු ආයතනය ඒ වෙනුවෙන් එව්ව සේවක පිරිස අතර හිටිය කෙනෙක් තමයි ජසින්තා. ඇලන් බොහොම මිත්‍රශීලී පුද්ගලයෙක් නිසා ඔහු ජසින්තා සහ සෙසු පිරිස එක්ක හරි ඉක්මනින් මිත්‍ර වුණා.

"සර්, දෙහි මල්ලක් ගන්න සීයයි. සීයයි." තරුණයෙක් ඔවුන් දිහා බලලා කෑ ගහද්දි ඇලන් දෙහි මල්ලක් මිලට ගත්තා.

"මේ මනුස්සයට පිස්සුද කොහෙද? හඳුන්කූරු, දෙහි මොකටද ඇලන් සර්ට? යාගයක්වත් කරන්න යනවද දන්නේ නැහැ." ජසින්තා වෙත නැඹුරු වුණු තවත් සේවකයෙක් හිනාවෙන ගමන්ම රහසින් කිව්වා.

"සල්ලි වැඩි නිසා වෙන්න ඇති." ජසින්තා ඊට පිළිතුරු දුන්නෙත් රහසින්.

"සල්ලි වැඩි නම් අපිට දුන්නා නම් හරිනේ."

පිරිස අතරේ කසුකුසුවක් නැගුණා.

බහුජාතික සමාගමේ ශාඛාව විවෘත වෙන දිනයේදී ඇලන්ව මාධ්‍යවේදීන් විසින් වට කරගත්තා. ඔවුන් අහන හැම ප්‍රශ්නෙකටම ඇලන් බොහොම සතුටින් උත්තර දුන්නා.

"සර්, අපේ රටේ තරුණ පරම්පරාවට දෙන්න පණිවිඩයක් සර් ගාව නැද්ද?" අවසන් ප්‍රශ්නය නැගුණා.

"ඔව්. තියෙනවා. මම මේ රටේ තරුණ පරම්පරාව ගැන බොහොම ආඩම්බර වෙනවා. මට මේ රටේදී මුණගැහුනා හඳුන්කූරු විකුණන තරුණයෙක්ව. ඒ වගේම දෙහි විකුණන තරුණයෙක්ව. මට කියන්න ඕනේ මම ඒ දෙන්නා ගැන බොහොම ආඩම්බර වෙනවා කියලා. දන්නවද? මට ඒ මිනිස්සු අතරින් පෙනෙන්නේ මාව. මම හරිම කැමතියි පුංචි හෝ බිස්නස් එකක් කරන අයට. මගේ සමාගමේ ශාඛාවල් විවෘත කරන්න ගිය සමහර රටවල්වල ගොඩක් මිනිස්සු බලාගෙන ඉන්නේ කාගෙන් හරි දෙයක් නිකන් ඉල්ලාගන්න. හැබැයි මේ විදියට මහන්සි වෙලා, පොඩි බිස්නස් එකක් කරලා හම්බ කරන මුදල් රන්වලට සමානයි. මම මේ වගේ තැනකට ආවේ නිකන් නෙවෙයි. බොහොම මහන්සියෙන්, උනන්දුවෙන් වැඩ කරලා. ඒ දවස්වල මට මතකයි ඇටකටු හිරිවැටෙන හීතලේ මමත් පාරේ පැය ගණන් ගත කළා මගේ බිස්නස් එක ගොඩදාගන්න. ඉතින් අර හඳුන්කූරු විකුණපු දරුවාගෙන්, දෙහි මලු උස්සන් ගිහින් විකුණන තරුණයාගෙන් මට පේන්නේ මාව. ඒ මිනිස්සුන්ට ලොකු ආත්ම අභිමානයක් තියෙනවා. මගේ ආශිර්වාදය ඔයාලට තියෙනවා. ස්ව උත්සාහයෙන් නැගිටින්න. ඒ වගේම ස්ව උත්සාහයෙන් නැගිටින්න හදන තවත් අයට අත දෙන්න. ඒ ආඩම්බරය ඔබ මැරෙන තුරාවටම ඔබේ හිතේ පවතීවි."

ඇලන් අන්තිමට දීපු උත්තරයෙන් ජසින්තාගේ සහ අනෙකුත් සේවක පිරිසගේ ගැටලුවලටත් පිළිතුර ලැබුණා.

■ සමාධි ඩයස්

පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා හෝ ප්‍රාථමික
අධ්‍යාපන ගුරු පුහුණු පාඨමාලාව
නොමිලේ හැදෑරීමට
ශිෂ්‍යත්ව හා අර්ධ ශිෂ්‍යත්ව 100ක් පිරිනැමේ
වයස අවුරුදු 16 වැඩි (අ.පො.ස.) සා.පෙළ දක්වා උගත් තරුණියන්ට අයදුම් කල හැක.
පාඨමාලා සම්පූර්ණ කිරීමෙන් පසු, පෙර පාසල්, ප්‍රාථමික, ජ්‍යාතන්තර පාසල් සඳහා රැකියා ලබා දීමට කටයුතු පිළියෙල කර දෙනු ලැබේ. ඔබට නවතම පෙර පාසලක් ආරම්භ කිරීමට මඟ පෙන්වනු ලැබේ.
(දෙස් විදෙස් පිළිගත් ඩිප්ලෝමා සහතිකයක් ද පිරිනැමේ.)
විස්තර හා අයදුම්පත ලබා ගැනීම සඳහා
මෙහි ඇති WhatsApp 077 4736239 අංකයට ඔබගේ නම සහ ලිපිනය එවන්න.
නැතහොත් නම සහ ලිපිනය ලියූ රු.110/- මුද්දරයක් ඇලවූ දිග ලියුම් කවරයක් එවන්න.
ලිපිනය : ශිෂ්‍යත්ව වැඩසටහන් අංශය,
කර්මාන්ත හා වෘත්තිය පුහුණු මූලස්ථානය, පුෂ්පාරාම පාර, පහළ බියන්විල, තැ.පෙ. 02 කඩවත.
කොළඹ නුවර පාරේ 09 වෙනි සැතපුම් කණුව අසලින් 600m පමණ දුරින් (පුෂ්පාරාම පන්සල අසල)
0115 727448 / 0114 578492 / 077 4736239 / 071 2508179

AUTOWHEEL
පවුලේ අවන්හල දැන් විවෘතයි
ශ්‍රී ලාංකීය දිවා ආහාර දැන් ලබාගත හැක
සජීවී සංගීතය සමඟින්
ෆ්‍රයිඩ් රයිස - සඳුදා
රයිස් ඇන්ඩ් කරි - අඟහරුවාදා
කහ බත් - බදාදා
රයිස් ඇන්ඩ් කරි - බ්‍රහස්පතින්දා
බිරියානි - සිකුරාදා
එකක මිල රු.455/=
AA CEYLON Estd. 1904
ලංකා ඔටෝමොබයිල් සංගමය
40, ශ්‍රීමත් මාකන් මාකර් මාවත, කොළඹ 03.
විමසීම්: 077 - 4369013 ( ක්‍රිෂෝන් )



# ලංකාව වටේම ඉන්න බව් යාළුවෝ කොණ්ඩේ කපන්න එන්නේ මගේ ළඟට

## උමේෂා හංෂනී

Dog health and grooming spa



මිනිස්සුන්ගෙයි බල්ලන්ගෙයි සම්බන්ධෙ අදක ඊයෙක පටන්ගත්තු එකක් නෙවෙයිනේ. ඒක අවුරුදු 40,000කට වඩා පරණ එකක් කියලා තමයි කියන්නේ. මිනිස්සු මුලින්ම බල්ලව හීලෑ කරගත්තේ දඩයමට උදව් ගන්නලු. පස්සේ කාලෙකදි තමයි මෙයාලව ගෙවල්වල සුරතලුන් විදියට හදන්න පටන් අරන් තියෙන්නේ. පුරාණ ඊජිප්තුවරු නම් බල්ලන්ට සැළකුවේ දරුවන්ට වගේලු. එයාලා හැමදාම තමන්ගේ බලු සුරතලුන්ව නාවලා, සුවඳ ගාලා, ආභරණ පළඳලා එහෙම තමයි තියාගෙන ඉඳලා තියෙන්නේ. සුරතලෙක්ව ඔය විදියට පිරිසුදුවට, ලස්සනට, පිළිවෙලට තියාගෙන ඉන්න එකට අපි කියන්නේ ඩෝග් ගෲමින්ග් (Dog Grooming) කියලා.

ඔය කිව්ව ඩෝග් ගෲමින්ග් ගැනත් මුලින්ම සඳහන් වෙන්නේ ඊජිප්තුවෙන්. පළවැනි එළිසබෙත් රැජිනගේ ඡායාරූපවල කොණ්ඩ කපලා ලස්සන ඇඳුම් ඇඳපු හුරුබුහුටි බව්වෝ ඇයත් එක්ක ඉන්නවා. හැබැයි වෘත්තීය මට්ටමින් ඩෝග් ගෲමින්ග් වැඩේ ආරම්භ වෙලා තියෙන්නේ වැඩවසම් කාලේ. ඒ කාලේ වතු හිමියන්ගේ සුනඛයින්ගේ දත් මද්දන්න, කොණ්ඩ කපලා නාවන්න වෙනම පිරිසක් පත්කරලා තිබුණාලු. පස්සේ කාලෙකදි ඒ කියන්නේ 1940 ගණන්වලදි යුරෝපය පුරා මේ බලු සැලෝන් ව්‍යප්ත වෙලා. දැන් ඉතින් ඒ රටවල බලු සැලෝන් කරන අයට ඉහළ පිළිගැනීමක් තියනවා. අනික ඒ අය ඒ වැඩෙන් විශාල මුදලක් හම්බකරනවා.

අන්න ඒ විදියට ලංකාවේත් බව් සැලෝන් එකක් දාපු තරුණියක් අපිට මුණගැහුණා. ඇය තමයි ලංකාවේ පළවැනි බව් සැලෝන් එකේ නිර්මාතෘවරිය. උමේෂා හංෂනී. නොලී, නෝවා පුංචි ෂී-ට්සුලා දෙන්නත් එක්ක අද 'ධරණී' කවරය හැඩ කරන්නේ ඇයයි.

**ලංකාවේ උදවියට මේක අලුත් කන්සෙප්ට් එකක්නේ. ඉතින් කට්ටිය මොකද කියන්නේ?**

"ලංකාවේ කොහෙවත් මේ වගේ සැලෝන් එකක් නැහැ. ඉතින් බව්වන්ට ඇත්තටම ආදරේ කරන අයට හරි සතුටුයි. රත්නපුර, ගාල්ල, බදුල්ල වගේ දුර පළාත්වල අය කොළඹ ඇවිල්ලා නතර වෙලා මගේ සැලෝන් එකට එනවා. 'බල්ලන්ට මොන සැලෝන්ද අනේ ඕවා හරියන වැඩ නෙමේ' කියලා කියන අයත් ඒ අතර නැතුවම නෙවෙයි."

හැබැයි ඒ සුළුතරේට වඩා ලොකු පාරිභෝගික පිරිසක් ඉන්න බව තමැයි උමේෂා අපිට කිව්වේ. ලංකාවේ ප්‍රකට ව්‍යාවසායකයෝ, රංගන ශිල්පියෝ වගේම විදේශිකයන් පවා අද වෙනකොට උමේෂගේ සේවය ලබාගන්නවා. හැබැයි ඉතින් මෙහෙම සාර්ථක ගමනක් ඇවිල්ලා හිටියට උමේෂාගේ ආපු ගමන් මග එච්චරම සුන්දර නැහැ. ඒ නිසා අපි ඒ කතාවෙන්ම පටන්ගමු.

"මම බොරලැස්ගමුවේ. ගෙදර ඉන්නේ අම්මයි, තාත්තයි, නංගිලා දෙන්නයි, මල්ලියි. මම ඉගෙනගත්තේ කැස්බෑව ආටිගල බාලිකාවෙන්. පුංචි කාලේ ඉඳලා සත්තුන්ට හරිම ආසයි. ගෙදර අපිරිසිදු වෙයි කියලා තාත්තා බල්ලෙක් හදන්න කැමති වුණේ නැහැ. උසස් පෙළ කරලා ගෙදර ඉන්න කාලේ මම ගෙදරින් අරන් දීපු රත්තරන් මාලේ විකුණලා හොරෙන්ම ජර්මන්-ෂෙපර්ඩ් බව්වෙක් ගත්තා. එයා 'රූබි'. මම කරපු වැඩේට තාත්තට හොඳටම තරහ ගියා. ඉතින් තාත්තා මට ගෙදරින් යන්න කියලා කිව්වා. පස්සේ මම මාස තුනක් විතර බව්වත් එක්කලා ආච්චිලාගේ ගෙදර හිටියා. පස්සේ ඉතින් තාත්තා ඇවිල්ලා මාව ගෙදර එක්කරගෙන ගියා."

රූබිව බලාගන්න සල්ලි ඕනා නිසා උමේෂා පෞද්ගලික ආයතනයක රැකියාවක් කරන්න ගත්තලු.

**"ජොබ් එකෙන් ලැබෙන හැම සතේම වියදම් කළේ රූබිට. ඔය අතරේ රජයේ රැකියාවක් කරන්න කියලා තාත්තා මට කිව්වා. ඒ කීමට මම රජයේ රස්සාවක් කරන්න ගත්තා. ඒ කාලේ මම තව අසනීප ලැබ්රඩෝර් බව්වෙක් ගෙනාවා. එයා 'සින්ඩි'. රූබියි, සින්ඩියි නිසා සතුටෙන් හිටියට මොකද රස්සාව පැත්තෙන් මට ලොකු පීඩනයක් තිබුණා. අනික මට කවදත් ඕනා වුණේ මගේම දෙයක් කරන්න."**

ඒ සිතුවිල්ල නිසාම උමේෂා රැකියාවෙන් ඉවත් වෙලා රැකියාවෙන් එකතු කරගනිපු මුදලෙන් රූපලාවණ්‍ය පාඨමාලාවක් හැදෑරුවලු.

"කෝස් එක ඉවර වෙලා කොළඹ සැලෝන් එකක පුහුණුවෙන කෙනෙක් විදියට වැඩ කළා. පස්සේ 2019දී මගේම ලේඩීස් සැලෝන් එකක් දාගත්තා. කාලයක් සැලෝන් එක හොඳට කළා. ඒත් කොවිඩ් ආවට පස්සේ සැලෝන් එක වහන්න වුණා. මගේ අතේ තිබුණු හැම සතේම දාලයි මම සැලෝන් එක පටන්ගත්තේ. ඉතින් සැලෝන් එක වැහුණාම මම සෑහෙන්න මානසිකව වැටුණා."

එහෙම වැටුණායි කියලා උමේෂා වැඩේ අතඇරලා නැහැ. ලොක්ඩවුන් කාලේ උමේෂා තවත් අලුත් වැඩක් පටන් අරන්.

"ලොක්ඩවුන් කාලේ කට්ටියට ඩෝග්ෆුඩ් (සුනඛයන්ට ලබාදෙන කෑම) ගන්න හරි විදියක් තිබුණේ නැහැ. මොකද ඒ කාලේ සේරම කඩ වැහුවනේ. ඉතින් ගෙවල්වලට ඩෝග්ෆුඩ් ඩිලිවරි කරන්න කියලා යාළුවෙක් මට අදහසක් දුන්නා. පස්සේ මම පේජ් එකක් හදලා ගෙවල්වලට ඩෝග්ෆුඩ් ඩිලිවරි කළා. ඒත් සැලෝන් එක වැහුණු පීඩනය අඩුවුණේ නැහැ. ඒ පීඩනය නැති කරගන්න මම පුංචි ෂි-ට්සු පැටික්කියක් ගත්තා. එයාගේ නම

'නොලී'. නොලීයි මමයි හරියට අම්මයි දුවයි වගේ. මම යන යන තැන එයාව අරගෙන ගියා. ඇඳුම් මහලා ඇන්දුවා. දවසක් මම නොලීගේ කොණ්ඩේ කපන්න ඩෝග් සැලෝන් එකක් හෙව්වා. ලංකාවේ ඩෝග් ගෘමින්ග් සැලෝන් නැහැ කියලා මම දැනගත්තේ එතකොට. පස්සේ මංම නොලීගේ කොණ්ඩේ කපන්න පටන්ගත්තා. නොලීගේ කට් දැකලා ඒවා මම කළේ කියලා අහලා කට්ටිය පුදුම වුණා. ඉතින් ටික දවසකින් මම දන්න අඳුනන අයගේ බව්වන්ටත් නිකන් කපලා දුන්නා."

උමේෂාගේ බව් කට් වල තිබුණේ පළපුරුදු අතක හැඩයලු. ඉතින් ඩෝග් ගෘමින් සැලෝන් එකක් පටන්ගන්න ඕනේ කියන අදහස ආවේ ඊටපස්සෙලු.

"මුලදි මට සැලෝන් එක පටන්ගන්න තැනක් තිබුණේ නැහැ. ඩෝග් ෆුඩ් විකුණලා ලැබුණු මුදලෙන් වැඩේට අවශ්‍යම උපකරණ ටික මිලට ගත්තා. පස්සේ මම පටන්ගත්තු ඩෝග් ෆුඩ් පේජ් එකේ මෙහෙම දෙයක් පටන්ගන්න යනවා කියලා පෝස්ට් එකක් දැම්මා. පොස්ට් එක දැම්මා විතරයි කට්ටිය පෝලිමට එපොයිමන්ට් දැම්මා. සැලෝන් එක කරන්න තැනක්වත් නැතිව මම මාස තුනක එපොයිමන්ට් ගත්තා. ඒවා පස්සේ කැන්සල් වෙයිද කියන අවදානම පවා තිබුණා. ඒවා ගැන නොහිතා මම තැනක් රෙන්ට් එකට අරගෙන වැඩේ පටන්ගත්තා. ඒ 2020දි."

බව් සැලෝන් එකක් පටන්ගන්න එකට උමේෂාගේ ගෙදර අයගෙන් ලොකු කැමැත්තක් තිබුණෙත් නැතිලු.

**"අම්මයි, තාත්තයි නම් කැමති වුණේ නැහැ. 'ඕවා හරියන වැඩෙ නෙමෙයි' කියලා තව ගොඩක් අය කිව්වා. ඒත් ඉස්සරහට තියපු අඩිය පිටිපස්සට නොතියා මම මගේ වැඩේ කළා. හැබැයි අද ඒ දෙන්නම මගේ ගැන ගොඩක් ආඩම්බරයි."**

මුලින්ම හැකියාවෙන් වැඩේ පටන්ගත්තට පස්සේ ඇය ඩෝග් ගෘමින් පාඨමාලාවක් හැදෑරුවලු.

"ලංකාවේ මේ කන්සෙප්ට් එක නැති නිසා මෙහේ ඩෝග් ගෘමින් ඉගෙනගන්න පාඨමාලා නැහැ. ඒ නිසා ඔන්ලයින් පාඨමාලාවක් හැදෑරුවා. සමාජ මාධ්‍ය හරහා වෙනත් රටවල පළපුරුදු ගෘමර්ස්ලාව අඳුනගත්තා. ඒ අයගෙනුත් මට ලොකු සහයෝගයක් ලැබෙනවා."

වැඩේ පටන්ගත්තු විදිය ගැන කතා කළාට පස්සේ ගෘමින්ග් කියන්නේ මොකක්ද කියලා අපි උමේෂගෙන් ඇහුවේ ඒ ගැන අපේ උදවියට තියෙන දැනුවත්භාවය අඩු නිසයි.

"ගෘමින්ග් වර්ග දෙකක් තියෙනවා. එකක් තමයි ඩෝග් ශෝවලට ඉන්න අයට කරන ගෘමින්. කට්ටිය ඩෝග් ෂෝවල දැකලා ඇති අර අමුතු අමුතු කට් කපපු බව්වෝ ඉන්නේ. අනික ගෙදර හුරතලේට ඉන්න බව්වන්ට කරන අයට කරන ගෘමින්ග්. ගෘමින්ග් එකක් කියන්නේ බව් කට් එකක් කපන එකට විතරක්ම නෙමේ. මම මෙහෙම කියන්නම්කෝ. අපේ ළඟට බව්වෙක් ගෙනාවට පස්සේ එයාලව නාවලා, ෂැම්පු, කන්ඩිෂනර් කරනවා. පස්සේ මවිල් පීරලා එයාලට කට් දනවා. ලොම් ගොඩක් තියෙන කෙනෙක්ට කට් එකක් දන එක හොඳයි. ලෝම නිසා එයාලගේ ඇස්වලට හානිවෙන්න පුළුවන්. ඒ වගේම රස්නේ කාලෙට එයාලට ඒක සනීපයි. මිනිස්සුන්ට කට් කපනකොට හැමෝටම එකම කට් එක කපන්නේ නැහැනේ. ඒ වගේ එක එක්කෙනාගේ මූණේ හැඩයට, ප්‍රමාණයට ගැළපෙන විදියට කට් එක දන්න ඕනේ. ඊට අමතරව නියපොතු කපලා, කන් පිරිසිදු කරලා, බ්ලෝ ඩ්‍රයර් කරනවා. අර කිව්වා වගේ මේකෙන් වෙන්නේ ලස්සන කරන එකම නෙමේ මිනිස්සු මේන්ටේන් වෙනවා වගේම බව්වන්වත් හරියට මේන්ටේන් කළාම ඒ අයව නිසි සෞඛ්‍ය තත්ත්වයෙන් තියාගන්න ලේසියි.





පිටරටවල අය බය නැතිව බල්ලන්ව ඇඳ, පුටු උඩ තියාගන්නවා. මොකද ඒ අය අනිවාර්යයෙන්ම බව්වන්ව ගෘම් කරනවා. ඒ නිසා ඒ රටවල බල්ලොත් මිනිස්සු ගාණටම පිරිසිදුයි."

ඔය කිව්ව වැඩවලට අමතරව ඊෂ් ට්‍රීට්මන්ට්, බල්ලන්ගේ බූල් වර්ණගැන්වීම, මවිල් නැති අයට මවිල් සත්කාර, මවිල් ශයින් කරන සත්කාර ඇතුළු බලු සත්කාර පිරුණු අපූරු සැලෝන් එකක් මේක.

"ගෘම් කරන්න ඕනේ දිග මවිල් තියෙන අයව විතරයි කියලා සමහරු හිතනවා. ඒක වැරදි. කොට මවිල් තියෙන අයටත් මේක කරන්න ඕනේ. ෂි-ට්සු, ගෝල්ඩන් රිට්‍රීවර්, ටෙරියර්, පග්, ලැබ්රඩෝර් වර්ගවල නිතරම එනවා. පාරවල්වලින් හදාගන්න ගත්තු සාමාන්‍ය බව්වන්ව ගෘමින්ග් කරන අයත් ඉන්නවා. මම නම් වැඩිපුරම රෙස්පෙක්ට් කරන්නෙ ඒ අයට. මොකද මනුස්සයෙක් ෂි-ට්සු කෙනෙක් ගෘම් කරන්නේ එයාව ඒ විදියට තියාගන්න ඕන නිසා. පාරෙන් ගේන සතෙක් ගෘම් කරනවා කියන්නෙම ඒ කෙනා ඒක කරන්නෙම සතාට තියෙන ආදරේ නිසානේ. ඒ නිසා ඒ අයට ගරු කිරීමක් විදියට මම ඩිස්කවුන්ට් පවා දෙනවා."

බව්වෝ විතරක් නෙමේ හාවෝ, ගිනිපිග්ලා, පූස් යාළුවෝ එහෙමත් මේ සැලෝන් එකට ඇවිල්ලා හැඩවැඩ වෙලා යනවලු. හරියට බැලුවොත් සතෙක්ට මේ ගෘමින් වැඩේ මාසයක් ගානේ කරන්න ඕනා කියලයි උමේෂා කිව්වේ.

"මාසෙන් මාසෙට එන අයත් ඉන්නවා. මිනිස්සුන්ට පාවිච්චි කරන කිසිම දෙයක් බව්වන්ට පාවිච්චි කරන්න බැහැ. කලර් කරන්න වුණත් එයාලටම හදපු කලරින් තියෙනවා. අනික ගෘමින් එකක් කරාපුවහම එයාලට හරි සනීපයි. එදා දවසේ රෑට ඉතින් බව්වන්ට සැපට නින්ද යනවා.

ගෘමින් එක කළායින් පස්සේ අහිංසක තාලෙට නිදාගත්තට මොකෝ ගෘමින් එක අතරතුරේ උමේෂට තග දන වස හාදයොත් නැතිව නෙමේලු.

"සාමාන්‍යයෙන් එක ගෘමින් එකක් කරන්න පැය 3/4ක් යනවා. ඒ නිසා මම දවසටම බාරගන්නේ වැඩ 4යි. මුලින්ම කස්ටර්මර්ගෙන් බව්වගේ සොබාවය ගැන අහනවා. ඒ අහලා ආපු හැටියේ නාවන්න යන්නේ නැහැ. මුලින්ම එයාව ටිකක් යාළු කරගන්න ඕනේ. එකපාර යාළුවෙන්නේ නැති අයත් ඉන්නවා. එකපාරක් බව් යාළුවෙක් මගේ ඇඟිල්ල පණ නැතිවෙන්න හැපුවා. එහෙමයි කියලා මම වැඩේ නතර කළේ නැහැ. කොහොමහරි එයාට කට් එක්ක දැම්මා. සමහරු නම් ආදරේටත් හපනවා. දැන් මගේ මේ අත් දෙක පුරාම දත් පාරවල් තියෙනවා."

උමේෂා ඒ කතාව කිව්වේ තරහකින් එහෙම නම් නෙමෙයි. ඇතැම් පශු වෛද්‍ය රෝහල්වල බව්වන්ව සිහි නැති කරලා ඒ අයගේ කන් සුද්ද කරලා නියපොතු කපන වැඩේ කරනවා. ඒ වැඩේ බරපතළකම ගැනත් උමේෂා අපිට පැහැදිලි කළා.

**"බව්වට සිහි නැති කරලා නියපොතු ටික කපලා කන සුද්ද කරලා ඩෝග් ගෘමින් කියනවා. ඒක හරිම වැරදි වැඩක්. සතෙක්ව සිහි නැති කරනවා කියන්නේ සෙල්ලම් වැඩක් නෙමේ. සතාට ආයේ සිහි එන්නේ නැතිවෙන්නත් පුළුවන්. ගෘමින් කරන්න ගිහින් සතාව නැති කරගත්තු උදවිය මට මුණගැහිලා තියෙනවා. අවශ්‍යම ප්‍රතිකාරයකට ඇර මේ වගේ දේකට කිසිම සතෙක්ව සිහි නැති කරන්න ඉඩ දෙන්න එපා. ඒක මගේ ඉල්ලීමක්."**

අපේ ලිපිය කියවන අයගෙන් ඇය ඒ විදියේ ඉල්ලීමක් කළා. ඒ අතුරතුරේ ඇය අපේ හිත කම්පා වෙන දෙයක් කිව්වේ කඳුළු පිහිදන ගමන්.

"මට අද මේ තැන ඉන්නේ මගේ නොලී නිසා. මේ වැඩේ පටන්ගත්තේ එයා නිසා. ගිය අවුරුද්දේ නොලී නැති වුණා. ඉතින් නොලී වෙනුවෙන් මම දැන් සෑහෙන පිං වැඩ කරනවා. නොලීව මතක් වෙන්න තව ෂි-ට්සුලා දෙන්නෙක් ගෙනාවා. එතැන එක්කෙනෙක්ටත් නොලී කියලා නම තිබ්බා. හැබැයි ඒ මොනා කළත් කවදාවත් නොලී නැති අඩුව මකන්න බැහැ."

උමේෂා නොලී ගැන කියද්දි අපේ හිත්වලටත් ලොකු සංවේගයක් දැනුණේ සත්තු කියලා වෙන් නොකර ඇය සත්තුන්ට දක්වන ආදරය නිසයි.

**"කතා කරන්න බැරි වුණත් හැම සතෙක්ටම හොඳට දේවල් තේරෙනවා. ඒ නිසා කිසිම සතෙක්ට කවදාවත් දුකක් දෙන්න එපා. ගෙදර ඉන්න සතාට ආදරේ කරන ගමන් පාරේ ඉන්න කෙනාට පයින් ගහන්න එපා. ඒ හිත්වලටත් ඒ දුක දැනෙනවා. ඊගාව දේ නඩත්තු කරන්න බැරි නම් ලොකු බ්‍රීඩ්වල අයව ගන්න එපා. නඩත්තු කරන්න බැරිවෙලා ඒ සතා අසනීප වුණාම එයාව පාරට ගිහින් දන එක දැන් අපේ මිනිස්සුන්ගේ පුරුද්දක්."**

උමේෂා ඒ ඉල්ලීම කළේ හදවතින්. අද උමේෂා වෘත්තිය පැත්තෙන් සාර්ථක කාන්තාවක්. ඉතින් තරුණ ගැහැනු දරුවන් වෙනුවෙනුත් ඇය වචනයක් කිව්වා.

"දැන් මම බව්වෝ 1000කට වඩා ගෘම් කරලා තියෙනවා. ඉතින් අද වෙනකොට මාසෙකට සැලකිය යුතු මුදලක් හොයනවා. දැන් මාස හයකට කලින් සැලෝන් එක ගෙදරට ගෙනාවා. මම මේ වෘත්තියට ගොඩක් ආදරෙයි. අනිත් අයටත් කියන්නේ කිසිම දෙයක් නෑ... බෑ කියලා හිතන්න එපා. ඕනම කෙනෙක්ට ඕනම දෙයක් පුළුවන් කියන එකයි මගේ නම් විශ්වාසය."

**■ සෙව්වන්දි හෙට්ටිආරච්චි**

**ඡායාරූප - ක්‍රිෂාන් කාරියවසම්**


**වර්තමාන සමාජ ව්‍යසනයෙන් දරුවන් බේරා ගනිමු**

(නොමග යාමට පෙර)

අ.පො.ස. සාමාන්‍ය පෙළ, ලිවීමෙන් පසු දරුවාගේ ශික්ෂණය කර ගැනීමට, හැදියාව ගොඩනගන්න, පාසල් ජීවිතය හමාර වීම සමග මුදල් ඉපැයීමට නොව නිවැරදි සමාජගත කිරීමට යොමු කරන්න.

මේ මගින්,

- රැකියාවක නිසි ලෙස යෙදීමට,
- උසස් අධ්‍යාපනයක් ලැබීමේ තමන්ගේ පෞරුෂය සකසා ගැනීමට,
- ගෙදර ජීවිතය සතුටින් ගත කිරීම,
- දෙමාපියන්ට දරුවා පිළිබඳ මානසික සතුටක් ලැබීමට,
- අනවශ්‍ය ලෙස රැඳී සිටින තාක්ෂණික උපකරණ භාවිතය අවම කිරීමට,
- අධික තරහ යාම අඩු කිරීම,
- දඟලන ළමයි හොඳට හදා ගැනීම,
- ඉගෙන ගන්නෙ නැති ළමයි ඉගෙනීමට යොමුකරවා ගැනීම,
- විභාග තරගවලට මුහුණ දීමට ශක්තිය ලබාදීම,
- පස්පවින් වළක්වා ගැනීමට,

**රටට සදාචාර සම්පන්න දරුවන් හදමු.**

දරුවන් ගැන සිතීමෙන් දෙමාපියන්ට සෑදෙන බෝ නොවන රෝගවලින් වැළකීමට හොඳම මග මෙයයි.

**නේවාසික පුහුණු කාලය දින 10යි.**

- ඉංග්‍රීසි
- උපදේශන සේවය හා සදාචාර අධ්‍යාපනය
- පුද්ගල පෞරුෂ සංවර්ධනය
- මනෝ විද්‍යා දේශන



**හද්‍රා.ජී. කිරින්ගොඩ**

MA,BA, (කැළණිය) Dip In Counseling (NISD) Inclusive Education (OUSL) Family Counseling (SLF)

චැනල් සේවාවෙන් හමුවිය හැක

077 5 736 446

https://www.facebook.com/Badragkiringoda

නො. 561, පුත්තලම පාර, කුරුණෑගල.

# ඩබල් බකල් බඳපටියෙන්
# කලැත්තෑවේ සොයිසාගේ පටි රෝල් වුණු හැටි



සමාජයේ මිනිසුන් අනෙක් මිනිසුන්ගේ අයිතිවාසිකම්වලට ගරු කරමින් ජීවත් විය යුතු ආකාරය නීතිය පෙන්වා දෙයි. එනිසා සෑම මනුෂ්‍යයකුම නීතිය දැන සිටිය යුතුය. නීතිය රැකෙන්නේ ඒ පිළිබඳ දැනුවත් වුණොත් පමණි. නීතිය සම්බන්ධ දැනුවත්කිරීම්වල නිරතව සිටින ප්‍රමුඛ චරිතයකි ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න. ඔහු නීතිපති දෙපාර්තමේන්තුවේ හිටපු ජ්‍යේෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙකි. අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස හෙතෙම වසර තුනක කාලයක් කටයුතු කළේය. ඔහු අපරාධ විද්‍යාව හා යුක්තිය පසිඳලීම සම්බන්ධයෙන් ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධියක්ද ව්‍යවහාරික විද්‍යාවන් සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් උපාධියක්ද ලබා ඇත. බ්‍රිතාන්‍ය මණ්ඩලය ප්‍රධානය කළ චෙවනින් (Chevening) ශිෂ්‍යත්වයක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ ෆුල්බ්‍රයිට් ආයතනයෙන් පිරිනැමූ හියුබට් හම්ෆ්‍රී (Hubert Humphrey) ශිෂ්‍යත්වයක්ද දිනා ඇත. කොබෙයිගනේ රූප සුන්දරී ඝාතනය, රගර් ක්‍රීඩක ටෝනි මාටින් ඝාතනය, මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඝාතනය සහ හෝකන්දර සය පුද්ගල ඝාතනය ආදී සිදුවීම් ගණනාවක නඩුවල පැමිණිල්ල මෙහෙයවීමට දායක වූ ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න නීතියට අදාළව දක්වන අදහස් මෙරට නීති ක්ෂේත්‍රයේ මෙන්ම ඉන් පරිබාහිර තැනැත්තන්ටද වටී. සිය අත්දැකීම් නිර්මාණශීලීව යොදා ගනිමින් නීතියද පැහැදිලි කරමින් ඔහු 'යළි මැවෙන අපරාධයක්' නමින් ග්‍රන්ථයක්ද රචනා කළේය. එහි සංස්කරණය කළ දෙවන මුද්‍රණයද පසුගියදා ජනගත කෙරිණ.

රටේ සුප්‍රසිද්ධ නඩු ආශ්‍රයෙන් ඔහු ලබාදෙන අදහස්ද බෙහෙවින් වැදගත්ය. මෙරට ආන්දෝලනයට තුඩු දුන් අපරාධ අතර කලැත්තෑව ද්විත්ව ඝාතනයද තිබේ. අද මෙම ලිපිය සකස්වෙන්නේ එම සිදුවීම මුල්කරගෙනයි.

**18 කොටස**

## බිඳ දැමූ දිළිඳු බව

1915 දී උපත ලැබූ ඇල්ෆ්‍රඩ් සොයිසා කුඩා කාලයේදී දිළිඳු බවින් පීඩා වින්දේය. ධනවතුන්ගේ ඇනුම් බැනුම්වලටද ඇතැම්විට ගොදුරු වූ හෙතෙම පොහොසතකු වීමට අදිටන් කර ගත්තේය. වැඩිදුර අධ්‍යාපනයට ඔහු අගහිඟකම් බාධාවක් කරගත්තේ නැත. ජීවිතයට ලබාගත් විවිධ අත්දැකීම් පන්නරයක් කරගත් ඇල්ෆ්‍රඩ් තරුණ වියේදී ඇමරිකාවට ගියේ ඇපොතිකරි වෛද්‍ය විද්‍යාව හැදෑරීමටයි. එය සාර්ථකව නිම කර මෙරටට පැමිණි ඔහු රජයේ සේවයට එක්විය. ඉක්මනින් එය අත්හළ හෙතෙම ගම්පහ - දෙල්ගොඩ ප්‍රදේශයේ පෞද්ගලික වෛද්‍ය සායනයක් ඇරඹීය. එහෙත් ඉක්මනින් ධනවතකු වීමට එය ප්‍රමාණවත් නොවන බව ඇල්ෆ්‍රඩ්ගේ අදහස විය. ඒ අනුව ඔහු වෙනත් ව්‍යාපාර කෙරෙහි අවධානය යොමු කළේය. අනුරාධපුරය ආශ්‍රිතව සිය ව්‍යාපාර පුළුල් කළ හෙතෙම ධනයෙන් බලයෙන් ප්‍රසිද්ධ විය. කෙසේ වුවද රෝගීන්ට ප්‍රතිකාර කිරීමද ඇල්ෆ්‍රඩ් අත්හැරියේ නැත. එමගින් ඔහු විවිධ තරාතිරම්වල මිනිසුන් හඳුනාගත්තේය.

## නිම නොවන මුදල් පිපාසය

ඇල්ෆ්‍රඩ්ගේ ඉදිකිරීම් ව්‍යාපාර දිනෙන් දින දියුණුවීමට ඒවායේ ගුණාත්මක බව හේතු විය. ආණ්ඩුවේ ටෙන්ඩරද ඔහුට හිමිවිය. ඊට අමතරව ඔහු මත්පැන් ව්‍යාපාරයට යොමුවූයේ වැඩි වැඩියෙන් ධනය එක්රැස් කිරීමේ දැඩි චේතනාවෙනි. උකහාගත් දැනුම සහ හැකියාව භාවිත කරනවාට වඩා පහසු මාර්ගවලින් ධනය ඉපයීමේ ලොල් බවින් ඇල්ෆ්‍රඩ් පෙළුණේය. විශේෂයෙන් කොන්ත්‍රාත් ලබාගැනීම සහ අරක්කු රේන්ද බලපත් ලබාගැනීමේ ටෙන්ඩරවලදී සිය ධනය බලය භාවිතයටද ඔහු පෙළඹුණේය. ඔහු සතුව යන්ත්‍රෝපකරණ වැඩපළක්ද තිබිණ. විහිදී ගිය ව්‍යාපාර රැසක හිමිකරුවකු වූ ඇල්ෆ්‍රඩ්ගේ මිතුරු ලැයිස්තුවේ විවිධ පළාත්වල නමගිය ගණංකාරයෝ ද වූහ. ඔහුගේ අණසකට ඕනෑම අයෙකු යටත් වන තත්ත්වයක් එකල එම පළාතේ පැවතිණ. පොලිසිය පවා ඔහුට එරෙහිව කටයුතු කිරීමට පැකිලිණ.

## සුපිරි ක්‍රිකට් ක්‍රීඩකයාගේ සුපිරි වාහනය

වාහන කොල්ලකෑමට ප්‍රවීණත්වය ලැබූ කොළඹ කල්ලියක් ඇල්ෆ්‍රඩ් හා මිතුරුව සිටියේය. ඒ කල්ලිය වරක් විශේෂ වාහනයක් කොල්ලකෑවේය. එහි හිමිකරු මෙරට විසූ සුපිරි ක්‍රිකට් ක්‍රීඩකයෙකු වූ සී.අයි. ගුණසේකරට අයත්ය. සී.අයි. එම වාහනය මිලටගත්තේ ඊටත් පෙර කිසියම් කල්ලියක් එය සොරාගෙන ගොස් තිබියදී සොයාගැනීමෙන් අනතුරුවයි. එය නැවත සොරාගැනීමට ලක්වනු ඇතැයි ඔහුද අපේක්ෂා කරන්නට නැතුව ඇත. මෙම රථය එකල දැඩි ආකර්ෂණයට ලක්ව තිබූ ඔස්ටින් කේම්බ්‍රිජ් වර්ගයේ එකකි. පෙරදා රාත්‍රියේ ගුණසේකරගේ නිවසේ නවතා තිබූ රථය ඊට පසුදින අතුරුදන් වී තිබිණ. පොලිසියට පැමිණිලි කළද වාහනය පිළිබඳ කිසිඳු හෝඩුවාවක් නොවීය. කොළඹින් සොරාගත් වාහනය අනුරාධපුරයේ ඇල්ෆ්‍රඩ් අතට පත්විය. ඔහුගේ යන්ත්‍රෝපකරණ වැඩපළේ සේවකයෝ නොම්මර තහඩුවේ අංකයක් පමණක් වෙනස් කළහ. ඕනෑම කෙනෙකු වරක් දුටු විට නැවත හැරී බලන අන්දමේ වාහනයක් වූ එය අනුරාධපුරයේ මාර්ගවලද ධාවනය කෙරුණේ කිසිඳු අවහිරයකින් තොරවය. කොළඹින් අතුරුදන් වූ වාහනය ගැන තොරතුරු ලැබුණද අනුරාධපුරයේ පොලිස් නිලධාරීන්ට එය හඳුනාගැනීමට නොහැකි වූවා විය හැකිය. ඇල්ෆ්‍රඩ්ගේ පෙම්වතියක වූ තැනැත්තියක් විහාරස්ථානයක කුලඟන සමිතියේ සභාපතිනිය වූවාය. එම විහාරයේ පැවති උත්සවයකට පවා මෙම රථය රැගෙන ගොස් තිබිණ. එහෙත් කිසිවකු රථය හඳුනාගත්තේ නැත.

## ඉදිරි වර්ෂයට රේන්ද බලපත්

වාහනය පැහැරගෙන ආ දිනවලම ඉදිරි වසර සඳහා අරක්කු රේන්ද බලපත්‍ර නිකුත් කිරීමට නියමිතව තිබිණ. එහෙත් සිය අණසකට අනුරාධපුරයම නතු කරගෙන සිටි ඇල්ෆ්‍රඩ් වෙනත් කිසිවකුට ටෙන්ඩරයට ඉදිරිපත් වීමට ඉඩ නොදුන්නේය. යාපනයේ ව්‍යාපාරිකයෝ පිරිසක්ද අරක්කු රේන්ද ලබාගැනීමට අනුරාධපුරයට පැමිණියහ. ඒ බලපත්‍රය ලබාගැනීම සඳහා ගෙවිය යුතු රුපියල් හැටදහසක මුදලද රැගෙනය. ඊට අමතරව තවත් රුපියල් තුන්දහස් පන්සියයක් ඔවුන් සතුව තිබිණ. ඒ කාලයේ හැටියට එය විශාල මුදලකි. මේ ව්‍යාපාරිකයින් ටෙන්ඩරයට ඉදිරිපත් වීම වළකාලීමට ඇල්ෆ්‍රඩ්ට අවැසි විය. හෙතෙම ඊට උපායක් යෙදීය. ව්‍යාපාරිකයින් හමු වූ ඇල්ෆ්‍රඩ් ඔවුන් හා සුහදව කතාබහ කර ආරාධනයක් කළේය. ඒ, තමා සමඟ දිවා ආහාරයකට පැමිණෙන ලෙසයි. පිරිස එය පිළිගැනීමෙන් ඇල්ෆ්‍රඩ්ගේ සැලැස්මේ පළමු අදියර සාර්ථක විය. අනුරාධපුර රෙස්ට් හවුසියට පැමිණෙන ලෙස ආරාධනාව වූ අතර ඇල්ෆ්‍රඩ් එදින උදේ ආහාරයද සිය ගෝල බාලයන් සමඟ එක්ව එහිදීම ලබාගත්තේය. නැවත දහවල් ඔහු එහි පැමිණියේ සිය ආරාධනය පිළිගත් යාපනයේ ව්‍යාපාරිකයන්ට සැලකීම වෙනුවෙනි. පිරිසට මධුවිතින් සැලකීමටද ඔහු අමතක නොකළේය. දිවා ආහාර සාදය මනාව පැවැත්විණ. ඒ අතර ඔහු සිය අදහස ව්‍යාපාරිකයන්ට ඉදිරිපත් කළේය. ඒ, අරක්කු රේන්ද ලබාගැනීමේ අදහස අතහරින ලෙසයි. ඊට ඇල්ෆ්‍රඩ් ඔවුන්ට පගාවක්ද ලබාදුන්නේය. මුදල රුපියල් තුන්දහසකි. ඇතැම්විට ඒ සමඟ පිරිසට ඔහුගේ තර්ජනයක්ද එල්ල වූ බවට සැක කළ හැකිය. දිවා ආහාරයෙන් සප්පායම් වූ පිරිස අල්ලස් මුදල්ද රැගෙන පිටත්ව ගියේ ටෙන්ඩරයට ඉදිරිපත් වීම පසෙක ලමිනි. රුපියල් හැටහයදහස් පන්සියයක්ද සහිතව ඔවුහු එදිනම යළි යාපනය බලා යාමට පිටත් වූහ.

## ඔස්ටින් කේම්බ්‍රිජ් මෙහෙයුම

ටෙන්ඩරය අහිමි වුවද රැගෙන ආ මුදලට වැඩි මිලක් හිමි වූ පිරිස අහරින්ද මධුවිතින්ද සංග්‍රහ ලැබ ආපසු ගම්බිම් බලා ගියේ සතුටු සිතින් වන්නට ඇත. ඔවුනගේ පර්ජෝ රථය ධාවනය වූයේ ඒ නමය මාර්ගය ඔස්සේය. එය මැදවච්චිය පෙදෙසින් ගමන් ගනිමින් තිබිණ. අලංකාර ඔස්ටින් කේම්බ්‍රිජ් රථයක් ඔවුන්ගේ වාහනය දෙසට වේගයෙන් ඇදී ආවේ ඒ අතරයි. ඒ, කොළඹදී සොරාගෙන ඇල්ෆ්‍රඩ් භාරයේ තිබූ සී. අයි. ගුණසේකරට අයත් සුපිරි රථයයි. වේගයෙන් පැමිණි රථය යාපනය ව්‍යාපාරිකයින්ගේ රථය පසුකර එය හරස් කර නැවතුයේ චිත්‍රපට ජවනිකාවක මෙනි. යාපනය බලා යමින් සිටි පිරිස අන්දමන්ද වූයේ සිදුවන දේ ගැන කිසිඳු අවබෝධයක් නැතිවයි. එහි රියැදුරුට මිරිස්, ගම්මිරිස් ප්‍රහාරයක් එල්ල වූයේද අනපේක්ෂිතවය. ඔස්ටින් කේම්බ්‍රිජ් රථයේ පැමිණි පිරිස සතුව ආයුධද තිබිණ. ඒවා පෙන්වා බිය වද්දා ව්‍යාපාරිකයින් වාහනයෙන් බැස්ස වූ පිරිස එම රථයද රැගෙන ඔස්ටින් කේම්බ්‍රිජ් රියද සමඟ වේගයෙන් ආපසු හැරී අනුරාධපුරය වෙත පිටත්වූයේ ඇසිල්ලකිනි. කලැත්තෑව කිට්ටුවට පැමිණි අය පර්ජෝ රථයේ ඩිකියේ තිබූ මුදලද රැගෙන වාහනය මාර්ගයේ අතහැර දමා තිබේ. පසුව ඇල්ෆ්‍රඩ්ගේ ගෝලයෝ ඔස්ටින් කේම්බ්‍රිජ් රථයට නැගී මුදල්ද රැගෙන පිටත් වූහ. කල්ලිය මුදල් බෙදාගත්තේ රුපියල් පන්දහසක මුදලක් ඇල්ෆ්‍රඩ්ටද ලබාදෙමිනි. මුදල් කොල්ලකෑමට සහභාගි වූ ප්‍රධානියා ඔස්ටින් රථයද පැහැරගැනීමේ මූලිකයා වූ ජයවර්ධන නමැත්තෙකි. ඇල්ෆ්‍රඩ් ඊට සක්‍රියව දායක වූයේ නැත. එහෙත් සියලු පණිවිඩ කොල්ලකරුවන්ට ලැබුණේ ඔහුගෙනි.

# පෙරේරා සහ සන්දරසාගර මරා දැමුවත් ගුණදාස බේරිලා

## වළ දැමූ සුපිරි රථය

මුදල් පැහැරගැනීමට යොදාගත් ඔස්ටින් කේම්බ්‍රිජ් රථය ඇල්ෆ්‍රඩ්ට හිසරදයක් විය. එය තවදුරටත් ප්‍රසිද්ධියේ තබාගැනීම කරදරකාරීය. ඒ අනුව ඉන් නිදහස් විය යුතුය. කලැත්තෑවේ වෙනත් පෙදෙසක දින කිහිපයක් වාහනය සඟවා තැබිණ. එහෙත් එය ස්ථිර විසඳුමක් නොවේ. ඒ අනුව සිය සහචරයකුගේ කලත්තෑවේ පිහිටි ඉඩමට පිටුපස වත්තට බුල්ඩෝසරයක්ද රැගෙන ඇල්ෆ්‍රඩ් ගියේ සාක්ෂි මිහිදන් කිරීමේ අරමුණෙනි. බොහෝදෙනෙකුගේ ආකර්ෂණය දිනූ ඔස්ටින් කේම්බ්‍රිජ් රථය මහා මුදල් මංකොල්ලය වසමින් පොළව යට සැඟව ගියේය.


## කට මැත දෙඩවීම්

ඇල්ෆ්‍රඩ්ගේ ගෝල බාලයෝ කිහිපදෙනෙක් මේ සිදුවීම දැනසිටියහ. පී.කේ.ඩී. පෙරේරා ඉන් අයෙකි. ඔහු කොළඹ - තලංගම පදිංචිකරුවකු වූ අතර ඇල්ෆ්‍රඩ්ගේ සමීපතම ගෝලයෙකි. සුරා පැනින් සප්පායම් වූ විට ඔහු රථය වළ දැමීමේ සිද්ධියේ පුරාජේරුව තැන තැන දෙඩවීමට පටන්ගත්තේය. ඔය කාලයේම කලැත්තෑවේ පිහිටි ඇල්ෆ්‍රඩ් සතු ඉඩමකට පොලිසියෙන් කඩා වැදුණේ මත්පැන් ජාවාරම් වැටලීමටය. එහිදී ඇල්ෆ්‍රඩ්ගේ ගෝලයෝ දෙදෙනෙක් අත්අඩංගුවට පත්වූහ. එය ඇල්ෆ්‍රඩ් රිදවූ කරුණකි. ඒ, තමාට විරුද්ධ කිසිවක් ඒ දක්වා නොවූ බැවිනි. මුදල් මංකොල්ලයට අදාළවද සිය නම ගෑවී තිබියදී මෙලෙස වීම ඔහු බියට පත්කළේය. ඒ අස්සේ පෙරේරාගේ දෙඩවිල්ලද ඔහුට හිරිහැරයක් විය. අලි මදිවට කොටි කියන්නාක් මෙන් ඇල්ෆ්‍රඩ් හා විරසක වූ පෙරේරා නැවත තලංගම සිය නිවසට ගියේය. එහෙත් නැවත ඇල්ෆ්‍රඩ් උපක්‍රමශීලීව ඔහු කැඳවාගත්තේය. ඒ අතරතුර පෙරේරාගේ දරුවෝ තලංගම තවත් පිරිසක් සමඟ ගැටුමකට මැදිහත් වූහ. එබැවින් පෙරේරා නැවත නිවසට පැමිණියේය. එවර ඔහු නැවත අනුරාධපුරයට යන ලකුණු නොවීය. පණිවිඩ පිට පණිවිඩ එව්වද නොපැමිණෙන ගෝලයා කැඳවාගෙන යාමට ඇල්ෆ්‍රඩ් තමාගේම වාහනයේ පැමිණියේ එබැවිනි. ඒ, 1966 නොවැම්බර් මස 17 වැනිදාය. පෙරේරා එදින පැළඳ ගියේ බකල් දෙකක් සහිත බඳ පටියකි. මෙවර ඇල්ෆ්‍රඩ්, පෙරේරාව රැගෙන ගියේ තමාගේ ඕනෑම කොන්ත්‍රාත්තුවක් බාරගන්නා සහචරයන් දෙදෙනෙකු වෙතයි. අයෙකු පියදාස හෙවත් කළු ඇල්බට්ය. අනෙකා විලී මාමාය. විලී මාමාට වාඩියක් තිබිණ. ඇල්ෆ්‍රඩ්, පෙරේරා නොවැම්බර් 18 දා එහි රැගෙන ගියේය.

කළු ඇල්බට් සහ විලී මාමාට අමතරව වින්සන්ට් නමැත්තෙක්ද එහි සිටියේය. එතැනදීද මධුවිතින් සප්පායම් වූ පෙරේරා ඔස්ටින් කේම්බ්‍රිජ් රථය ගැන දෙඩවීමට ගත්තේය. පසුව වින්සන්ට් සහ පෙරේරා රෑ කෑමට කඩයකට යාමට සූදානම් වූහ. එවිට විලී මාමා සහ කළු ඇල්බට් ආහාර රැගෙන පැමිණියහ. පෙරේරා ඔවුන් සමග රැඳුණද වින්සන්ට් යාමට සූදානම් වූ කඩයටම ගියේය. රෑ කෑම ගත් පසු වින්සන්ට් සිගරැට්ටුවක්ද උරමින් විලී මාමාගේ වාඩිය දෙසට ගමන් ගත්තේය. ඒ අතර ඔහු දුටුවේ කළු ඇල්බට්ගේ නිවස අසල ඇල්ෆ්‍රඩ්ගේ ලෑන්ඩ් රෝවරය නවතා ඇති අයුරුයි. රථයට මුවා වී ඇල්ෆ්‍රඩ්ගේ ගෝලයකු විලී මාමාගේ වාඩිය දෙස බලා සිටින ආකාරයද ඔහු දුටුවේය. වාඩිය දෙසට යාමට සූදානම් වූ වින්සන්ට් නවතාගත් එම තැනැත්තා සිගරැට්ටුව ඉල්ලා ගත්තේය. එහිදී වින්සන්ට්ට වැටහුණේ වාඩියේ යමක් වන බවයි. ඒ අනුව ඒ දෙසට යාමට සූදානම් වූයේය. මදක් ඇවිදන් යනවිට වින්සන්ට් වෙතට පැමිණි ඇල්ෆ්‍රඩ් ඔහුද රැගෙන අනුරාධපුරයට ගියේය. එහි ගොස් රෑ බෝ වී යළි පැමිණි වින්සන්ට් නොවැම්බර් 24 වනදා තෙක් කලැත්තෑව ආශ්‍රිතවම රැඳී සිටියේය. ඒ කිසිඳු දිනක ඔහුට පෙරේරා හමුවූයේ නැත. 24 වැනිදා ඔහු තවත් අහඹු සිදුවීමකට මුහුණ දුන්නේය. එදින රාත්‍රියේ විලීගේ වාඩියේ සිටින විට ඊට තරමක් දුරින් මහා ගිනිමැලයක් දැල්වෙන අයුරු ඔහු දැක්කේය. ඒ සමඟ මහත් බියට පත්වූ ඔහු ඉල්ලා අස්වන බව ඇල්ෆ්‍රඩ්ට පවසා පිටව ගියේය. ඔහුද නැවත කැඳවා ගන්නා ඇල්ෆ්‍රඩ් වෙනත් පෙදෙසක පිහිටි සිය වැඩබිමකට වින්සන්ට් යොමු කළේය.

## රැකියාවට පැමිණ දින හතරකින් ජයසේන දුටු දේ

විලී මාමාගේ වාඩියේදී පෙරේරාට යම් අකරතැබ්බයක් වූ බව තවත් තැනැත්තෙක් දුටුවේය. ඒ ජයසේනයි. ඔහු රැකියාවට පැමිණ දින හතරකි. 19 වනදා ඔහු විලී මාමාගේ වාඩියේ රුධිරය තිබෙන අයුරු දුටුවේය. එමෙන්ම කිසියම් තැනැත්තකු බිම දිගේ ඇදගෙන ගිය ලකුණුද ඔහු දුටුවේය. ජයසේන ඒවා දුටු බව දැනගත් ඇල්ෆ්‍රඩ් ඔහුට අනතුරු ඇඟවූයේ කිසිවක් නොපවසන ලෙසයි. එහිදී තමාට නැවත යාමට අවශ්‍ය බව ජයසේන කීය. එබැවින් ඇල්ෆ්‍රඩ් ඔහුට රුපියලක්ද ලබා දුන්නේය.



විලී

## තවත් අතුරුදන්වීමක්

ඇල්ෆ්‍රඩ්ගේ ඔඩ්ඩුසුඩාන්හි පිහිටි වැඩබිමක සන්දරසාගර නමැත්තෙක් රැකියා කළේය. ඇල්ෆ්‍රඩ්ගේ ක්‍රියා කලාපය ඔහු රිස්සුවේ නැත. එනිසා ඔහු 1966 නොවැම්බර් මාසයේදීම ඇල්ෆ්‍රඩ් වෙත ලිපියක් ලිවීය. තමා සේවයෙන් ඉවත්වන බවද එමගින් දැන්වීය. ලිපිය දී වැටුප ලෙස රුපියල් 150ක චෙක්පතක්ද රැගෙන ඔහු පිටත් වූයේ ඇල්ෆ්‍රඩ්ට අයත් ටයරයක්ද සොරාගෙනය. එය දැන උරණ වූ ඇල්ෆ්‍රඩ් චෙක්පත අවලංගු කිරීමටද පියවර ගන්නේය. අනතුරුව නැවත සන්දරසාගර ගෙන්වා ගත් අතර ඔහුද අතුරුදන් වූයේ කිසිඳු සාක්ෂියක් නොමැතිවය.

## පෙරේරා සහ සන්දරසාගරට කුමක් වීද?

පෙරේරා නැවත අනුරාධපුරයට පැමිණ තිබුණේ පුතා සම්බන්ධ ගැටුමට අදාළ නඩුවේ ඊළඟ වාරයට පැමිණෙන බව දන්වමිනි. එහෙත් ඔහු නොපැමිණියේය. පළමු මරණකරු කලින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රැකියාව කෙරූවෙකි. ඔහුට විශ්‍රාම වැටුපක්ද හිමිය. එය ලබාගැනීමට ඔහු අනිවාර්යයෙන් පැමිණේ. එහෙත් එය ලබාගැනීමටද පෙරේරා නොපැමිණි බැවින් බිරිය පොලිසියට පැමිණිලි කළාය. ඡන්දය ප්‍රකාශ කිරීමටද සැමියා නොපැමිණීම ඊට තවත් හේතුවකි. එහෙත් ඒ බව කොළඹින් අනුරාධපුර පොලිසියට දැනුම්දීමක් හෝ නොවීය. සන්දරසාගරගේ අතුරුදන්වීම ගැනද පැමිණිල්ලක් තිබිණ. එහෙත් මාස කිහිපයක් මේ සියල්ල යට ගොස් තිබුණේ කිසිඳු හෝඩුවාවක් නැතිවය.



දොස්තර ඇල්ෆ්‍රඩ් සොයිසා



## සොරාගත් බයිසිකලයකින් හෙළි වූ අබිරහස

1967 ජනවාරි 17 වනදා තවත් සිදුවීමක් වාර්තා විය. ගුණදාස නම් වූ සයිකල් වැඩකරුවෙක් ඇල්ෆ්‍රඩ් යටතේ සේවය කළේය. ඇල්ෆ්‍රඩ්ට අයත් සයිකලයක් උකස් කිරීමට ගොස් හසු වූ ඔහුටද විලී මාමා සහ කළු ඇල්බට් හමුවට යාමට සිදුවිය. ඔහු දැඩි පහරදීමට ලක්විය. පසුව ගසක ගැටගසා තිබියදී ඉන් මිදී දිවගිය ගුණදාස නැවත ඇල්ෆ්‍රඩ්ගේ ගොලයින්ට හසුවූයේය. මෙය අසල වත්තක සිටි කරල්ලියද්ද නමැත්තෙක් දුටුවේය. එනිසා ඔහු අනුරාධපුර පොලිසියට පැමිණිලි කළේය. ඊට නිසි ක්‍රියාමාර්ග නොගැනුණු අතර පසුදද ගුණදාස ගුටිකන අයුරු ඔහු දුටුවේය. ඒ අනුව ඔහු ග්‍රාමසේවකද දැනුවත් කෙරූ අතර එතැනින් ලබාගත් ලිපියක් පොලිසියට රැගෙන ගියේය. එම අවස්ථාවේ පොලිස් කණ්ඩායම අදාළ ස්ථානයට පැමිණි අතර මරණාසන්නව සිටි ගුණදාස සොයාගත්තේය. ඔහු පුළුස්සා දැමීමට අවැසි අඩු වැඩියද එහි විය. සැකකරුවෙක්ද අත්අඩංගුවට ගැනිණ.

## මහ මොළකරු සහ පිරිස අත්අඩංගුවට

තුවාලකරුගේ ප්‍රකාශයක්ද ලබාගැනිණ. සිදුවීමෙන් පසු අනුරාධපුරය ඉහළ පොලිස් නිලධාරීන්ගේ රැස්වීමක් 1967 පෙබරවාරි මාසයේ 23 වනදා කැඳවීමට සිදුවිය. ඇල්ෆ්‍රඩ් සොයිසාගේ නොපනත්කම් ගැන සහ ඒවාට එරෙහි කඩිනම් ක්‍රියාමාර්ගවල අවශ්‍යතාව එහිදී තහවුරු කෙරිණ. ඒ අනුව ලද තොරතුරු මත එදිනම පොලිසිය ඔඩ්ඩුසුඩාන් වෙත ගොස් වින්සන්ට් සහ සුනිල් විජේරත්න යන අය හමුවිය. ඔවුහු ඇල්ෆ්‍රඩ් පිළිබඳ දන්නා සියලු තොරතුරු හෙළි කළහ. පසුව ඇල්ෆ්‍රඩ් සොයිසා අත්අඩංගුවට ගැනුණේ ඔහුගේ නිවසට යාබද නිවසකදීය. වසර විස්සක් හිරේ සිට පැමිණ ඇල්ෆ්‍රඩ්ගේ ගෝලයකු වූ කළු ඇල්බට්ද අත්අඩංගුවට පත්විය. වළදා තිබූ ඔස්ටින් කේම්බ්‍රිජ් රථයද ගොඩ ගෙන තිබේ. වින්සන්ට් ගිනිමැලය දුටු ස්ථානයේ කළ පරීක්ෂාවේදී බකල් දෙකක් සහිත බඳ පටියක කොටසක්ද හමුවිය. මිනිස් අස්ථි කැබලි කිහිපයක්ද සොයාගෙන ඇත. එතැන ගිනි තැබූ බවට සාධකද තිබිණ. රජයේ රස පරීක්ෂක සමඟ පසුදා විධිමත් පරීක්ෂණයක්ද සිදුකර තිබේ. බෑගයක සිප් කොටසක් සහ වයර් කැබැල්ලක්ද හමුවිය. එය පෙරේරාට අයත් බෑගයක කොටසක් බව දැනගැනීමට ලැබිණ. දින කිහිපයකට පසු විලී මාමා අත්අඩංගුවට ගත්තේ පුත්තලමේ ටජ්මහල් හෝටලයේදීය. 1967 මාර්තු මාසයේ 25 වනදා අදාළ ස්ථානයේදී මහේස්ත්‍රාත් පරීක්ෂණයද පැවැත්විණ. මැදවච්චිය මුදල් කොල්ලයට සම්බන්ධ වූ කෝටි ජෝස් නමැත්තකුගේ ප්‍රකාශයද සටහන් කරගෙන තිබේ.

## මරණ දඬුවම

1969 ඔක්තෝබර් 26 වනදා ඇල්ෆ්‍රඩ්, කළු ඇල්බට් සහ විලී මාමාට එරෙහිව නඩු විභාගය ජූරි සභාවක් ඉදිරියේ කොළඹදී ආරම්භ විය. ඒ, චෝදනා පහක් යටතේය. පළමු, දෙවන සහ තෙවන චෝදනා වූයේ පෙරේරා ඝාතනය සම්බන්ධයෙනි. ඒකමතික තීන්දුවකින් තිදෙනාම වරදකරුවන් වූ අතර මරණ දඬුවම හිමිවිය. සිව්වැනි සහ පස්වැනි චෝදනා සන්දරසාගර ඝාතනයට අදාළවය. එහෙත් සාක්ෂි නොතිබූ බැවින් ඒවාට ඔවුහු නිවැරදිකරුවන් වූහ. මේ නඩුවේදී පැමිණිල්ල සාක්ෂිකරුවන් 169ක් ලැයිස්තුගත කර තිබූ අතර ඉන් 63 දෙනෙකුගේ සාක්ෂි මෙහෙයවා තිබේ. විශේෂඥ සාක්ෂිකරුවන් තුන්දෙනෙකුද නඩුවට යොදාගෙන ඇත. පැමිණිල්ල මෙහෙයවූයේ එවකට නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ටී.ඒ.ඩී. විජේසුන්දර (පසුව විනිසුරු), ජ්‍යේෂ්ඨ රාජ නීතිඥ පර්සි කොලින් තෝමේ සහ දයා පෙරේරා ඇතුළු නීතිඥ කණ්ඩායමකි. අභියාචනා ප්‍රතික්ෂේප වූ අතර ඇල්ෆ්‍රඩ් සොයිසා සහ කළු ඇල්බට් 1972දී මරණ දඬුවමට ලක්වූහ. විලී මාමාගේ වයස සහ සෞඛ්‍ය තත්ත්වය සලකා මරණ දඬුවම ජීවිතාන්තය දක්වා සිර දඬුවමකට පරිවර්තනය කෙරුණු අතර 1983දී රෝගාතුරව මියගියේ සිරගතව සිටියදීමය.

■ **නීතිඥ රෂ්නිකා ලියනගේ**

රත්තරන් දුවේ



අත්තනායක එම්. හේරත්

# කවදාවත් මේ පුතාගෙ කුලය මතක් කරන්නේ නෑ කියලා දුව මට පොරොන්දු වෙන්න

රත්තරන් දුවේ



මේ සිදුවීම වුණේ කුරුණෑගල මල්කඩුවාව පංතියේ උගන්වන සමයේදි. දවසක් මම සද්ධර්මරත්නාවලිය උගන්වන අතරේ පටාචාරාවට ඒ විපත වුණේ දෙමාපියන්ගේ වරදින් බව කිව්වා. පටාචාරාවට ගැළපෙන කෙනෙක් එක්ක යන්න අම්මලා, තාත්තලා දුන්නෙත් නෑ. පටාචාරාවට එහෙම කෙනෙක් හම්බවුණෙත් නෑ. අම්මා තාත්තා කියන සිටුවරයව දැකලා තිබුණෙත් නෑ. ඉතින් එයා ගෙදර දර පළන මිනිහා එක්ක පැනලා ගිහිල්ලා ලෞකික ජීවිතය බිඳවට්ටගත්තා. මම ඒ පාඩම ඉවරවෙලා විවේකාගාරයට ගියාම මගේ ළඟට දුවෙක් ආවා.

**"සර් එතකොට පටාචාරාට වැරදුණේ සුදුසු කෙනෙක් නැති හින්දනේ. එයා සිටුදුවක්. අරයා දර පළන්නෙක්. එහෙම නේද?"**

"ඔව් දුව ඒ එදනේ. මේ මෙද. මෙද දුව ගළපන්න ඕන බුද්ධිය, අවබෝධය හා ආදරය වගේ මානුෂික කාරණා. රස්සාව හරි බුදල් හරි නෙවෙයි."

"අනේ සර් මට ප්‍රශ්නයක් තියෙනවා. මං කෙනෙකුට ආදරය කරනවා. ඉගෙනීමත් තියෙනවා, ආදරයත් තියෙනවා. තියෙන ප්‍රශ්නය එයා අපේ කුලයේ නෙවෙයි. ඉතින් මං කැමති නැහැ තනි තීරණයක් අරගෙන එයාව බඳින්න. සර් කොහොමද ඒ වගේ ගැටලුවකට මට විසඳුමක් දෙන්නේ?"

මං කිව්වා පුළුවන්නම් ඒ පිරිමි ළමයා එක්කරගෙන එන්න කියලා. ඊළඟ සතියේ දෙන්නම ආවා. මං දෙන්නා එක්ක වෙන වෙනම කතා කළා. අර දුවගේ තාත්තා ටිකක් නපුරු චරිතයක්. කුලවාදයෙන් පිරුණු මනුස්සයෙක්. වරක් දෙකක් මේ පුතාට මරණ තර්ජනත් කරලා. මං ඇහුවා ඒ පුතාගෙන් **"ඔයා ඇත්තටම ඒ දුවට ආදරේද? මගදි ඒ දුවව අතහරිනවද?"** පුතාගේ උත්තරය වුණේ **"නෑ සර් කවදාවත් මං එයාව අතහරින්නේ නැහැ." "පුතා ඒ දුවට පිරිමියෙක් ඕන. තාත්තා කෙනෙකුත් ඕන. ඒ දෙකම දෙන්න පුතාට පුළුවන්ද? ඒ දෙකටම පුතේ ශතයක්වත් වියදම යන්නේ නැහැ. පුතාට පුළුවන්ද? මොකද මං ඒ දුවගෙන් දැනගත්තා දුවට තාත්තා කෙනෙකුත් ඕනෙ සබෑ පෙම්වතෙකුත් ඕන කියලා. දුව කිව්වේ ගේ ඇතුළේ ඉන්නෙ පුදුම බයකින් තාත්තා බනියිද, සැර කරයිද, ගහයිද කියලා. ඔක්කොම දරුවෝ කල් ගෙවලා තියෙන්නේ හිට්ලර් යටතේ ජර්මනිය වගේ. ඉතින් පුතා ඔයාට මේ දරුවට තාත්තෙක් වෙලා ස්වාමි පුරුෂයෙකුත් වෙන්න තියෙනවා. පුතාගේ කුලය ඒ දුවට ප්‍රශ්නයක් නැහැ. ඔයාට පුළුවන්ද ඒක කරන්න? මම සතියක් කල් දෙන්නම්. ඊටපස්සේ කල්පනා කරලා එන්නකො බලන්න."**

**පංතිය ඉවර වුණාම දෙන්නම ආවා මගේ ළඟට. "දැන් කොහොමද පුතා ඔයාගේ අදහස? විවාහ වෙලා චරිත දෙකක් රඟපාන්න කැමතිද?" ඒ පුතා ගත්කටටම කිව්වා "මං කැමතියි" කියලා**

මම එහෙම කියලා දෙන්නව පිටත් කළා. ඊට පසු සතියේ සිංහල පාඩම් කරද්දි අර පිරිමි දරුවත් ඇවිල්ලා පංතියේ හිටියා. එද මං කියලා දුන්නේ කිසාගෝතමීගේ කතා වස්තුව. ඒකේ හිටපු සිටුවර තාත්තා කෙනෙක් පොළකට බඩු ගේන්න ගිහිල්ලා, අඳුනගත්ත දුවක් ගෙනැල්ලා පුතාට දෙනවා. තාත්තට පිටුපාන්න බැරි හින්ද සිටුවර පුතා කිසාගෝතමීව බඳිනවා. ඇගේ පළමු දරුවා මියගිය ගමන් කිසාගෝතමී මළසිරුර කරේ තියාගෙන දුවනවා. කිසා මළසිරුරක්වත් ඊට කලින් දැකලා තිබුණේ නැහැ. අන්තිමට තාත්තගේ බහ අහපු කොල්ලා තනි කරලා කිසාගෝතමී බුදුන් සරණ යනවා. ඒ හින්ද තාත්තා කිව්වත් තමන් අකමැතිනම් විවාහ වෙන්න එපා කියලා මං ඒ පුතාටත් ඇහෙන්න පාඩම කළා. පංතිය ඉවර වුණාම දෙන්නම ආවා මගේ ළඟට. **"දැන් කොහොමද පුතා ඔයාගේ අදහස? විවාහ වෙලා චරිත දෙකක් රඟපාන්න කැමතිද?"** ඒ පුතා ගත්කටටම කිව්වා **"මං කැමතියි"** කියලා. **"ඒත් පුතේ මේ තාත්තා දරුණු කෙනෙක්. පුතා උගත් වුණත් මේ තාත්තා කුලවාදයෙන් ඉදිමිච්ච කෙනෙක්. ඒ වගේම දරුවන්ට තියෙන ආදරය ප්‍රකාශ කරගන්න බැරිව දඟලන අහිංසක තාත්තෙක්. පුතා මේ දුව බැන්දෙත් දවසක මේ දුවගෙ පැතුම් දෙකම ඉෂ්ට වෙනවා. තෙවනුව කුලවාදයෙන් පිරිච්ච දුවගේ තාත්තත් වෙනස් කරන්න ඔය දෙන්නටම පුළුවන් වෙයි."**

ඔහොම කියලා දෙන්නා ගියා. මේ දුව තාම ඉගෙනගන්නවා. පුතා රස්සාවක් කරනවා. දෙන්නා හොරෙන් බඳින්න තීරණය කළා. ඒත් අත්සන් කරන්න කෙනෙක් දුවගේ පැත්තෙන් නැහැ. ඒක තමයි දැන් දුවට තියෙන ප්‍රශ්නේ. දුවගේ තාත්තගේ හැටි දන්න හින්ද කවුරුත් දුව වෙනුවෙන් අත්සන් කරන්නෙ නැහැ. **"පුතා එහෙනම් මං එන්නම් අත්සන් කරන්න. හැබැයි පුතා ඔයා මට පොරොන්දු වෙන්න ඕන මේ දුව අතරමං කරන්නෙ නෑ කියලා. දුව මට පොරොන්දු වෙන්න ඕනෙ කොයියම්ම මොහොතකවත් පුතාගේ කුලය පහත් කරලා කතා කරන්නෙ නෑ කියලා. මං එන්නෙ ඒ වෙලාවට අත්සනක් දන්න නෙවෙයි. කැමතිද?"** දෙන්නට මං කිව්ව ඊළඟ සතියේ තවත් කල්පනා කරලා තීරණය අරගෙන එන්න. එදට අපි තීරණය කරමු කවදද බඳින්නේ කියලා.

ඊළඟ සතියෙත් දෙන්නා ආවා. දෙන්නම මගේ අදහසට එකඟ වුණා. පුතාගේ පැත්තෙන් එක්කෙනෙක් ආවා. දුව වෙනුවෙන් මං අත්සන් කළා. අහිංසකයෝ අවුරුදු 18 පැන්න අය නිසා කරදරයක් වුණේ නැහැ. දුව අර පුතා සමඟ පිට පළාතකට ගියා. ඒ පැත්තේ සිට පොල්ගහමුල පංතියටත් ආවා. පළමු දරුවා ලැබුණ ගමන් මං කිව්වා අම්මා තාත්තා බලන්න යන්න කියලා. තාත්තා පැනලා මිනිබිරී වඩාගත්තා. ඔක්කොම කුලභේද ඉවරයි. තාත්තා විශ්‍රාම ගියා. ආවේ දුව ළඟට. සීයගෙයි මිනිබිරියගෙයි කෝලම් බලමින් තරුණ දුව පුතා පුදුම සතුටක් ලබනවා. අම්මගේ තාත්තගේ චූටි වරදක් දැක්කොත් මිනිබිරී සීයට තමයි පැමිණිලි කරන්නේ. මට හරි සතුටුයි. අර දුව තාත්තෙක්, ස්වාමිපුරුෂයෙක් හා තාත්තව වෙනස් කළ පිරිමියෙකුත් ගෙදරට ගෙනවා විතරක්යෑ විශ්‍රාම ගිය සීයට මිනිබිරී කියන විශ්‍රාම වැටුපකුත් ගෙනත් දුන්නා.

ඉතින් දුවේ තීරණ ගන්න විට පරිස්සමින් තීරණ ගන්න. අන් අයගේ උපදෙස් ජීවිතයට එකතු කරගන්න. කිසිම තීරණයක් හිතුමතේට ගන්න එපා. ඔක්කොටම උඩින් ඉගෙනගන්න. මේ දුව උපාධියකිනුත් ජීවිතය දිනාගත්ත බව අමතක කරන්න එපා. කොහොම වුණත් දැන් මං තැබූ අත්සනේ නම් වලංගු කාලය ඉවරයි.

අත්තනායක එම්. හේරත්

මාධ්‍යවේදියෙක් වුණු හින්දා මට ලංකාවේ කරක් ගහන්න වෙන තැන් එමටයි. ගිහින් ගිහින්ම සමහර පාරවල් ගමේ ගොඩේ පාරවල් ගාණට හුරුවුණත් සමහර පාරවල් තියෙනවා උදේ හවස ගියත් මතක හිටින්නේ නැති... ඉස්සර නම් එහෙව් පාරක යන්න වුණාම අඩියෙන් අඩියට මිනිස්සුන්ගෙන් පාර අහගන්න සිද්ධ වෙනවා. හැබැයි ඉතින් 'ඔතනින් වමට හැරිලා, ආපහු දකුණට හැරිලා කෙළින් ගියාම වංගුවක් හම්බවෙනවා.. එතැනිනුත් වමට හැරිලා ගියාම...' වගේ අංජබජල් උත්තර හම්බවුණාම කොහොම මතක තියගන්නද? එහෙම වුණාම දහදෙනෙක්ගෙන්වත් පාර අහන්න වෙනවා. හැබැයි දැන්නම් දෙයියන්ගේ පිහිටෙන් එහෙම ප්‍රශ්න නෑ. ඒකට හේතුව 'ඇය'. ඇත්තටම කිව්වොත් පාර වරද්දන්නෙ නැතුව දැන් ඇය තමයි ලංකාවේ ඕන තැනකට මාව එක්කගෙන යන්නේ.
"You have reached your Destination."
ඇය එහෙම කිව්වම මං දන්නවා හරිම තැනට ඇවිල්ලා ඉන්නේ කියලා. ඔව් ඇය තමයි 'කැරන් එලිසබෙත් ජේකබ්සන්' (Karen Elisabeth Jacobsen) නැත්නම් අපි හැමෝම දන්න විදියට GPS අක්කා. Google අක්කා කියලත් සමහරු කියනවා. ඇය තමයි ලෝකය පුරාම ඉන්න මිනිස්සුන්ට ගූගල් සිතියමේ ජී.පී.එස්. තාක්ෂණය ඔස්සේ ගමනාන්ත ගැන උපදෙස් දෙන හඬේ හිමිකාරිනිය. ඉතින් ලෝකය පුරාම බිලියන ගණනක මිනිස්සුන්ට ඉතාමත් ආකර්ෂණීය හඬකින් හරි පාර පෙන්වන ඔස්ට්‍රේලියාවේ කැරන් ජේකබ්සන්ගේ කතාව තමයි මේ.



# පාර අහන කොල්ලන්ව අතරමං නොකරපු එකම අක්කා



"මං පුංචි කාලේ ඉඳන් හීන දැක්කේ ගායිකාවක් වෙන්න. ඒ කියන්නේ අවුරුදු හතේ විතර ඉඳන්. ඒකට හේතුව ගායන ශිල්පිනී ඔලිවියා නිව්ටන් ජෝන්. ඇයගේ කටහඬ මාව පුංචි කාලේ ඉඳන්ම පිස්සු වට්ටලා තිබුණේ. ඇරත් මං හිතාගෙන හිටියා මගේ මේ කටහඬ ගායිකාවකට ගැළපෙනවා කියලා."

කැරන් ඉපදිලා තියෙන්නේ ඔස්ට්‍රේලියාවේ උතුරු ක්වීන්ස්ලන්ඩ් පළාතේ මකායි කියන ගමේ. පුංචි කාලේ ඉඳන්ම ඇය ඉගෙනගන්න හරිම දක්ෂයිලු. ඒ නිසාම ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලයෙන් උපාධියක් වගේම පියානෝ වාදනයෙන් විශේෂ සංගීත උපාධියක් අරගන්නත් ඇයට හැකියාව ලැබිලා.

"ඊටපස්සේ මං කෙළින්ම ඇමෙරිකාවේ නිව්යෝර්ක්වලට ගියා. ඒ 2000 අවුරුද්දේ. මොකද මට හිතුණා අපේ රටට වැඩිය ඇමෙරිකාවේ මගේ හැකියාවට වටිනාකමක් හදගන්න පුළුවන් වෙයි කියලා. ඒ ගිහින් තමයි 'As I am' කියන සිංදුව මං එළිදැක්වුවේ. ඒක මමම ලියලා මමම සංගීතවත් කරලා මමමයි කිව්වේ. ඒක ඒ රටේ පුදුම විදියට ජනප්‍රිය වුණා. ඊටපස්සේ දිගටම මං සිංදු කළා. ඒ හැම සිංදුවම වගේ ඇමෙරිකාවේ ජනප්‍රියත් වුණා."

ඒ විදියට ප්‍රසිද්ධ ගායිකාවක් වුණු කැරන්ට ගූගල් සිතියමේ පාර කියන්න ලැබිලා තියෙන්නේ අහම්බෙන්.

"දවසක් මං හඬ පරීක්ෂණයකට ගියා. ඒකෙන් මං ඉහළින්ම සමත්වුණා. මොකද එතැනදි මූලිකවම බැලුවේ ඔස්ට්‍රේලියානු සම්භවයක් තියෙන වගේම ආකර්ෂණීය හඬක් තියෙන තරුණියක්. ඉතින් මං කටහඬ හදාගෙන තිබුණු නිසා මට ඒ අවස්ථාව ලැබුණා. මගේ රැකියාව වුණේ ජී.පී.එස්. තාක්ෂණයට හඬ කවන එක."

හැබැයි කැරන්ට රැකියාවේ ස්වාභාවය කියනකොටයි තරු පෙනිලා තියෙන්නේ. ඒත් අභියෝගවලට බය නැති හින්දම ඇය රැකියාව කරන්න පටන් අරන්.



"මුලින් මට තිබුණේ පොඩි ස්ටූඩියෝ එකක පැය පනහක පටිගතකිරීමක්. ඒක ලේසි වැඩක් වුණේ නෑ. ඒත් අමාරු වැඩ සතුටින් කරද්දි ඒ අමාරුකම් නැතිවෙලා යනවා. අන්තිමේ ඒක මට හරිම විනෝදජනක වැඩක් වුණා. දවස් පහක් එකදිගට වැඩ කළා. ඊටපස්සේ පොඩි නිවාඩුවක් ලැබුණා. ඒ විදියට සති තුනක් මං වැඩ කළා."

කැරන්ගේ හඬත් එක්ක ඒ පටිගත කිරීම සාර්ථකව අවසන් වෙලා. හැබැයි ඒ අතරවාරයේ සිදුවුණු රසබර සිදුවීම් නම් ඇයට අමතක කරන්න හරි අමාරුයි කියලයි ඇය කියන්නේ.

**අපිට පාර කියන්න එයාට පැය 50ක් හඬ පටිගත කරන්න වෙලා**



"පටිගත කිරීම් අතරතුර හොඳම සිදුවීම තමයි එකම වචනේ සිය සැරයට වඩා කියන්න වුණු එක. ඒ වචනේ තමයි 'ආසන්න වශයෙන්'(Approximately). ඒ වචනේ තමයි මට ගොඩාක් සැරයක් කියන්න වුණෙත්. ඇයි ඉතින් ආසන්න වශයෙන් තව දුර මෙච්චරයි කිය කියා ගමනාන්තය ඉවරවෙනකල්ම කියන්න එපැයි. මං හිතන්නේ ඒ වචනේ මං 170 සැරයක් විතර කිව්වා."

ගූගල් සිතියම අන්තර්ජාලයට යොමුකිරීමත් එක්ක කවුරුත් බැලුවේ කවුද මේ ආකර්ෂණීය හඬකින් පාර කියන්නේ කියලා. එතකොටලු කවුරුත් දැනගෙන තියෙන්නේ ඒ හඬ වෙන කාගෙවත් නෙවෙයි ප්‍රසිද්ධ ගායිකාවක් වෙන කැරන්ගේ කියලා.

"ඒ දවස්වල මගේ හඬ ඇහුවේ ඇමෙරිකාව යුරෝපය වගේ රටවල්වල මිනිස්සු විතරයි. ඒත් දැන් ඒක ලෝකයේ හැම රටකම මිනිස්සු අහනවා."

කැරන් කියන්නේ ගායිකාවක්, හඬ කැවීමේ ශිල්පිනියක් විතරක්ම නෙවෙයි. 54 හැවිරිදි වියේ පසුවෙන ඇය මේ වෙනකොට අභිප්‍රේරණ උපදේශිකාවක් විදියටත් කටයුතු කරනවා. ඒ වගේම ඇය ලේඛිකාවක්. 2011 අවුරුද්දේ එළිදක්වපු 'Directions for Driving Performance Success' කියන පොත වගේම 2015 අවුරුද්දේ එළිදක්වපු 'The GPS Girl's Road Map for Your Future' පොතත් ලියැවෙන්නේ කැරන්ගේ අතින්.

මේ වෙනකොට කැරන් ආයෙමත් තමන්ගේ උපන රටට ඇවිල්ලයි ඉන්නේ. ඒ හරියටම අවුරුදු විසි ගණනකට පස්සේ. ඒ තනියම නෙවෙයි තමන්ගේ ආදරණීය සැමියයි පුතයි එක්ක. ආරංචි විදියට ඇය දැන් අලුත් වැඩකට අතගහලා. ඒ ව්‍යාපාරික පැත්තට. හැබැයි අලුතින් මොන මොන දේ පටන්ගත්තත් ඇය වැඩිපුරම ආස තමන් තුළ ඉන්න ගායිකාවටයි හඬකැවීම් ශිල්පිනියටයිලු.

"අපි හැමෝම ඉපදෙන්නේ කිසිම දෙයක් නැතුව. ඉතින් අපි විසින්ම තමයි තීරණය කරන්න ඕනේ අපි කොතැනටද අපිව අරගෙන යන්නේ කියලා. එහෙම බැලුවම මට මගේ ගැන ගොඩාක් ආඩම්බරයි. මොකද මං මාව මටවත් හිතාගන්න බැරි තැනකට අරගෙන ගිහින් තියෙනවා."

කැරන්ගේ කතාව ඇත්ත. මොකද ලෝකයේ කටහඬින් ප්‍රසිද්ධ කොච්චර නම් චරිත හිටියත් කැරන්ගේ හඬ මේ ගෙවෙන හැම විනාඩියකම ලෝකේ කවුරුම හරි කෙනෙක් අහනවා. ඉතින් එහෙම බැලුවම ලෝකයේ ජනප්‍රියම කටහඬේ අයිතිකාරිය විදියට කැරන් එලිසබෙත් ජේකබ්සන් ආඩම්බර නොවී කොහොමද?

■ රුවන් එස්.සෙනවිරත්න

## මහාචාර්ය අත්තනායක එම් හේරත් කියයි

# උඩුතොලට ඉහළින් උපන්ලප පිහිටන්නේ අනාචාරයේ හැසිරෙන ගැහැනුන්ගේද?

කුස-පබා කියපු ගමන්ම අපි ගොඩක් අයට එකපාරටම මතක්වෙන්නෙ විරූපී මිනිසෙකුගේ සුරූපී බිරිඳක්නේ. ඔය කුස කියන්නේ ඒ කාලේ ඉන්දියාවේ හිටපු ඔක්කාන රජතුමාගෙයි සීලවතී බිසවගෙයි වැඩිමහල් පුතා. ඔහුට යුද්ධ කරන්න, වීණා වයන්න විතරක් නෙවෙයි පිළිම අඹන්නත් උපන් හපන්කමක් තිබිලා තියෙනවා. හැබැයි ඔය මොන දේ ලබන්න පින තිබුණත් කුසට ලස්සන රූපයක් ලබන්න පින තිබිලා නෑ. කුසගේ මූණත් හරියට කොණ්ඩ කැවුමක් වගේ කියලා අහලා ඇතිනෙ.

හැබැයි කුස ජාතකය කියවන ගොඩක්දෙනෙක් හිතන් ඉන්නේ කුස කියන්නේ සැබෑම ප්‍රේමවන්තයෙක් කියලා.

ඒ කොහොම වුණත් දෙවන පරාක්‍රමබාහු රජතුමා කුස ජාතකය මුල් කරගෙන කව්සිළුමිණට රචනා කරපු කව්වල හැටියට නම් කුස කියන්නේ රාගික චරිතයක් මිසක් සැබෑ ප්‍රේමවන්තයෙක් නෙවෙයි. ඒ වගේම කුස ආදරය කරලා තියෙන්නේ පබාවතීගේ ශරීරයට විතරයි කියලත් කියනවා. කුස තමන් කැමති දේහ ලක්ෂණ සහිත ස්ත්‍රියකගේ පිළිමයක් අඹපු එකත් ඊට අනුව කුමාරිකාවෝ හොයපු එකත් ඊට හොඳම උදාහරණයක් කියලයි කව්සිළුමිණ කතුවරයා කියන්නේ.

**‘දු වන් පියවුරු දුට**
**මහපතරාම මුත් බඹ**
**සියුම් කැම් නොපොහොයි දියබද**
**සඳ විහිදි මැද’**

පබාවතියගේ ශෘංගාරාත්මක හැඟීම් උපදවන උකුල සහ පයෝධරයන් දැකපු අයට හිතුණාලු මේ මහා බ්‍රහ්මයා නම් විශාල කර්මාන්තයන්වලට මිසක සියුම් කර්මාන්තවලට අත තියන කෙනෙක් වෙන්න බැහැ කියලා.

ඒත් ඇගේ සියුම් ඉඟටිය දැක්කට පස්සේ ඒ සැකය දුරුවෙලා තියෙනවා කියලයි ඔය කියන්නේ.

මුලින්ම කුස-පබා ගැන ඔය ටිකත් මතක් කරලාම හිටියේ අද අපි කතා කරන්නෙත් ස්ත්‍රී නාරි දේහ ලක්ෂණ ගැන කතාවක් නිසා.

ඔය අඳුනගන්න බැරිම සතා ගෑනු සතා කියලා ගොඩක් පිරිමි උදවිය කියනවනේ. හැබැයි ඉතින් ස්ත්‍රී දේහ ලක්ෂණ ගැන දන්න කෙනෙකුට ඒක හරියට කජු කනවා වගේ වැඩක්ලු.

**“අතේ සුලැඟිල්ල ඇද නම් ඇය වංකයි.”**

**“පාදයේ සුලැඟිල්ල පොළොවට නොවදී නම් ඇය පින්මද තැනැත්තියක්.”**

**“ඉතාමත් කොට බෙල්ලක් තියෙනවා නම් ඇය දුප්පත්.”**

**“උදරය මහත නම් දරුවෝ වැඩියි.”**

**“ලය පළල් නම් ඇය වෙසඟනක්.”**

**“ලෝම අධික නම් ඇය වැන්දඹුවක්.”**

ඔය කිව්වේ ස්ත්‍රී නාරි දේහ ලක්ෂණ ගැන සඳහන් වෙලා තියෙන කාරණා කිහිපයක් විතරයි. ඇත්තටම මේ කියන විදියට දේහ ලක්ෂණවලින් විතරක්ම ගැහැනියක්ව මනින්න පුළුවන්ද?

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විශ්‍රාමික මහාචාර්ය අත්තනායක එම්. හේරත් මහතා ඒ ගැන කිව්වේ මෙහෙම කතාවක්.

ඔය කාරණාව එදාට වගේම අදටත් ගොඩක් වැදගත්. මොකද කාන්තාව කියන්නේ ජීවිත කාලයම කියෙව්වත් කියවලා ඉවර කරගන්න බැරි පොතක් කියනවානේ. එහෙව් කාන්තාව ගැන ඇගේ අතේ පයේ තියෙන ලපයක්, කෙස් ගහක් දිහා බලලා නිර්වචනය කරන්න බැහැ. අනික ඔය දේවලුත් ආව ගිය තැනක් නොදැන මිනිස්සු ඉතිහාසයත් එක්ක පටලගෙන ඉන්න දේවල් කියලයි මට නම් හිතෙන්නෙ. ඊළඟට ඔය ස්ත්‍රී දේහ ලක්ෂණ කියන පොත්පත්වල ගෑනුන්ගේ ඉහේ ඉඳන් පාදන්තය දක්වාම තියෙන නියපොත්තක් රෝමකූපයක් ගානේම එහෙම වෙන්න හේතු ලියැවිලා තියෙනවා. ඒවත් එක්ක බැලුවම පිරිමින්ට ගෑනුපරාණ ගැන තේරුම්ගන්න වෙන දෙයක් ඕනෙ වෙන්නෙ නැහැ. දැන් ඔය කලින් කියලා තියෙන කුස-පබා කතාවේ කුස කුමාරයත් පබාවතීගේ දේහ ලක්ෂණ ගැන සැළකිලිමත් වුණ කෙනෙක්. ඒවාට ආදරේ කරපු කෙනෙක්. ඒත් කුසගේ ඇත්ත ස්වරූපය ගැන දැනගත්ත හැටියේ පබාවතී දීගෙත් එපා කියලා යන්න ගියේ නැද්ද? හැබැයි එදා කුසටත් පුළුවන් වුණානම් පබාවතී කියන ගැහැනියගේ ගත නැතුව හිත කියවගන්න ඇය ඔහුව අතහැරලා නොයන්නත් තිබුණා.

ඕකට මං තව කතාවකුත් කියන්නම්.

විශ්වවිද්‍යාලේ මගෙන් ඉගෙනගත්ත එක පුතෙක් හිටියා. මේ කොල්ලට කැම්පස් එකේම දුවෙක් එක්ක පෙම්පලහිලව්වකුත් තිබුණා. අන්තිමේදි දෙන්නාගෙම ගෙවල්වලින් මේ ගැන දැනගත්තා. ඒත් අර දුවගේ ගෙදරින් කැමති වුණාට කොල්ලාගේ තාත්තා ටිකක් අකමැති වුණා. හේතුව තමයි උන්දෑ ඔය ස්ත්‍රී දේහ ලක්ෂණ ගැන ඉතාමත් දැඩිව විශ්වාස කරන කෙනෙක්. ඒ නිසා කොල්ලටත් හැමවෙලාවෙම කියලා තියෙන්නෙ ජීවිතේට වාසනාව ගේන දේහ ලක්ෂණ තියෙන කෙල්ලෙක්ව හොයාගන්න කියලලු. මට මතක හැටියට අර දුවගෙත් වම් කකුලේ සුලැඟිල්ල සාමාන්‍ය කෙනෙකුට වැඩිය ටිකක් වෙනස් විදියේ පිහිටීමක් තිබුණා. ඉතින් ඕක තමයි අර තාත්තට පෙනිලා තිබුණේ.

හැබැයි මේ පුතා ඔය කතා විශ්වාස කරලා නැහැ. උපාධිය ඉවර කරලා ගියාට පස්සේ මට ඒ දෙන්නව මුණගැහුනෙ ආපහු අවුරුදු හය හතකින් විතර. ඒ වෙනකොට දෙන්න විවාහ වෙලා දෙන්නටම ගුරුපත්වීම් පවා ලැබිලා තිබුණා. පස්සෙ මං අර පුතාගෙන් තාත්තා ගැන අහනකොට තමයි කීවේ “අනේ සර් අපේ තාත්තා දැන් මටත් වඩා ආදරේ මගේ නෝනට” කියලා. ඒ මදිවට ඒ දුවගේ දේහ ලක්ෂණ නිසා තමයි දැන් එයාගේ පුතණ්ඩියාට කිරි උතුරන්නා වගේ හරියන්නෙ කියලත් පුරාජේරු කියවනවලු. දැන් බලන්න එදා අර පුතා තාත්තගේ මිථ්‍යාවල් විශ්වාස කරලා අච්චර වටින බිරිඳක්ව අතහැරගත්තනම් කොයිතරම් කාටද පාඩුව කියලා.

මේකත් ඒ වගේම එකක්.

මේ කියන කාන්තාව නම් මට දුරකතනයෙන් කතා කරපු කෙනෙක්. ඇය මට කියපු විදියට ඇගේ උඩුතොලට ඉහළින් උපන්ලපයක් තියෙනවලු. ස්ත්‍රී දේහ ලක්ෂණවලට අනුව උඩුතොලට ඉහළින් උපන්ලප පිහිටන්නේ අනාචාරයේ හැසිරෙන ගැහැනුන්ගේ කියලා කතාවක් තියෙනවනේ. ඕක නිසා ඇගේ නැන්දම්මා ඒ කියන්නෙ සැමියාගේ අම්මා නිතරම වගේ ඇයට ඇනුම්පද කියනවලු. ඒ විතරක් නෙවෙයි දන්න අඳුරන පිරිමියෙක් එක්ක හිතවත්කමට කතා කළත් කොල්ලා රස්සාවට ගිහාම අවලමේ යන එකී කියලා අර කාන්තාවගේ මූණට අවලාද කතා කියනවලු. පස්සෙ මම දිගටම ඒ ගැන විස්තර කතා කරනකොට තමයි ඇය මට කිව්වෙ ඒ උපන්ලපය ඇය විවාහ වෙන්නත් කලින්ම රූපලාවණ්‍යාගාරයකට ගිහිල්ලා කෘත්‍රිමව තියාගත්තු එකක් කියලා. ඒ වගක් ගැන නැන්දම්මා දැනගෙන ඉඳලා නැතිලු. එතකොට ඔය කෘත්‍රිම ලපයක් නිසා රටේතොටේ කවුරුහරි අර නැන්දම්මා වගේම ඇයට අපහාස කළානම් ඒක කොයිතරම් වැරදි වැටහීමක්ද?


එහෙම බැලුවම ඉස්සර ගෑනුන්ව උන්දැලගේ දේහ ලක්ෂණවලින් මැන්නත් අද ඉන්න උන්දැලව එහෙම මනින්නත් බැහැනේ. එතකොට අද කාලේ ගැහැනුන්ගෙන් බාගෙට බාගයකගෙම තියෙන්නෙ උපතින් ගෙනාපු දේහ ලක්ෂණත් නෙවෙයි.

උදාහරණයක් විදියට අද කාලේ ඔය පුද්ගලික රෝහල්වල රූපලාවණ්‍ය අංශයකට ගිහින් ගැහැනු පිරිමි කරන එකයි, පිරිමි ගැහැනු කරන එකයි ඇරෙන්න අනිත් සියල්ල තමන්ට ඕන විදියට හදාගන්න හැකියාවක් තියෙනවා. ඒ වගේම ප්ලාස්ටික් ශල්‍ය වෛද්‍යවරුන් විසින් ගැහැනු පිරිමි කරන එක පිරිමි ගැහැනු බවට පත්කරන සැත්කමුත් දැන් ලංකාවේ සිද්ධ කරනවා. අනික ඔය දේහ ලක්ෂණ ගැහැනුන්ට විතරක් නෙවෙයි පිරිමින්ටත් තියෙනවා. හැබැයි සමාජය කවදාවත් කාන්තාව වගේ ඒ අයව දේහ ලක්ෂණවලින් කාණ්ඩ කරලා නැහැ. දැන් බලන්න නිකමටවත් යම්කිසි කාන්තාවකගේ දත් හිදැස් වුණොත් සමහරු කියන්නේ මහත්තයට අපලයි එහෙමත් නැත්තම් ළඟදිම මිනිහා මැරෙනවා කියලා. ඒත් නිකමට හොයලා බැලුවොත් තේරෙයි ඔය නරකයි කියන දේහ ලක්ෂණ තියෙන කාන්තාවෝ කීදෙනෙක් නම් අද කාලේ සාර්ථක ජීවිත ගෙවාගෙන වැදගත් විදියට පවුල් ජීවිත ගතකරනවද කියලා. ඒකෙම අනිත් පැත්ත ඕවා නිසා සමාජය හොඳයි කියන ගැහැනුන්ගෙනුත් කීයෙන් කීදෙනෙකුට ජීවිතේ වැරදිලා තියෙනවාද කියලා.

ඒ නිසා මේ කතාව අවසානෙට මගේ තර්කය වෙන්නේ ඕවා මනඃකල්පිත දේවල් කියන එක.

**පබාවතියගේ උකුල සහ පයෝධරයන් දැකපු අයට හිතුණාලු මේ මහා බ්‍රහ්මයා නම් විශාල කර්මාන්තයන්වලට මිස සියුම් කර්මාන්තවලට අත තියන කෙනෙක් වෙන්න බැහැ කියලා**

■ ලිහිණී මධුෂිකා



# පුළුවන් නම් මේ අහිංසක කෙල්ල ගැන හිතලා පැම්පස් පැකට් කීපයක් අරන් දෙන්න

චලනි කාවින්ද්‍යා කියන්නේ උපතින්ම ආබාධිත ගැහැනු දරුවෙක්. ඇයට ඇවිදින්න බෑ. චලනිගේ වයසට සාපේක්ෂව මොළේ හරියට වර්ධනය වෙලත් නෑ. හැබැයි ඉතින් මොන අඩුපාඩුව තිබුණත් අම්මටයි තාත්තටයි දරුවෝ වටිනවනේ. ඒ නිසයි චලනි ඉපදුණු දා ඉඳලා කොහොමින් කොහොමහරි ඒ කෙල්ලව උස්මහත් කරන්න ඇගේ දෙමව්පියන් උත්සාහ දරලා තියෙන්නේ. හැබැයි ඉතින් මොකක්දෝ අවාසනාවකට ඒ දෙන්නම අකාලයේ මියැදිලා.

එදා ඉඳන් චලනිගේ බර කරට අරන් තියෙන්නේ ඇගේ අයියා. නමුත් නංගිගේ බර ඔහුගේ දෙවුර මතට බර වැඩිවුණු නිසාදෝ ටික දවසකින් ඔහු නංගිව ගෙනැත් කුරුණෑගල පැත්තේ තියෙන වැඩිහිටි නිවාසයකට බාරදීලා.

"මේ දරුවට ඇවිදින්න කරන්න බෑ. රෝද පුටුවේ නැත්නම් ඇඳේ තමයි මුළු දවසම ඉන්නේ. මොළය හරියට වැඩිලත් නැති නිසා කිසිම දෙයක් ගැන තේරුමක් නෑ. කවුරුමහරි කෙනෙක් නිතරම ළඟින් ඉන්න ඕනේ. මං ළඟකට ගියත් කාට හරි බලාගන්න කියලා තමා යන්නේ."

එහෙම කිව්වේ කුරුණෑගල වාසනා උපස්ථාන නිවහනේ භාරකාරිණී රංජනී සෙනෙහෙලතා මහත්මිය. ඇය තමයි මේ වෙනකොට වයස අවුරුදු 14ක් වෙන චලනිට අම්මා වෙලා ඉන්නේ. ඇය කොච්චර හොඳට චලනිව බලාගන්නවද කිව්වොත් චලනිගේ කැත කුණු පවා අයින් කරන්නේ ඇය



අතින්ලු.

"මේ ළමයගේ අම්මයි තාත්තයි දෙන්නම නැතිවෙලා කියලයි මෙහෙට බාරදීපු අයියා කිව්වේ. ගෙවල් මහව පැත්තෙලු. වැඩේ කියන්නේ දැන් මාස කීපයක් ඉඳන් අයියා ගැන ආරංචියකුත් නෑ. ඒ නිසා මං තමයි දැනට මේ දරුවගේ හැමදේම හොයලා බලලා කරන්නේ."

ආබාධ තත්ත්වය, නොතේරුම්කම එක්ක චලනි වැසිකිළි යන්නෙත් ඇඳේමලු. ඒ නිසා නිතරම ඇය ගැන බලන්න ඕනෙලු. ඒකට විකල්පයක් විදියටයි රංජනී මහත්මිය චලනිව පැම්පස්වලට හුරුකරවලා තියෙන්නේ.

"දැන් ටික කාලෙක ඉඳන් දරුවට පැම්පස් අන්දවනවා. මොකද සැරින් සැරේට ඇඳ උඩ මළමුත්‍රා කරද්දි ඒවා අස්පස් කරන්න ලොකු වෙලාවක් යනවා. ඒක මටත් ලොකු අපහසුවක්. ඒ වගේම දරුවටත් අපහසුවක්. ඉතින් පැම්පස් අන්දන එක හැම පැත්තෙන්ම හොඳයි. ගොඩාක්ම දරුවගේ පැත්තෙන් හොඳයි."

හැබැයි දැන් රංජනී මහත්මිය ඉන්නේ ප්‍රශ්නයක. ඒ තමයි මේ වෙනකොට පැම්පස්වල අධික මිල. ඒක ඇයට දරාගන්න අමාරුයිලු. මොකද ඇයත් මේ දේවල් කරන්නේ අසරණයින්ට පිහිටවීමේ ගුණයෙන් ඇය පොහොසත් හින්දා මිසක් මුදල් හදල්වලින් පොහොසත් හින්දා නෙවෙයි.

"මට චලනිව බලාගන්න බැරි නෑ. ඒත් පැම්පස්වලට යන මිල දරාගන්න මට අමාරුයි. මට මුදලින් කීයක්වත් ඕනේ නෑ. මං ඉල්ලන්නේ පුළුවන් කෙනෙක් ඉන්නවා නම් මේ අහිංසක කෙල්ල ගැන හිතලා පැම්පස් පැකට් කීපයක් අරන් දෙන්න."

රංජනී මහත්මිය කියපු විදියට චලනිගේ වයසත් එක්ක ඇයට ළමා පැම්පස් එක නම් දැන් මදිලු. ඇයට ගැළපෙන්නේ වැඩිහිටි පැම්පස් එකේ මීඩියම් ප්‍රමාණය. එහෙම පැම්පස් පැකට් කීපයක් ලැබුණොත් ඒක ලොකු දෙයක් කියලයි රංජනී මහත්මිය කිව්වේ.



"මේ දරුවට මං හරි ආදරෙයි. නිතරම රෝදපුටුවේ නැත්නම් ඇඳේම ඉන්න හින්දා පුළුවන් හැටියට වඩාගෙන එහෙමත් ඉන්නවා. ඉතින් මේ දරුවගේ අනාගතේ වෙනුවෙන් කාට හරි යමක් කරන්න පුළුවන් නම් ඒකත් ලොකු දෙයක්."

කාට වුණත් කුරුණෑගල වාසනා උපස්ථාන නිවහනට ගියොත් චලනි ඉන්න තත්ත්වය ඇස් දෙකෙන්ම බලාගන්න පුළුවන්. නැත්නම් 0713390563 නොම්මරේට කතා කළොත් රංජිනී මහත්මියගෙන් චලනිගේ විස්තර දැනගන්න පුළුවන්. ඉතින් මේ දරුවටත් පුළුවන් හැටියකට පිහිටවෙමු කියලයි අපි ඔබෙන් ඉල්ලන්නේ.

■ රුවන් එස්.සෙනවිරත්න



beauty



# අයිස් ගහන කෙල්ලො කැතවෙලා අයිස් ගාන කෙල්ලො ලස්සන වෙන්නෙ කොහොමද

මම මේ වීඩියෝ එක දැක්කෙ යූටියුබ් එකෙන්. සුපිරි ඉන්දියානු නිළි දීපිකා පදුකෝන් 2023 ඔස්කාර් සම්මාන උළලේ ඉදිරිපත් කරන්නියක් විදියට සහභාගී වුණා. ඇය ඔස්කාර් උළෙලට යන්න සැරසෙන විදියයි ඒ වීඩියෝ එකේ තිබුණේ.

ඔන්න නැගිට්ට හැටියේ දීපිකා කළේ ව්‍යායාම. ඊටපස්සේ දීපිකා ඇගේ මූණ අයිස් පුරෝපු සින්ක් එකකට එබුවා.

**"මම හැමදම උදේට මේ වැඩේ කරනවා. ඇත්තටම මූණ අයිසින් කරන්න මම හරිම කැමතියි."**

ටික වෙලාවකින් අයිස් කැට ගොඩෙන් මූණ උඩට ගත්තු දීපිකා පදුකෝන් එහෙම කිව්වා. දීපිකා හැමදම කරනවය කියන ඔය සත්කාරයේ නම ෆේෂල් අයිසින් (Facial icing). දීපිකා විතරක් නෙමෙයි කත්‍රිනා කායිෆ්, ආලියා බාත්, තමන්නා භාතියා වගේ සුපිරි බොලිවුඩ් නිළියෝ විතරක් නෙමෙයි හොලිවුඩ්වල සුපිරි තරු රිහානා, ලේඩි ගාගා, කයිලි ජෙනර් වගේ අයත් එයාලගේ දවස පටන්ගන්නේ මූණ අයිසින් කරලා. ඒ අය මූණු අයිසින් කරන වීඩියෝ යූටියුබ් එකෙන් බලන්න පුළුවන්.

**"රංගන ශිල්පීන්ගේ සම ගොඩක් වෙහෙසට පත්වෙනවා. ඉතින් සම නැවුම්ව තියාගන්න ඒ අයට මම ෆේෂල් අයිසින් සත්කාරය නිර්දේශ කරලයි තියෙන්නේ."**

ඒ චර්ම රෝග විශේෂඥ වෛද්‍ය රශ්මි ශෙට්ටි. දීපිකා පදුකෝන්, කත්‍රිනා කායිෆ් වගේ නිළියන්ගේ පෞද්ගලික චර්ම විශේෂඥවරිය ඇයයි.

හොලිවුඩ්වල, බොලිවුඩ්වල ඉන්න නළු නිළියෝ වෛද්‍ය අනුමැතිය නැතිව මූණේ එහෙමට කියලවත් දෙයක් ගාන්නේ නැතිලු. ඉතින් එහෙව් එකේ එයාලා කරනවා කියන මේ අයිස් සත්කාරයෙන් හැබෑ ප්‍රතිඵල තියෙනවා කියන එක සහතිකයි. ඕක දන්න නිසාමද කොහෙදෝ දැන් අපේ රටේ ගොඩක් බවලතියෝත් මූණේ අයිස් ගානවා. ලස්සන වෙන්න හරි විදියට අයිස් ගාන්නේ කොහොමද කියන එක ගැන කතා නොකරම බැරි ඒකයි.

අයිස් කියන්නේ බොහොම සීතල දෙයක්නේ. ඉතින් අයිස් කැටයක් සමේ තිබ්බාම ඒ සීතලට සමේ රුධිර කේශනාලිකා සංකෝචනය වෙනවා. එතකොට ටික වෙලාවකට අපේ රුධිර සැපයුම අඩුවෙනවා. එහෙම වෙලා ඔන්න ඊගාව ක්ෂණයෙදි ආයෙත් රුධිර ගමනාගමනය තිබුණටත් වඩා වැඩිවෙනවා. මූණට ලැබෙන රුධිර සැපයුම වැඩිවුණාම හානිවෙච්චි කොලැජන්වලට නැවත පුනර්ජනනය වෙන්න ලේසියි. එතකොට මූණේ තියෙන රැළි, ලප, රතු වෙච්චා, ඉදිමිච්චා ඉක්මනින්ම ඉවත් වෙනවා. සමහරුන්ගේ සමේ දෙඩම් ලෙල්ලක වගේ පුංචි සිදුරු තියෙනවා. අපි ඕපන් පෝර්ස් කියන්නේ. අන්න ඒ සිදුරු වහන්නත් අයිස්වලට පුළුවන්. ඒ වගේම තෙල් සහිත මූණකට මේ සත්කාරය පංකාදුයි. මූණෙ තෙල් අඩු කරලා කුරුලෑ අඩු කරන්නත් අයිසින් වැඩේට පුළුවන්.

වැඩේ කියන්නේ අයිස්වලින් සමට ලැබෙන ඔය ප්‍රයෝජන ටික ඒ කාලේ උදවියත් දැනගෙන ඉඳලා තියෙන එකයි. ඊජිප්තුවේ ක්ලියෝපැට්‍රා, නෙෆර්ටිටි වගේම මර්නෙයින් රැජිනියන් සම ලස්සන කරගන්න හිම කැට ආලේප කරලා තියෙනවාලු. ඒ විතරක් නෙමෙයි ශරීරයේ සම පැහැපත් කරගන්න ක්ලියෝපැට්‍රා රැජින හිම සහිත ජලයෙන් ස්නානය කළා කියන්නත් සාක්ෂි තියෙනවා.

හැබැයි ඉතින් හරි විදියට මූණට අයිස් ගෑවේ නැත්තම් සමේ කේශනාලිකා විනාශ වෙන්න පුළුවන්. එතකොට සම රතු වෙන්න, වියැළෙන්න විතරක් නෙමෙයි සමට හානිවෙලා හයිපර් රැෂ් තත්ත්වයක් වුණත් ඇතිවෙන්න පුළුවන්.

හරි විදියට මූණු අයිසින් කරන විදියත් දැන් අපි කියලා දෙන්නම්. මූණු අයිසින් කරන්න පුළුවන් ක්‍රම කිහිපයක් තියෙනවා. දීපිකාලා, කත්‍රිනාලා වගේ මූණ අයිස් බේසමකට ඔබන එක එක ක්‍රමයක්.

ඒක කරන්නේ මෙහෙමයි. හොඳට පිරිසිදු කරපු මූණ ඔබන්න පුළුවන් ප්‍රමාණයේ වතුර බේසමක් ගන්න. ඒකට අයිස් වතුර ටිකක් දාලා අයිස් කැට 10/15ක් වගේ දාගන්න. අයිස් කැටවලින් විතරක් බේසම පුරවගන්න පුළුවන් නම් ඒත් කමක් නැහැ. මුලින්ම ක්ලෙන්සර් එකක් හරි ෆේෂ්වොෂ් එකක් හරි පාවිච්චි කරලා මූණ හොඳට පිරිසිදු කරගන්න. ඊටපස්සේ අර අයිස් පුරෝපු භාජනයට මූණ ඔබන්න. තත්පර 10ක් ඉඳලා මූණ උඩට ගන්න. හොඳවැයින් හුස්මක් අරගෙන ආයෙත් තත්පර 10කට මූණ දාන්න. ඒ ඇති. මේ සත්කාරය උදේට කරන එක වඩා හොඳයි කියලයි චර්ම වෛද්‍යවරු කියන්නේ.

ඊගාවට අයිස් කැට සත්කාරය කරන ගොඩක් දෙනා වැරදියට කරන්නේ මෙන්න මේක. මේකට සාමාන්‍ය අයිස් කැට යොදාගන්න පුළුවන්. අයිස් කැට අල්ලන්න කලින් අත් දෙකයි මූණයි හොඳට පිරිසිදු කරගන්න. ඊටපස්සේ අයිස් කැටයත් අරගෙන පිරිසදු ටිෂූ එකක හරි කොටින් කෑල්ලක හරි තියලා කවාකාරව සම සම්බාහනය කරන්න.

ටිෂූ නැත්නම් රෙදි නොතියා අයිස් කැටය පාවිච්චි කරන්නත් පුළුවන්. ඒ මෙහෙම. මුලින්ම මූණ අයිස් වතුරෙන් සෝදගන්න. ඊටපස්සේ අයිස් කැටය අරගෙන අත මෘදුව තියාගෙන වේගයෙන් සම කවාකාරව සම්බාහනය කරන්න. හැබැයි කිසිම වෙලාවක අයිස් කැටය එකම තැන තියාගෙන ඉන්න එපා. කොටින්ම කිව්වොත් මිනිත්තුවකට වඩා අයිස් කැටය සම මත තියාගෙන හිටියොත් සමට හානිවෙන්න පුළුවන්. සංවේදී සමක් තියෙන කෙනෙක් නම් සමට සෘජුවම අයිස් කැට ගාන්නම එපා. ඒ අයට ගැළපෙන්නේ අර කලින් කියාපු විදිය.

අයිස් කැට සත්කාරය උදේම කරන්න. නැත්නම් රෑට නිදාගන්න කලින් කරන්න. දවසකට තුන් හතර වතාවක් මූණෙ අයිස් ගාන්න කියලා යූටියුබ් රැජිනියෝ කියනවා. හැබැයි දවසකට එකපාරකට වඩා මූණ අයිසින් කරන්න එපා කියන එකයි වෛද්‍ය මතය. මූණ අයිස් කරපු හැටියේ සීරම් එකක් නැත්නම් ෆේස් ලෝෂන් එකක් ගාන්න. ඒ මොනවත් නැත්නම් කෝමාරිකා ටිකක් වුණත් කමක් නැහැ.

සාමාන්‍ය අයිස් කැටවලින් වගේම ඒ ඒ සමට ගැළපෙන සත්කාරවලින් හදගනිපු අයිස් කැටවලිනුත් සම අයිසින් කරන්න පුළුවන්. එහෙම හදගන්න පුළුවන් සත්කාර කිහිපයක් දැන් බලමු.

කෝමාරිකා පිත්තක් බ්ලෙන්ඩ් කරලා අයිස් ට්‍රේ එකකට දාගන්න. ඒ මැදට ඉරටුවක් හරි ටූත් පික් එකක් හරි දාගන්න. අයිස් කැට සත්කාරය කරනකොට ඒක අතින් අල්ලගෙන ඉන්න බෑ කියන අයටයි ඒ විසඳුම කිව්වේ. අයිස් ට්‍රේ එකකට බැරි නම් පොප්සිකල් අච්චුවකට මිශ්‍රණය දාගත්තාත් කමක් නෑ. එතකොට පාවිච්චි කරන්න ලේසියි. හදාගත්තු මිශ්‍රණය මිදුනට පස්සේ මූණේ ගාන්න. අව්වෙන් හානිවුණු සමට මේ සත්කාරය කදිමයි. හැබැයි අව්වේ ගිහින් ආපු හැටියේ මුණේ අයිස් ගාන්න යන්න එපා. ඒකෙන් සමට තවත් හානිවෙන්න පුළුවන්. අව්වේ ගිහින් ඇවිත් ටික වෙලාවක් ඉඳලයි මූණ අයිසින් කරන්න ඕනේ.

ඊගාවට තක්කාලි ගෙඩියක් අරන් ඒකට වතුර දාලා බ්ලෙන්ඩ් කරලා ඒ ජූස් එකෙන් අයිස් කැට හදාගන්න. මේකත් අව්වෙන් හානිවුණු සමට අපූරුයි.

පිපිඤ්ඤා ගෙඩියක් අරගෙන ඇට පිටින්ම බ්ලෙන්ඩ් කරලා ඒ යුෂවලින් අයිස් කැට හදාගන්න. නැවුම් කිරිවලට මී පැණි එකතු කරලා අයිස් කැට හදාගන්න. මේ සත්කාර දෙකම සාමාන්‍ය වගේම වියළි සමට හොඳයි.

ඊගාවට බලමු කුරුලෑ තියෙන තෙල් සහිත සමට හොඳ සත්කාරයක්. ඉදුණු තක්කාලි ගෙඩියක්, කෝමාරිකා, රෝස වතුර එකතු කරලා බ්ලෙන්ඩ් කරගෙන අයිස් කැට හදාගන්න.

නැවුම් කිරිවලට කෝපි මිශ්‍ර කරලා අයිස් හදාගන්න. කුරුලෑ තියෙන අයට වගේම පිග්මන්ටේෂන් තියෙන අයටත් මේ සත්කාර හොඳයි.

කොහොඹ කොළ හොඳට බ්ලෙන්ඩ් කරලා පෙරාගෙන අයිස් කැට හදාගන්න. කුරුලෑ තියෙන අයට මේ සත්කාරයත් පංකාදුයි.

නිල් කටරොලු මල් ටිකක් උණුවතුරේ දාලා ඒක නිවුණට පස්සේ අයිස් කැට හදාගන්න.

අයිස් කැට ගාද්දි මිනිත්තු 5ක් විතර ගෑවහම ඇති. හරි විදියට කරනවා නම් දිනපතාම මූණ අයිසින් කළාට කමක් නැහැ. මූණ අයිසින් කරනකොට ඇස් යට සහ දෙතොල් එහෙමත් මෘදුව සම්බාහනය කරන්න. රුධිර සංසරණය ක්‍රමවත් වෙන නිසා ඇස්වල අඳුරු ගතිය වගේම දෙතොල්වල අවපැහැය ඉවත් කරන්නත් අයිස් සත්කාරය උදව්වක් වේවි.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

# සමහරුන්ට පවුල මතක් වුණේ හොඳටම වැරදුණාම

**සැමියා දහම් සහ දරුවෝ තිදෙනා සමඟ ජපානයේ ජීවත්වන හෂිනි මනමේන්ද්‍ර ඇගේ ජීවිත අත්දැකීම් ඇසුරින් අපිට කියාදෙන්නේ විශේෂයෙන්ම 'පවුල' නමැති සම්බන්ධතාවයට මූලිකත්වය දීම සහ එය රැකගැනීමේ ඇති වැදගත්කමයි. එමෙන්ම ඕනෑම හොඳ හෝ නරක සිදුවීමකටම පසු සතුට විය හැකි කාරණා පමණක් ජීවිතයට එක් කරගැනීමෙන්, බලා සිටියදී පවුල් ජීවිතය සතුටින් පිරී ඉතිරී යන අයුරු ඇය කියන්නේ සතුටින් ජීවිතය දරණ ඇගේ ජීවන අත්දැකීම් සමුදාය මුල්කරගෙනය.**

සමහර පවුල් තියෙනවා, තමන්ගේ කෙනෙකුට ජීවිතේ වැරදිලා පවුලේ කෙනෙක්ගෙන් උදව්වක් ඉල්ලුවාම කියනවා 'වැරදුණාම තමයි අපිව මතක් වෙන්නේ කියලා'. ඉතින් ඒකනේ ඇත්ත. වැරදුණාම මතක් වෙන්න, උදව් ඉල්ලන්න, විනිශ්චය නොකරන්න තමයි පවුල කියලා ඒකකයක් මේ ලෝකෙට බිහිවෙලා තියෙන්නේ.

පවුලේ කෙනෙකුට දුකක් කරදරයක් වුණාම කොන්දේසි විරහිතව ඒ වෙනුවෙන් පෙනී හිටින්න බැරිනම් ඇත්තටම පවුල කියලා එකක් තිබිලා මොකටද?

මගේ ජීවිතෙත් එක කාලයක් තිබ්බා හැමදේම එපාවෙලා ගියපු, මට මාවම එපාවුණු, කිසිම දේක හොඳක් නොදැකපු, මගේ පවුල් ජීවිතේ පවා නීරසවුණු. ඒත් අද තත්ත්වය සෑහෙන්න වෙනස් වෙලා. මේ ලෝකේ මට තියෙන වටිනම දේ මගේ පවුල කියලා මං දැන් දන්නවා. නිකන්ම නිකන් අකුරු තුනකට සීමා නොවුණ, මේ ලෝකේ තවත් එක සුන්දරම හැඟීමක් තමයි පවුල කියන්නේ.

ගොඩක් වෙලාවට අපි හැමෝම අවධානය දෙන්නේ හොඳ දේට වඩා නරක දේට. ඒක මනුෂ්‍ය ස්වභාවය කියලා කියනවනේ. එහෙම වෙද්දි විඳින්න තියෙන ලස්සනම දේවල් පවා අපිට පේන්නේ විඳවන දේවල් ගානට. මේ හැමදේකම වෙනස මට තේරෙන්නේ, වෙන මොකුත් නිසා නෙවෙයි, මේ අත්දැකීම් ලබලා එතැනින් ගොඩ ආපු කෙනෙක් නිසා. වැරදි වෙලා, මගේ ආත්මගෞරවයට හානිවෙන විදියට හැසිරිලා, මට ආදරේ කරන අයට එපාවෙන විදියට ඉඳලා, වැරදි දේම හරි කියලා හිතලා, මගේ වගේම තවත් ජීවිත විනාස කරන්න ගියපු කෙනෙක් මම. ඒ හැමතැනදිම මගේ වැරදි තේරුම් අරන් මාව නිවැරදි කරගන්න, මට නොපෙනුණ බලවේගයක් තිබුණා කියලා මට දැනුණා. අද ඒ නොපෙනුණ බලවේගය මගේ පවුල කියලා අද මං දන්නවා.

මං මානසිකව වැටිලා ඉඳිද්දි, මං විඳවද්දි මාව අතාරින්නැතුව ආදරේ දුන්නේ, හරි වැරදි පෙන්නලා ජීවිතේ දිහා ලස්සනට බලන්න හුරුකළේ මගේ පවුල. වැටුණු වෙලාවේ මං තනිවෙලා නෑ කියලා දැනෙන්න දීපු ඒ හැඟීමයි මාව ශක්තිමත් කළේ. "උඹ කරගත්තුවාට උඹම විඳවපන්" කියලා නොකියා, "ආයේ අලුතෙන් පටන්ගමු, මං ඉන්නවා ඔයාට, මං ඉන්නකන් මොකුත් වෙන්නේ නෑ" කියපු වචන තමයි මගේ හයියට හිටියේ.

අද වෙද්දි මං තේරුම් අරන් තියෙනවා පවුලේ සහයෝගය ලැබෙද්දි, තනි නොකරද්දි හිතට එන ශක්තියෙන් ලෝකෙම වුණත් දිනන්න පුළුවන් කියලා. මුළු ලෝකයක් එරෙහි වුණත් තමන් වෙනුවෙන් ඉන්න තමන්ගේ පවුල ඉන්නකන් ඒ හැමදේකටම ශක්තිමත්ව මූණ දෙන්න පුළුවන් කියලා. අමාරු පාරක වුණත් විශ්වාසයෙන් අඩිය තිය තිය ඉස්සරහට යන්න පුළුවන් කියලා.

ඒ නිසා පුළුවන් නම් මෙන්න මේ ටික හිතට ගන්න. පවුලේ කෙනෙකුට බාහිර සමාජය හෝ බාහිර පුද්ගලයෙක් එක්ක ප්‍රශ්න තියෙද්දී, 'මග හිටියොත් අඹු නසී ගෙදර ගියොත් තෝ නසී' වගේ හිතෙන තැනට වැඩ සිද්ධ කරන්නේ නැතුව ඉන්න. පිටස්තර මිනිස්සුන්ගේ පිහි පාරවල් වගේ වචනවලට, ඇනුම් බැනුම්, රැවුම් ගෙරවුම්වලට තුවාල වෙච්ච මනුස්සයෙකුට දිවි නහගන්නේ නැතුව ජීවත්වෙන්න තියෙන හොඳම හේතුව තමන්ගේ පවුල බවට පත්කරගන්න. බාහිර ලෝකයට හොඳ මනුස්සයෙක්, හොඳ ගැහැනියක් වෙන්න කලින් තමන්ගේ පවුලට එහෙම කෙනෙක් වෙන්න. තමන්ගෙ කියන සනුහරෙන්ම ප්‍රතික්ෂේප වුණු කෙනෙක් ලෝකෙට හොඳ වුණා කියලා ඇති පලේ මොකක්ද? අනික එහෙම වෙන්න පුළුවන්ද? ඒ නිසා තමන්ගේ පවුල ඇතුළේ හිත් ගිනි තියන කෙනෙක් නොවී හිත් නිවන කෙනෙක් වෙන්න උත්සාහ කරමු.

**තමන්ගෙ කියන සනුහරෙන්ම ප්‍රතික්ෂේප වුණු කෙනෙක් ලෝකෙට හොඳ වුණා කියලා ඇති පලේ මොකක්ද? අනික එහෙම වෙන්න පුළුවන්ද?**

ඔයා අම්මා කෙනෙක් හරි තාත්තා කෙනෙක් හරි වෙන්න ඇති. එහෙම නැත්තම් සහෝදරයෙක් සහෝදරියක් වෙන්න ඇති. නෑනෙක් මස්සිනෙක් වෙන්න ඇති. බිරිඳක්, සැමියෙක් වෙන්නත් ඇති. දුවෙක් පුතෙක් වෙන්න ඇති. මේ මොන චරිතෙට පණ දුන්නත් හැමවෙලේම මතක තියාගන්න පවුල ඇතුළේ මේ මොන සාමාජිකයෙක්ට හරි සහයෝගය ඕනම තැනදි ඒ සහයෝගය දෙන්න. මනසින් වැටිලා ඉඳිද්දි ශක්තිමත් කරන්න. කවුරු නැතත් අපි ඉන්නවා කියන හැඟීම දැනෙන්න දෙන්න. පවුල කියන්නේ ශක්තිමත් බැඳීමක්. ඒ බැඳීම ඇතුළේ පවුලේ කිසිම සාමාජිකයෙක්ට, අපහසුතාවයට පත්වෙන්න නොදී සැහැල්ලුවෙන් ඉන්න ඉඩපහසුව සලසන්න. ඒකෙන් දෙමාපියන්ගේ දරුවන්ගේ සම්බන්ධකම් ශක්තිමත් වේවි. සහෝදර සහෝදරියන්ගේ බැඳීම් ආදරණීය වේවි. බිරිඳ සැමියා අතර අවබෝධය, තේරුම්ගැනීමේ හැකියාව වර්ධනය වේවි. පිටින් එන ඕනම ප්‍රශ්නයකදි එකිනෙකා වෙනුවෙන් ශක්තියක් වෙලා පෙනී හිඳීවි. කිසිම මොහොතක දුර්වලවීමට අවස්ථාව නොතියාවි.

මේ පින්තූරේ ඉන්නේ මගේ ලෝකේ සතුටෙන් පුරවන සුන්දරම හේතු හතර. ඇත්තමයි මේ හිනාවල් මාව ජීවත් කරනවා. ලස්සනට ජීවත්වෙන්න උගන්නවා. පවුල කියන්නේ අකුරු තුනක් නෙවෙයි විඳින්න පුළුවන් ලස්සන හැඟීමක් කියලා තේරුම් කරනවා.

මේ හතරදෙනාගේ හිනාවලට මගේ මූණේ හිනාව අලුත් වෙනවා. හැම පවුලක් ඇතුළෙම ඒ සැනසීම අඩු නැතුව දැනේවා කියන එකයි මගේ ප්‍රාර්ථනාව.

■ හෂිණී මනමේන්ද්‍ර





# ඈ මසර්යි

බියංකා නානායක්කාර ලියයි

127 කොටස

# මගෙ හිතේ එක්කෙනයි ඉන්නෙ... එතන්ට ආයෙ කාටවත් එන්න බෑ

චතුමිණීගේ ප්‍රශ්නය ගණන් නොගත්තාසේ තේනුක තෙන්නකෝන් හැසිරුණේය. ඒ නිසා චතුමිණීගේ හිත නොඉවසිලිමත් වුණාය. ඇය ඔහු සමීපයට විත් මූණෙන් මූණ බලා හිටගත්තාය.

**"ඔයා ඒක ගලවලා සාක්කුවේ දගත්තා නේද..? ඇයි තේනුක අයියා එහෙම කළේ? මං කොච්චර ආදරෙන්ද ඔයාට ඔය තෑග්ග ගත්තේ? කොච්චර ආදරෙන්ද ඔයාගෙ කරට මාලේ දැම්මේ? අනේ ඒක දගන්න අයියෝ..."**

චතුමිණීට ඕනැවුණේ ගුරුසාමි දුන් බව කියන උපදෙස්වලට අනුව තුන්වරුවක් හෝ එකදිගට ඔහුගේ කරට මාලය දමන්නටයි. උපදෙස් දී තිබුණේ සුරය පපුවෙහි ස්පර්ශය වීමෙන් වැඩි බලයක් ලැබෙන බවයි.

**"ඔයා දැන් මට තෑග්ග දීලා ඉවරනේ. ඒක මං ගාව තියෙනවා. තෑග්ගක් දුන්නට පස්සෙ මං දැක්කමයි ආයෙ ඒ ගැන හොයනවා..."**

තේනුක තෙන්නකෝන් කීවේ විහිලුවක ස්වරූපයෙනි. මෙතැනනින් යනතුරු මාලයට වූ හරි දේ ඇය දැන නොසිටීම හොඳ බව තේනුකගේ හිත කීවේය.

**"එහෙම නෙවේ. දැන් මට පේන්න හරි දන් ඉන්නකෝ අයියෝ..."**

**"ඒ මොකටද?"**

**"මං දුන්න තෑග්ගක් නිසා."**

**"ඉතින් ඇයි ඔයා ඒ වගේ තෑග්ගක් මට දුන්නේ? මං ඉල්ලුවාද? නෑනේ. ඇයි ඔයා දන්නෙ නැද්ද මං ඔය මාල, වළලු දන අනිත් පිරිමින්ට වඩා වෙනස් කියලා?"**

තේනුක තෙන්නකෝන් හා චතුමිණී අතරේ වන කතාව සෙනුකාට සහ සෙනෙහෙලතා මැණිකේට ඇසුණද ඔවුන් ඊට මැදිවූයේ නැත. චතුමිණී ඔහුට දුන් උපන්දින තෑග්ග මොකක්දැයි ඔවුන් නොදුටුවද මේ කතාබහ ඒ ගැන දැනුවත් කළේය. අඩුමතරමේ චතුමිණී සොහොයුරාට දෙන්නට තෑග්ගක් ගන්නට පෙර ඒ ගැන කතා කළා නම් ඔහු මාලවලට ආසා නැති අයෙකු බවට ඇයව දැනුවත් කරන්නට තිබුණු බවට සෙනුකාට සිතුණි.

**"ඔයා දුන්න තෑග්ග තෑග්ගක් විදියට මං ළඟ තියෙයි චතු. හැබැයි මං ඒක දන එකක් නම් නෑ... මං මේ කියන්නෙ ඇත්ත. අපි ඇත්ත දැනගෙන ජීවත්වෙනකොට ජීවත්වෙන්නත් ලේසියි..."**

තේනුක තෙන්නකෝන් කීවේ වෙනසක් නැතුවය. ඒත් චතුමිණීගේ හිත ඒ කතාවෙන් සම්පූර්ණයෙන්ම කඩාවැටිණි. මේ තරම් වියදම් කර ඔහුට මාලයක් ගෙන දුන්නේ ගුරුසාමිගේ සුරය ඔහුට දන්නට උවමනා නිසාය. දැන් ඒ උත්සාහය වතුරේය. චතුමිණීට ඒ ගැන සමන්තිනී හා කතා කරන්නට උවමනා විය.

**"ඔයා දුෂ්ට එකේ උපරිමය. මේ මගේ හිත රිදෙයි කියලා හරි අද දවසෙවත් මං දුන්න මාලේ දාගෙන ඉන්න තරම් ඔයාට එහෙම හිතක් නෑ. කමක් නෑ තේනුක අයියා..."**

චතුමිණී ආපසු හැරුණේ දුකට, කේන්තියට සග පැරදුමට නෙතට ඉනූ කඳුළින් නෙතු බොඳවෙද්දීය. ඈ සමන්තිනී සොයායන්නට ආපසු හැරෙද්දී පසෙක සිටි සෙනුකා චතුමිණීගේ උරයෙන් අත තිබ්බාය.

**"මල්ලිගෙ හැටි දන්නවනේ. හිත නරක් කරගන්න එපා චතු. එයා ඕක විසි කරන්නෙ නෑ..."**

සෙනුකා චතුමිණී ගැන දුක සිතී ඈ සනසන්නට කීවද චතුමිණී කතා නොකරම විසිත්ත කාමරය දෙසට ගියාය.

කුරුලු රැනක් කෑ ගහගෙන යන හඬ ළඟින්ම ඇසුණේ මුළුතැන්ගෙයි දොර තිබුණේ උද්‍යානයට නිසාය. සෙනෙහෙලතා මැණිකේ හෝ සෙනුකා කිසිවක් කියන්නට පෙර තේනුක තෙන්නකෝන් ඒ දොරින් එළියට බැස්සේය. මද උස් අඹ සහ චෙරී ගස්වල පලදරා තිබුණේ ඇසට ආසා හිතෙන ලෙසිනි. මනාව සකසා තිබූ තණ වැවූ කොටස් මගහැර යායට මල් පිපෙන සීනියාස්, දස්පෙති සහ රාජ පොහොට්ටු මල් පාටින් පාටට පිපී තිබුණි. රෝස පාට ලොකු මල් පිපුණු වංගලි රෝස පඳුර අද්දර වූ සිමෙන්ති බංකුවෙන් තේනුක ඉඳගත්තේ මේනක තෙන්නකෝන්ට ඇමතුමක් ගන්නටයි. එක්වරක් වැදෙද්දී ඇමතුම ඔහු ගත්තේය.

**"චතු එහෙම ඔය කිට්ටුව නෑ නේද...?"**

**"නෑ ඇයි... මං දැක්කා සමන්තිනී නැන්දම්මත් එක්ක ලොකු කතාවක්..."**

**"අර ඔයාගේ කරට මං දාපු මාලේ දැනට ගලවලා කොහෙන් හරි අරන් තියාගන්න. ඕක මගේ කරේ නෑ කියලා මෙතන පැටලිලා ආවේ. එයා හිතන් ඉන්නෙ මං ගලවලා සාක්කුවේ දන් කියලා..."**

මේනකගේ අත කරට ගියේ වටපිටටද ඇස් කැරකෙද්දීය. කිසිවෙක් පේන්නට නැත. මේනක මාලය කරෙන් පන්නා අල්ලේ ගුලි කරගෙනම නැගිට්ටේය. වාසනාවට සේ නිකම්ම ලැබුණ ලක්ෂ ගාණක තෑග්ග නැති කරගන්නවාට වඩා ප්‍රවේසම් කරගැනීමේ වටිනාකම කාටත් වඩා මේනක දන්නේය. ඒ මතු දවසක මේ තෑග්ග මුදල් කළ හැකි නිසාය.

**"හරි හරි මං මේක කාමරේ අල්මාරියටම දගන්නම්."**

**"අදට විතරක්. අදට කියන්නේ මං මෙහෙන් යනකම් විතරක්... ඊටපස්සෙ දැකලා ඇහුවොත් කියන්න මං දුන්නා කියලා. කිසි ප්‍රශ්නයක් නෑ."**

**"ඔයාට තේරෙන්නෙ නැද්ද චතු ඔයාට ආදරෙයි කියලා? ඒකනේ මේ ලක්ෂ ගාණක් වටින තෑග්ගකුත් දුන්නේ..."**

මේනක තෙන්නකෝන් ඇසුවේ සහෝදරයාගේ හිත බලන්නටත් එක්කය.

**"ඒක තේරෙන හින්ද තමා එයාගේ තෑගිවලට මං කැමති නැත්තේ... ඔයාට ඕනි නම් සෙට්වෙන්න. මං මොකෝ ඔයා මොකෝ... මට මේ කරදරෙන් ගැළවෙන්නත් ලේසියි එතකොට..."**

තේනුක තෙන්න්නකෝන් කීවේ සිනාසෙමිනි. සෙනුකා ඔහු සිටිතැනට එනු පෙනෙද්දී තේනුක සොහොයුරා හා වූ ඇමතුම අවසන් කළේය.

**"කවුද ගෑනු ළමයද කතා කළේ..?"**

ඔහු දුරකතනය සාක්කුවට දමාගෙන සොහොයුරිය හා සිනාසෙද්දී සෙනුකා ඇසුවේ ඒ අසළින් ඉඳගන්නා ගමන්ය.

**"නෑ... අයියා එක්ක..."**

තේනුකට මාලේ සිද්ධිය සෙනුකාට කිව යුතු බවට ක්ෂණිකව සිතුණ නිසා කීවේය.

**"මේනක එක්ක..?"**

**"ඔව්..."**

**"එයත් එක්ක දැන් ප්‍රශ්න නැද්ද..? මං මේ ඔයාට කියන්න ආවෙ මල්ලි, පව් චතුමිණී... කෝ දැන් එයා ඔයාට දුන්නා කියන මාලේ..?"**

සෙනුකා ස්වරය වෙනස්කර කතා කළේ චතුමිණී ගැන දුක්වන ලෙසිනි.

**"මාලේ අයියා ළඟ. මං එයාට දුන්නා. චතුට කියන්න එපා..."**

සෙනුකා තේනුක තෙන්නකෝන් දෙස බලා සිටියේ ඔහු කී දෙය විශ්වාස නැති ලෙසිනි.

**"ඇත්තමද?"**

**"ඔව්... මට එයාගේ තෑගි එපා අක්කා. සමහරවිට සාමාන්‍ය දෙයක් දුන්නනම් තියෙයි. මොකටද එයා මට මේ ලක්ෂ ගාණක තෑග්ගක් දුන්නේ..?"**

**"ඒකවත් තේරෙන්නෙ නෑ. ආදරේට මිසක් වෙන මොනවටද..? අද ඔය නැන්දම්මයි මාමණ්ඩියි එන්න ඇත්තෙත් ඔයාගේ උපන්දිනේට මිසක් මං හින්ද නෙවේ.."**

**"මගෙ හිතේ එක්කෙනයි ඉන්නෙ... එතන්ට ආයෙ කාටවත් එන්න බෑ. අපරාදේ අද එයාව එක්ක එන්න චාන්ස් එකක් දුන්නා නම් ඔය ඔක්කොගේම කටවල් වැහෙනවා..."**

තේනුක තෙන්නකෝන් කීවේ කනස්සලු හඬිනි. සෙනුකා ඔහුගේ උරයට අත තැබුවාය.

**"කෝ පෙන්නන්න මට පින්තූරයක්වත් ඔයාගෙ හිත ඔය තරම් හොරකම් කරපු රෝසමල කවුද බලන්න..."**

තේනුක දුරකතනය අතට ගත්තේය. එහි ගැලරි වෙත ගිය තේනුකගේ ඇඟිලි අංජනාගේ පින්තූර එකින් එක ඈ නෙතු ඉදිරියට ගෙනාවේය. සෙනුකා පළවැනි පින්තූරයෙන්ම අංජනාගේ සුන්දරත්වය දෑසේ විතරක් නොව හිතේද රඳවා ගත්තාය. ඈ කතා නොකර ඔහු පෙන්වූ පින්තූර සියල්ල බැලුවාය. ඒ අතරේ දෙදෙනා මාතලේ යද්දී සුන්දර ස්ථානවල නැවතී ගත් දෙදෙනාගේ ඡායාරූපද විය. ඒවා හරිම ආදරණීයයි කියා ඇයට සිතුණි.

**"හරිම ලස්සනයි. ඔයාටම ගැළපෙනවා. හරි අහිංසක පෙනුමක් තියෙන්නේ..."** සෙනුකා කිව්වේ හදවතටම දැනුණු දේය.

සෙනුකාගේ දුරකතනය නාද වුණේය. ඇමතුම අප්පච්චිගෙනි. ඇය ඇමතුම ගත්තාය.

**"පොඩි පුතා ගියෙ නෑ නේද..?"**

**"නෑ අප්පච්චි මල්ලි. තවම ඉන්නවා."**

**"යන්න දෙන්න එපා. මං මේ ළඟ ඉන්නේ. එයාව දකින්න කෙනෙක් එනවා. එයාට ඒ වගක් කියන්න ඕනි නෑ..."**

**"හොඳයි අප්පච්චි..."**

සෙනුකා ඇමතුම අවසන් කළාය. තේනුකට ඒ කතාවේ අමුත්තක් දැනුණි.

**"අප්පච්චි මොකද කියන්නේ..?"**

**"ඔයාව තියාගන්නලු. යන්න දෙන්න එපාලු එයා එනකම්. ඔයාව දකින්න කවුද එනවා කියන්නේ..."**

සෙනුකා කීවේ වැඩිදුර නොහිතාය. ඒ ඇසුණු තේනුකට එක්වරම මතක් වූයේ පෙර දිනෙක අප්පච්චි පැමිණ කී යෝජනාවය. නොඅනුමානවම මේ එනවා ඇත්තේ ඒ කවුරුන් හෝ කියා ඔහුට හිත කීවේය. තේනුක ඉඳසිටි තැනින් නැගිට්ටේ සෙනුකා බලාපොරොත්තු නොවුණු ලෙසය.

**"අක්කේ මට ඔය හදන කෑම කන්න දෙන්න ඕනි නම් කා අතේ හරි කෑම පාර්සලයක් එවන්න ෂොප් එකට. මම යනවා..."**

සෙනුකා යමක් කියන්නටත් පෙර තේනුක සෙනෙහෙලතා මැණිකේ සොයා එතැනින් නික්මුණේ ඇයට කියා වහා එතැනින් පිටව යන්නටයි.

ලබන සතියට



**සීතා පොන්නම්පෙරුම**
ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා

පාඩම් අංක 74

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.**

# අතන මෙතැන කැක්කුම්වලට ගාන බාම් ගෙදරදී හදාගන්නේ මෙහෙමයි



කොන්දේ කැක්කුමක්, බෙල්ලේ උලුක්කුවක්, දණහියේ අමාරුවක් ආව හැටියේ කාට කාටත් මුලින්ම මතක් වෙන්නේ බාම් බෝතලේ. අපේ අත්තම්මා ඒ කාලේ උන්දැගේ අතේ නිතරෝම බාම් බෝතලයක් තියාගෙන උන්නා මට මතකයි.

බාම් කියාපුවම මතක්වෙච්ච් කතාවක් කියන්නම්. 1920 ගණන්වලදි ලංකාවෙ මනුස්සයෙක් ඉන්දියාවට ගිහිල්ලා මධුරාසිය පැත්තේ පුංචි කඩයක් දාගත්තලු. පස්සේ ඔය කඩේට ආපු ගියපු යෝගීවරු මේ මහත්තයට ආයුර්වේදය ඉගෙනගන්න ආරාධනාවක් කරලා. පස්සේ ඔහු යෝගීවරු යටතේ ආයුර්වේදය හදාරලා විතරක් නෙමේ මේ යෝගීවරුන්ගේ හොඳම ශිෂ්‍යයා බවටත් පත්වෙලා. ඉතින් ඒ සතුටට යෝගීවරු ඔහුට ඒ අයගේ රහස් ආලේප වට්ටෝරුවක් ලබාදීලා.

පස්සේ මේ මහත්තයා ලංකාවට ඇවිල්ලා ඔය රහස් බේත හදලා, ගාලා රෝගීන් සුව කරලා. ඒ වගේම ඔහු මේකට නම දාලා තියෙනවා 'සිද්ධාලේපේ' කියලා. ඔන්න ඔය කියපු මහත්තයගේ පුතා තමයි වික්ටර් හෙට්ටිගොඩ කියන්නේ.

වික්ටර් මහත්තයා කාලයක් වෙනත් ආයතනයක වෙළඳ සහායකයෙක් විදියට වැඩ කරලා තියෙනවා. පස්සේ තවත් රස්සා කරපු ඒ මහත්තයා ඒ සේරම අතෑරලා ගමට ගිහිල්ලා. රස්සාවක් කරනවට වඩා තමන්ගේ දෙයක් කරන එක හොඳයි කියලා හිතාපු වික්ටර් මහත්තයා ඔහු බිරිඳගේ මවගෙන් ඉල්ලගත්තු රුපියල් 2500කින් තාත්තාගෙන් ඉගෙනගත්තු සිද්ධාලේප බේත් කුප්පි හදන්න පටන් අරන්. ඔය කාලේ වික්ටර් මහත්තයට පුට් සයිකල් එකක්වත් තිබුණේ නැතිලු. ඉතින් හදපු බාම් කුප්පි ටික පෙට්ටියක දාගෙන කරේ තියාගෙන ගිහිල්ලයි විකුණලා තියෙන්නේ. පේමන්ට්වල පවා නිදාගෙන මහා කට්ටක් කාපු වික්ටර් මහත්තයා අන්තිමට නතර වුණේ ලංකාවම දන්න 'සිද්ධාලේප වෙදමහත්තයා' වෙලා. මේ වෙනකොට ලෝකේ රටවල් 40කට යන නිෂ්පාදනක් තමයි සිද්ධාලේපේ.

අපේ රටට සිද්ධාලේප වගේ ඉන්දියාවේ, චීනේ වගේ රටවල ප්‍රසිද්ධයි ටයිගර් බාම් එක. ඕක හදලා තියෙන්නේ බන් කින් යූ කියන චීන ජාතිකයා. ඔහු ඉතාම දුප්පත් පවුලක කොලු ගැටයෙක්. මේ කොලුවගේ මාමා ඖෂධ සාප්පුවක් කළාලු. මේ සාප්පුවේ වීදුරු පිහිදනවා වගේ වැඩ කරලා තියෙන්නේ බන් කින් යූ. මාමා නැති වෙලාවක ඖෂධ වාගයක් එකට දාලා කරපු පරීක්ෂණකින් තමයි ඔහු බාම් එක හදලා තියෙන්නේ. පස්සේ කාලෙක ඔහු වගේම ඔහුගේ ටයිගර් බාම් එකත් ලෝකය පුරා ප්‍රකට වුණා.

අපි අද කියලා දෙන්නෙත් කැක්කුම් ඔක්කොම නස්නය කරන බාම් එකක් හදලා විකුණන හැටි. ඔය වගේ බාම් වර්ග ගෙදර හදන්න පුළුවන්ද කියලා දැන් කෙනෙක්ට හිතෙන්න පුළුවන්. ඔව් ඇයි බැරි? ඔය ඉහළින් කිව්වා වගේ ගොඩක් උදවිය තමන්ගේ ව්‍යාපාර පටන් අරන් තියෙන්නේ ගෙදරදි පොඩිවට. පස්සේ උනන්දුව, කැපවීම නිසා ඒ මිනිස්සු සාර්ථක වෙලා. ඒ ව්‍යාපාර මහා පරිමාණ ව්‍යාපාර වෙලා. අද පුංචිවට හරි දෙයක් පටන්ගත්තොත් හෙට සාර්ථක වෙන්න පුළුවන් කියලා අපි නිතරෝම කියන්නේ ඒකයි.


**මුලින්ම අපි බාම් නිෂ්පාදනය ගැන ටිකක් හඳුනාගමු.**

බාම් (Balm) කියන්නේ අර්ධ ඝන (Semi Solid) මාධ්‍යයක්. මේක වාෂ්පශීලියි. ඒ වගේම සම මතුපිට දැවිල්ල ඇති කරවනවා. වේදනාවක් දැනෙන තැනකට බාම් ටිකක් ගාලා අතගාපුවහම වේදනාව යටපත් වෙලා දැවිල්ලක් ඇතිවෙනවා. ඒ වගේම සම උණුසුම් වෙනවා. පීඩනයක් යෙදෙන නිසා මාංශ පේෂි ලිහිල් වෙලා සහනයක් දැනෙනවා. ඒ වගේම ස්නායුවල ආතතිය දුරුවෙලා වේදනාව යටපත් වෙනවා.

හිසරදය, කොන්දේ කැක්කුම්, මස්පිඬු වේදනා, සම මතුපිට කැසීම්, දැවිල්ල, තැලීම්, සන්ධි වේදනා යටපත් කරගන්න බාම් පාවිච්චි කරන්න පුළුවන්. හැබැයි ඉතින් ශරීරයේ තියෙන දිගුකාලීන රෝගයකට බාම්වලින් ලැබෙන්නේ තාවකාලික සහනයක් විතරයි. බාම් කියන්නේ ඖෂධයක්. ඉතින් ස්වයං රැකියාවක් විදියට බාම් නිෂ්පාදනය කරනවා නම් රජයේ පිළිගත්තු ලියාපදිංචි වෛද්‍යවරයෙකුගෙන් සහතික කරවාගෙන දේශීය ආයුර්වේද අමාත්‍යාංශයේ අනුමැතිය ගන්න එක අනිවාර්යයයි.









**බාම් හදන්න මෙන්න මේ අමුද්‍රව්‍ය ටික අවශ්‍යයි.**

කැන්ඩ්ල් වැක්ස් (Candle Wax) 25g, පෙට්‍රෝලියම් ජෙල් (Petroleum Jelly) 250g, පැරෆීන් තෙල් (Paraffin Oil) 125ml, මෙන්තෝල් (Menthol) මේස හැඳි 2ක්, ඉන්ඩ්‍රස්ට්‍රියල් කැම්පර් (Industrial Campour) මේස හැඳි 2ක්, මෙතිල් සැලිසිලේට් (Methyk Salicylate) 50ml, බී වැක්ස් (Bee Wax) 5g, කැමති නම් විතරක් වර්ණකයක්. පිටකොටුවේ බංගසාල වීදියෙන් අඩු මුදලට මේ දේවල් ගන්න පුළුවන්.

කේතලය ලිපේ තියාගෙන පෙට්‍රෝලියම් ජෙල් එකතු කරන්න. පෙට්‍රෝලියම් දිය වුණාට පස්සේ කැන්ඩ්ල් වැක්ස් දාන්න. ඒකත් දිය වුණාම පැරෆීන් තෙල් දාලා හැන්දකින් මිශ්‍ර කරන්න. බී වැක්ස් එකතු කරලා කලවම් කරලා පස්සේ කැමති නම් වර්ණක දාගෙන ලිප ඕෆ් කරන්න. ලිප ඕෆ් කරලා ඉන්ඩස්ට්‍රියල් කැම්පර් දාලා මිශ්‍ර කරන්න. අන්තිමට සැලිසිලේට් දාලා කලවම් කරලා ලිපෙන් බාගන්න. (රසායනික ද්‍රව්‍ය නිසා නිෂ්පාදනය සෑදීමට පෙර අත්වැසුම් සහ මුඛ ආවරණ පළඳින්න)

මිශ්‍රණය ලිපෙන් බාලා සිසිල් වෙන්න කලින් ජීවානුහරණය කළ බෝතල්වලට දාන්න. පැය 1/2ක් විතර නිශ්චලව තියලා ලේබල් කරන්න. Bee Wax අඩු වැඩි කරලා උකු ගතිය වෙනස් කරන්න පුළුවන්. ටියුබ්වලට දානවා නම් මී ඉටි අඩුවෙන් දාන්න. බෝතල්වලට දානවා නම් වැඩිපුර දැම්මට කමක් නැහැ. හදාගනිපු බාම් 15g රුපියල් 150 වගේ ඉඳලා මිල කරන්න පුළුවන්. බාම් නිෂ්පාදනය ගැන වැඩිපුර විස්තරවලට 0714766819 අංකයට කතා කරන්න.



■ සෙව්වන්දි හෙට්ටිආරච්චි



ඔබ දෛවයට පිටුපායිද.. ?
දෛවය ඔබට පිටුපායිද.. ?

- ජීවිතයේ අතීත සහ වර්තමාන සිදුවීම් ඔබ විමතියට පත්වන අයුරින් පැවසුවහොත් ඔබට අනාගතයේ සිදුවන දෑ ගැන විශ්වාස නොකර සිටිය හැකිද ?
- වසර 45 කට වැඩි පර්යේෂණාත්මක අධ්‍යයනයන් සමග හස්ත රේඛා ශාස්ත්‍රයෙන් ඔබේ ජීවන ප්‍රශ්න විසඳා ගැනීමට හමුවන්න.

හස්ත රේඛා විශේෂඥ
එස්. කෝරළේගේ
520, වාසනා මාවත, කොට්ටාව, පන්නිපිටිය,
සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි
පෙ.ව 9.00 සිට ප.ව 5.00 දක්වා හමුවිය හැක.
0112 783172 / 0773 775094

ධරණි
ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 07.
දුරකථන 0115 200 900
බෙදාහැරීමේ අංශය 0112 127204
දැන්වීම් අංශය 0112672601, 0112672603, 0761393811
ෆැක්ස් 0112 673 451

ධරණි
පුවත්පත
නිවසටම
ගෙන්වාගන්න අමතන්න
076 1367 623

උගස් රත්තරන්
සින්නවීමට යන රන් භාණ්ඩ අප ආයතනය විසින් ඔබ උගස් කළ ආයතනය පැමිණ බේරා දී පොරොන්දු වූ මිලටම මිලදී ගනු ලැබේ.
දිවයින පුරා සේවාව,
බොරුවලට නොරැවටෙන්න
පවුම - 185,000/-
076 367 57 68


උකස් රත්‍රං
උකසින් බේරා
වැඩිම මිලකට මිලදී ගනිමි.
ඉතිරි මුදල් ඔබේ අතට.
දිවයින පුරා සේවාව.
077 891 53 22

දැන්වීම් සඳහා අමතන්න
0112672 601
0112 672 603

ලීසිං ඇති / නැති
ඕනෑම වාහනයක්
අත්පිට මුදලට මිලට
ගනු ලැබේ.
කාර්, වෑන්, ජීප්, බයික්.
077 - 3 797 481

උගස් තැබූ
රත්තරං
ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ
බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 22 සඳහා ඉහල මිලක්
076 101 88 53
SL PROMO

ඔබේ විදේශ ගමන කොතරම් ප්‍රමාදද? ව්‍යාපාර වලින් හෙම්බත්වෙලාද?
❖ සැමියා/දරුවා මත්ද්‍රව්‍යය, මත්කුඩුවලට ඇබ්බැහි වී දුක් විඳිනවාද?
❖ සැමියා/බිරිඳ අනියම් සබඳතා නිසා දුක් විඳිනවාද?
❖ 2023 - 2024 සියලු විභාග ජය ගැනීමට
❖ රැකියා ලබා ගැනීමට ❖ හැර ගිය අය ගෙන්වීම
පුරාණ විහාරය, වේරතැන්න, වේරපිටිය
අමතන්න: 071-0 314 878
මගේ විදේශ ගමන සාර්ථකවීම නිසා ඩුබායි හි සමන් කුමාර විසින් පළ කරන ලදී
උපන් දිනය / උපන් වේලාව සමග අමතන්න
ඔබ දුකෙන් තැවෙන ඕනෑම ගැටලුවකට විසඳුම්
පුරා දශක 4ක් දුකට පත් ජනතාව දුකින් මුදවා ගත්,
පූජ්‍ය වේරපිටියේ ඥානිස්සර
ගුරු හාමුදුරුවෝ
(කල නොහැකි වැඩ භාර ගන්නේ නැත)



මෙවර සාමාන්‍ය පෙළ / උසස් පෙළ / ශිෂ්‍යත්වය ඇතුළු සියලුම විභාගවලින්
විශිෂ්ට ජයග්‍රහණ ලබා ගැනීම සඳහා පැමිණ හමුවන්න. නැතහොත් ලිපියක් මගින් විමසන්න. (පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුයි.)

ප්‍රේම සබඳතා බිඳවැටෙන්නේ ඇයි?
ව්‍යාපාර/ගේ දොර පාළු වී යන්නේ ඇයි?
අයුතු සම්බන්ධතා නිසා පවුල් අවුල් වන්නේ ඇයි?
මෙන්න!
එයින් මිදෙන්න නිසි මඟක්...

අයුතු සම්බන්ධතා නැවතීම
* නිවාස ආරක්ෂා
* නඩුහබ දිනීමට
* දරුඵල ලබීමට
මත්කුඩු සහ සුරාව
* රැකියා ලබා ගැනීමට
* සියලු විභාග සඳහා
* නොවිකිනෙන ඉඩම් විකිණීමට
*විවාහ පමා අයට
*හැරගිය අය ගෙන්වීම
*අසාර්ථක ව්‍යාපාර දියුණුවට

මාතර වෙද හාමුදුරුවෝ
ඔබ කුමන හෝ මත්ද්‍රව්‍යයකට
ඇබ්බැහි වූ අයෙක් ද?
එසේ නම් ඉන් මිදීමට අමතන්න.
වරු තුනෙන් ප්‍රතිඵල පැමිණ හමුවන්න
අමතන්න 077 362 77 14

හමුවීම
බදාදා, සෙනසුරාදා
පෙ.ව. 8.00 සිට
ප.ව. 3.00 දක්වා

කුරුණෑගල, පොතුහැර
චන්ද්‍රසේල පිරිවෙන්
පුරාණ විහාරයේදී

ශාස්ත්‍රවේදී පණ්ඩිත මාතර වෙද හාමුදුරුවෝ
භාරකාරතුමා, ජනසෙත වෙද මැදුර, චන්ද්‍රසේල පිරිවෙන් විහාරය, කොළඹ පාර, පොතුහැර, කුරුණෑගල, පොතුහැර චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී

# කවි යාය

සංස්කරණය **ලිහිණි මධුෂිකා**

## මවකගේ මතකය

පෙර එක් කලෙක විඳි දුක් මට මතක් වෙලා
හදවත ගිනි ගනියි මතකය අලුත් වෙලා
එළියක් වුණේ දරු පස්දෙනෙකුද හදලා
ඉදිරිය ගැන හිතයි මව් ඒ දින තනි වීලා

ඇවිලෙන හදවතයි එද දින මතුවන්නේ
පස් දරු මවත් ඒ දවසෙහි තනි වන්නේ
පව් පින් අනුවමයි දස වද ගෙන දු න්නේ
දෝත වැඳගෙන සරණක් ඉල්ලන්නේ

ජීවන ගමන යන්නට අනෙ මගක් නැත
කුස ගින්දර නිවන්නට පිහිටක් ඇගේ නැත
තිස්තුන් කෝටියක් දෙවියෝ සිහිව ඇත
දරු සෙනෙහස නිසා මේ ටික කියනු ඇත

භවයෙන් භවය විඳි දුක් මතු කරලාලු
විඳි දුක් නිමා වී සහනය ලබලාලු
දරුවන් සමඟ මව් සතොසින් ඉන්නේලු
මුළු ලක්බිමම බුදු සමිඳුට භාරයිලු

**පද්මා ගලබඩගේ**
**ඉඹුලාන රුවන්වැල්ල**

## විරහවේ පද හතර

දෙඅතේ ගුලි කරන් දහසක් හීන ඉති
ඔබ සිටි රැයේ කැව්නා හදවතෙහි කිති
පරවුණ පෙමෙහි එකනෙක බිම වැටී පෙති
සසරේ පුරාවට මට දුන් පෙමට තුති

හැරගිය නමුදු හඬවා මුළු හිතම මගේ
මතුද හැඟෙයි නුඹහට මා නොමැති අගේ
ළඟ සිටි කල්හි රැකගන්නම් කුසුම වගේ
සිහිවී හඬයි පිහිනා නෙත් කඳුළු ගඟේ

ළාදළු ළපටි සිහිලැල් රැස් දහර යට
මුලකුරු කියාදුනි නුඹ මට ප්‍රේමයට
දෙතැනක හිඳන් විහිදන සෝ සුසුම් කැට
පාවී ඇදේ විරහව පද හතර කොට

**ඩී.නුවන්ති අමායා ලක්ෂාණි**
**කෑගල්ල (දීවල)**

## දෛවයක සරදම

දෛවයේ සරදමට කඳුළු දුන්නට
දරාගත්තට හිත හයියයි තාම
පරාජිත ලොව අන්ධකාරයි බොහෝවිට
සිතුණා මිරිඟු සයුරෙන් එතෙර වෙන්නට

සිතේ දරාගෙන සිටියද කලක සිට
අසිරි මල් ඉසින්නට බැරිවුණා මට
පිනිබිඳු රැඳුණ පිවිතුරු කුසුමක් විලස
ඇයිද මගෙ ජීවිතේ දුක් ගඟක් වුණේ

පහන් දෙරේ ගැලුවද හදවතේ
සැනසුම සතුට හිත තුළ ගෑවිලා නැති
තනිකම දැනෙනවිට කඳුළැලි එයි නෙතට
ඉරණම මේකනම් දුක්වී පලයක් නැත
මම තනිවෙලා අද හරියට පාළුයි මුළු හිතම

**එන්.එච්.කෝසලා ප්‍රියදර්ශනී**
**ගැටමාන්න බෙලිඅත්ත**



## ජීවිතයේ අරුත

හිමිදිරියේ අවදිව
බැලුවෙමි වටපිට
හැමදෙයක අලුත් බව
දැනුණි මගේ දෙනයනට

දවල් කාලය එළඹ
හිනැහුණේ වසන්තය
විකසිතව මගේ වත
හැඟුම්බර වුණෙමි දෙනයන

නොදැනුණි ගෙවෙන කල
හවස් වුණි හිරු බැසව
දැනුණි කය වෙහෙස බව
නිදිබරක් දැනුණි මගේ දෙනයනට

රාත්‍රිය උදවුණි පුරහඳ බැස ගොසිනි
මළානික වූ මා දෙනෙත
විඩාබර වී මිලින
දවසේ නිමාව දැනුණි මගේ හදවතට

**කේ.තරංගා නෙළුම් ගුණතිලක**
**මූණගහ හොරණ**



## කඳුළු ඇවිදින්


නිමේෂයකින් කඳුළු ඇවිදින්
මගේ නුවනඟ රූරා වැටුණා
සිහිව පොඩි පුතු සහ සියලු දෙන
මගේ හිත හොර රහසෙ ඇඬුවා

සියලුදෙන හැර දුරු රටක ආ
මහද ඉකිබිඳ නිබඳ හඬනා
හඬ අසන්නට හිමි සඳුනි ඔබ
අද දිනේ මා අසල නොවෙනා

නෙතඟ කඳුලැළි දිලිහී දිලිහී
පුංචි පුතු මා වෙතින් සමුගෙන
පියතුමන් හා වෙන්ව ගිය හැටි
මගේ මනසේ නිතර ඇඳුනා

මගේ දිවියේ සතුට සැමද
සිව්දෙනා ළඟ නිබඳ රැඳුණා
උපදිනා මතු මතුන් ඔබ
සිව්දෙනා මාගේ සතුට වේවා

**ඩී.එම්.ප්‍රියන්තා කුමාරි**
**ගල්කඩවලල. ඇහැටුවැව**



## ආදරෙයි මං ආදරෙයි

සිත දකින නෙත් යුග
සෙනෙහස පිරි ඇගෙ සිනහව
වශී කරන සිත ඇගෙ මුදු වදන
සොරාගෙනලු සොයුර නුඹ
මටත් පෙරාතුව

කඩිසර ඇගෙ ගමන බිමන
නිල්වන් ඇගෙ දිගු වරලස
හැම වැඩටම සමතෙකි ඇය
නිවසට සිරිකත කැන්දන
රෝස කැකුළ ඇයයි මගේ

හැම භවයක නුඹ ඇය පතාවි
මගෙ සොයුරිය ඇය වේවා
සෙනෙහෙ සිතින් දිවි ගෙවන්න
මගෙ ආසරි පිළිගනු මැන

අනේ මගේ.... මලේ
රැකගනින් මේ සුදු කෙල්ල මගේ
මතු භවයක ඇය මගේ නැගණියයි
පිංකාරයි සොයුර නුඹ නම්

**කාන්ති**
**කුරුණෑගල**

## බදාගෙන ඇත දෝතින්ම

විඳිමින් දුක් ගැහැටම
කවියකට අමුණ දිවියම
කඳුළු හංගනා නෙත්
සිනාසෙනවා හැමදම

රසය විඳ විඳ සිටින අය අවට
සරදමට සිනාසෙනවා රහසින
දැන දැනම උරුම දුකම බව
බදාගෙන ඇත සැම දෝතින්ම

**ටී.නිපුනි සමෝද්‍යා වත්තේගම**
**බෙලිඅත්ත**

## ජීවිතයට ඉඩ දෙන්න

මිනිසත්කමේ අපූරු දයාදය
ජීවිතයයි
හැල හැප්පීම්වලට නිරතුරුවට ලක්වෙන
බිඳවැටීම්වලින් ජය ලබන
ඇතැම්විට මියගොසින්
යළිඳු ජීවන ලබන
අපූර්වතම අත්දැකීම ජීවිතයයි
ඉතින් ඇයි අපි ඒ ලස්සන
අපූරු දයාදය හැර යන්නේ
අපි අපේ දයාදයට ඉඩදෙමු
ජීවිතයට ඉඩ දෙන්න

**ඕෂධී තුෂාරා**
**ගොතටුව**

## කවි යාය

**ඔබේ කවි නිර්මාණ**
**පහත ලිපිනයට එවන්න.**

''කවි යාය'' 'ධරණී' කර්තෘ මණ්ඩලය,
අංක 91,විජේරාම මාවත,කොළඹ 07 නැතිනම්
dharanee.editor@liberty.lk
ලිපිනයට ඊමේල් කරන්න

# SLT-MOBITEL **BizLife**

## ඔබේ ව්‍යාපාරයට හඳුන්වාදෙන වාසිදායකම පැකේජය




## බජට් එකට හරියටම හරියන
## **දැවැන්තම විසඳුම් පැකේජය**

ජාතික තොරතුරු සහ සන්නිවේදන සැපයුම්කරු, SLT-MOBITEL හඳුන්වාදෙන BizLife - ඔබේ ආර්ථිකයට වඩාත්ම වාසිදායක, වඩාත්ම වටින, ව්‍යාපාරයේ සෑම අංශයකටම සාර්ථකම විසඳුම් සැපයීමට සමත් වෙළඳපොළේ එකම විසඳුම් පැකේජය වන අතර සියලුම ව්‍යාපාරික අභියෝග ජයගැනීමට ඔබට අත්වැලක් වේ.

- Unlimited Voice
- Data
- Cloud Storage
- Internet Security
- Video Conferencing
- Business Email
- Shared Web Hosting
- Static IP Address
- Unlimited WhatsApp and Messenger Data

070 500 4000 www.slt.lk/business
0112 389 389 bizsolutions@slt.com.lk www.bizleads.slt.lk

SLTMOBITEL ENTERPRISE

කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.